ශ්‍රීසුමඞ්ගලශබ්දකෝෂය

(සිංහල-සිංහලාර්ථ)

ප්‍රථමභාගය

(අ-න්‍යූ)

වැලිවිටියේ

පණ්ඩිත යොරත සවාමීන්ද්‍රයන් වහන්සේ

විසින්

සම්පාදිතයි.

ලඞ්කාණ්ඩුවේ

අධ්‍යාපනාමාත්‍යාංශයේ උපකාරය ද ඇතිව

ගල්කිස්සේ

වෛද්‍යකලානිධි පෙමසිරි අභයචක්‍රම (D. I. M. S.) මහතා

විසින්

කොළඹ මාලිගාකන්දේ මහාබොධියන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවන ලදී.

ශ්‍රී බු. ව. 2496

SRI SUMANGALA
SABDAKOSAYA

A Sinhalese - Sinhalese DICTIONARY

Part 1.
('a' to 'nyū')

By

Ven. Pandit W. Sorata Thera,
Vice Principal, Vidyodaya Pirivena,
COLOMBO.

Published by P. ABHAYAWICKRAMA D. I. M. S. Ayurvedic Physician- Mt. Lavinia, under the patronage and with the aid of the Government of Ceylon

Printed at the Maha Bodhi Press,
COLOMBO.

1952

සංජ්ඥපනය

සිංහලයන්ගේ භාෂාව වනාහි සිඛ්ඛ්අාර්‍ය්‍යභාෂාගණයට අයත් වූවකි. මහාවංශයෙහි සඳහන් පරිදි සිංහලයෝ සම්බුද්ධපරිනිර්වාණදිනයෙහි උතුරුදඹදිවින් ලක්දිවට පැමිණි අාර්‍ය්‍යවර්‍ගයාගෙන් පැවැතෙන්නෝ වෙති. සිංහලයන් බුද්ධභක්තියන් වීමට පෙර ඔවුන්ගේ භාෂාවෙහි ආදිමඅවස්ථාව පිළිබඳ තත්ත්‍වය දැනගැනීමට ඉවහල් වන ලිපියක් මේ තාක් හමු නොවී ය. දැනට සොයා ගෙණ තිබෙන ඉතාමත් පැරණි, ලියූ කාලය නිශ්චය කට හැකි, ලිපිය වනාහි ශ්‍රීබුද්ධවර්ෂ 277 දී ලක්රජයට පත් එතනිශනිරිදුගේ කාලයට අයත් කුඩා ගල්ලෙන්ලිපියකි. ඉන් පසු ක්‍රිස්තුවර්ෂාරම්භයට පෙර ලඞ්කාරාජ්‍යශ්‍රියට පැමිණි දුටුගැමුණු ආදි නරවරයන්ගේ කාලයන්හි කරවූ කුඩා සෙල්ලිපි කිපයක් ද අපට ඇත්තේ ය. මේ බ්‍රාහ්මීශිලාලෙඛනයන්හි පෙණෙන භාෂාවට බෙහෙවින් සමාන ප්‍රාකෘතභාෂාවක් සිංහල ජාතියේ ආදිපුරුෂයන් කථා කළ බව සිතිම නිවැරදි ය.

දඹදිව නොයෙක් පෙදෙස්වලින් ජනසමූහයා වරින් වර මෙහි පැමිණ සිංහලජාතියට මිශ්‍ර වීම හා ශ්‍රීබුද්ධවර්ෂ 237 දී ලක්රජයට පත් දේවනම්පියතිස්රජුගේ කාලයෙහි සිංහලජාතිය බෞද්ධ වීමත් සිංහලභාෂාවෙහි ආදිම අභිවෘද්ධියට බෙහෙවින් ඉවහල් වූ කරුණු ය*. දඹදිව නොයෙක් පෙදෙස්හි පැවැති නොයෙක් ප්‍රාකෘතභාෂාවන්ට ම විශෙෂ වූ ඇතැම් ලක්ෂණ මේ එක ම සිංහලභාෂාවෙහි සඞ්කීර්ණ ව පවත්නේ එ හෙයිනි. ඒ සඞ්කීර්ණත්වය සිංහලජාතියේ ප්‍රභවය හා ආදිම දිගුණුවත් පිළිබඳ ව පරීක්ෂා කරන්නන් බොහෝවිට වැරදි නිගමනයන්ට බස්වයි.

සිංහලභාෂාවෙහි පරිණාමය වනාහි ක්‍රමක්‍රමයෙන් සෙමෙන් වූවකි. එය තේරුම් ගත හැක්කේ ඒ ඒ කාලපරිච්ඡෙදයන්ට අයත් ලෙඛනයන් සංවර්ධන ව පරීක්ෂා කර බැලීමෙනි. අතීතයට අයත් ලිපි අතුරෙන් ශිලාලෙඛන හා සිගිරිපද්‍ය ද ලියූදු පටන් වෙනසකට නොපැමිණ පවත්නා හෙයින් ඉතාමත් අගනේ වෙයි. එහින් ශිලාලෙඛන රාශියක් ඉතාප්‍රශෙෂ්ඨ වන් විවරණ සහිත කොට **ලඞ්කාශිලාලෙඛනසඞ්ග්‍රහයෙන්** ප්‍රකාශිත ය. ආචාර්‍ය්‍ය **සෙනරත් පරණවිතාන** මහතා විසින් සොයාගත් සිගිරිපද්‍ය එතුමා විසින් ලියූ විස්තරවිවරණ සහිත කොට දැන් මුද්‍රණය කරණු ලැබේ. නොබෝ කලකින් එය ප්‍රකාශයට පැමිණිය හැකි ය. සිංහලභාෂාපරිණාමයෙහි විලම්බිය පෙණෙන්නේ ශිලාලෙඛනයක් එහින් අවුරුදු දෙතුන් සියයකට පසු ව කරවූ ශිලාලෙඛනයක් හා සසඳ බලනවිට ය.

සිංහලයන්ගේ අතීතය දීඝ වූ ද නොයෙක් විපර්‍ය්‍යාසයන්ට භාජන වූ ද ඉතිහාසය සිංහල භාෂාවට ද සාධාරණ ය. එබඳු ඉතිහාසයක් ඇති භාෂාවක නොයෙක් විපර්‍ය්‍යාසයන්ට භාජන වූ වචන රාශියක් ඇති විය යුතු ම ය. ව්‍යවහාරයෙන් පහ වූ, ලෙඛනයන්හි ම රඳුනා වූ, දුර්බෝධවචන දහස්ගණනක් සිංහලභාෂාවෙහි ඇත්තේ එහෙයිනි.

ඒ වචනයන්ගේ අර්ථ දැන ගැනීමට සුදුසු ශබ්දකෝෂයක් නැති වීම ඉතා මහත් පාඩුවකි. පාලිභාෂාවට අභිධානප්පදීපිකාව වැනි කොෂග්‍රන්ථ සම්පාදනය කළ පුරාණ ලක්වැසියන් විසින් සිංහභාෂාවට කොෂග්‍රන්ථ සම්පාදනය නොකරණු ලැදී කිය නොහැකි ය. එහෙත් ජයබාහුපුර රාජධානිකාලයෙන් පෙර සම්පාදිත සිංහලකොෂග්‍රන්ථයක් දැන් දක්නට නැත්තේ ය. පුරාතනයන් විසින් සම්පාදිත එබඳු ශබ්දකොෂ අනික් පුරාතන සාහිත්‍යකෘතීන් මෙන් කාලිඛහමාෂ පළමුවන රාජසිංහ ආදි දුෂ්ට රජුන් විසින් විනාශ කරණලදැයි සිතිය හැකි ය.

---

* මේ දිවයිනොහි මුල්වැසියන් වූ යක්ෂ නාගවර්‍ගියන්ගේ භාෂාවන් හා ගැටීම ද අමතක කළ යුතු නොවේ.

ජයවර්ධනපුර (කෝට්ටේ) රාජධානිකාලයෙහි සම්පාදිත **පියුම්මල, රූවන්මල, පුරාණ නාමාවලිය** යන නිඝණ්ඩු (කොෂග්‍රන්ථ) තුනක් ඇතත් පුරාණවචනයන්ගේ අර්ථාවබෝධයට එයින් ලැබෙන වගල ඉතා සුළුය. එහි ඇතුළත් වචනමාලාව ද විශාල නොවේ. එහි ඇත්තේ පදුකාව්‍යකර්තෘන්හි බෙහෙවින් යෙදුනු වචනපඬිකාතියක් හා ඒ නිඝණ්ඩුකර්තෘන් විසින් ම පාලිසංස්කෘතභාෂාවන්ගෙන් (ඔවුන් දුන සිටි ශබ්දභෙදක්‍රම අනුව) බිඳ ගත් වචන සුළුප යක් ද පමණකි. මේ නිඝණ්ඩු තුන ම කාව්‍යකාරයන්ගේ අත්පොත් වැනි ය.

මෑත දී සම්පාදිත **එලුඅක්කාරාදියෙහි** හා **ශුද්ධසිංහලඅක්කාරාදියෙහි** ද බෙහෙවින් යෙදුනේ ඒ පැරණි නිඝණ්ඩුවල එන වචන පිණිස ම ය. **වේරගම පුඤ්ඤාභරණාකර** පඬිතුමා විසින් සම්පාදිත **ශබ්දමුක්තාවලි** නම් කුඩා කොෂග්‍රන්ථයෙන් ද පැරණිවචනයන්ට එතරම් අංලෝකයක් නොලැබේ. **බෝරුගොමුවේ ශ්‍රී රේවත** (නායක) ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් සම්පාදිත **සිංහලමහාඅක්කාරාදිය** ඒ පැරණි කොෂයන්ට වඩා දියුණු නමුත් පුරාණවචන තේරුම් ගැනීමට මහත් පිටිවහලක් නොවේ.

කල්ෆ්, කාර්පර් යන දේවගැතිවරයන් විසින් සම්පාදිත සිංහලඉංග්‍රීසිශබ්දකොෂ යන්හි ද පුරාණ ග්‍රන්ථයන්හි එන දුර්බෝධවචන අධික නොවන නමුත් මේ තාක් සිංහලව්‍යවහාර යට නොපැමිණි සංස්කෘතවචන ඉතා මහත්සඛ්‍යාවක් නම් පෙණේ. ඒ දේවගැතිවරයන් ඒ ශබ්දකොෂ සම්පාදනයෙහි දී ගොදුරුකැයි කියනු ලබන එක්තරා ක්‍රමයක් නිසා ඒ සා මහත් සංස්කෘතවචනරාශියක් ඒ ශබ්දකොෂයන්ට වැදුනුබව කිය හැකි ය. ඔහු ඉංග්‍රීසි ශබ්දකොෂයන්ගෙන් වචන ගෙණ ඊට පර්‍යායෙ වන සිංහලවචන සොයන්ට ඔවුන්ගේ කතිසේරුවන් (=දෙවසථාන සම්බන්ධ සිංහලපාඨශාලාව්‍යාඛ්‍යාවරයන්) යෙදූහ. ඒ පාඨශාලාව්‍යාඛ්‍යා වරයන් සිංහලවචන සෙවීමට ඉංග්‍රීසි– සංස්කෘත ශබ්දකොෂ පෙරළා බැලූ බවත්, එහෙයින් ම සිංහලයෙහි මේ තාක් නැති සංස්කෘතවචන රාශියක් ඒ සිංහලශබ්දකොෂයන්හි නවාතැන් ගත් බවත් කියනු ලැබේ. මේ උපක්‍රමය මෙකල්හි ද ඇතැම් සිංහලශබ්දකොෂකාරයන් අනුගමනය කරණ බව කිය හැකි ය. අභාග්‍යයකි!

මෙකල්හි සිංහලභාෂාව ඉගෙණීමට විශෙෂ වූ උනන්දුවක් බොහෝදෙන දක්වති. එහෙයින් පැරණි පොත්හි ඇතුළත් දුර්බෝධවචනයන්ගේ අර්ථ ආදිය ක්‍රමානුකූල ව පරීක්ෂා කොට සම්පාදනය කළ ශබ්දකොෂයක් මෙකල්හි අත්‍යාවශ්‍යක ය. එබඳු ශබ්දකොෂයක ආවශ්‍යකත්වය අපට දැනුනේ අපගේ ශිෂ්‍යජීවිතයේ දී ම ය. එකෙත් එය මේ තාක් ඉටු නොවී ය.

පැරණි සිංහල පොත් කියවන ප්‍රවීණයන්ට පවා අපහසු වන්නේ ඒ පොත්හි නිබෙන පාලිසංස්කෘතනත්සමශබ්දයන්ට වඩා පැරණි සිංහලවචනයන්ගේ හා ද්‍රවිඩභාෂාවෙන් ආ වචනයන්ගේත් අර්ථ තේරුම් ගැනීම ය. ඒ නිසා ම පුරාණසිංහලග්‍රන්ථයන් සංස්කරණය කළා වූ ද ඊට ව්‍යාඛ්‍යාදිය ලියූ ද ශ්‍රෙෂ්ඨ උගතුන් පවා පැකුලුනු තැන් දුලීභ නොවේ.

භාෂාවෙහි ඇති දුර්බෝධ වූ සිංහලවචනයන් ගෙණ අර්ථවිවරණය කිරීම ම ප්‍රධාන කාරණය වුව ද, සිංහලශබ්දකොෂකර්තෘන් එය තේරුම් ගත් බවක් නොපෙණේ. මෑත දී වූ සිංහලශබ්දකොෂසම්පාදකයෝ තමන් කැමැති තාක් වචන පැරණි ශබ්දකොෂයන්ගෙන් ගෙණ ඒ පැරණි ශබ්දකොෂවල දක්වූ අර්ථ ම කිසි පරීක්ෂාවක් නොකොට දක්වූහ. ඔවුන්ගේ රිසිය පරිදි පොත මහත් කිරීම සඳහා සංස්කෘතශබ්දකොෂයන්ගෙන් වචන ගැණීමට ද පසුබට නොවූ නමුත් ඒ සංස්කෘතවචන සිංහලකානියක යෙදී තිබේ දැ යි සොයන්ට උපසාහයක් නොදැරූහ. මේ ක්‍රමයට අනුන්ගේ ශබ්දකොෂයන්ගෙන් වචනාදිය පැහැර ගෙණ ශබ්දකොෂයක් සම්පාදනය කිරීම එතරම් අපහසු කාර්‍යයක් නොවේ. **ප්‍රශෙෂ්ඨන** වත් **ශබ්දකොෂයක්** සම්පාදනය කිරීමට නම් භාෂාවට අයත් කෘතීන්ගෙන් වචන ගෙණ අනුක්‍රමණිකා කර ගත යුතු ය. ඉන් පසු ඒ වචන යෙදී තිබෙන පාඨයන් නිසි සේ පරීක්ෂා

කොට අතීව විවරණය කළ යුතු ය. එබදු කාර්යයක් ප්‍රතිඵල සහිත සේ අවසන් කිරීම සඳහා ඉතා වෙහෙසක් දැරිය යුතු ය. ඒ දුෂ්කරකාර්යය නිසි සේ නිමවීමට තනි පුද්ගල යෙකුගේ ශක්තිය කිසිසේත් ප්‍රමාණවත් නොවේ.

කරුණු මෙසේ වන හෙයින්, 1927 මාර්තු මාසයේ දී **රාජකීය ආසියාතික සමිතියේ ලඞ්කාශාඛාව** විසින් ලඞ්කාංශුවේ විශදමින් **ඩී. බී. ජයතිලක** මැතිඳුන්ගේ ප්‍රධානකර්තෘත්වය ඇති ව සිංහලශබ්දකෝෂයක් සම්පාදනය සඳහා කටයුතු අරඹන ලදී.* එය සිංහලපොත් කියවන කාගේත් අභිලාෂය ඉටු කියන්ට නොවේ දනිමු. –ඒ ආරම්භයෙහි ප්‍රතිඵලය නම් සුදෙසිය වූ හා විදෙසිය වූ ද ලකුණු තුළ වූ උසස් අපේක්ෂාවන්ට ගැළපෙන්නක් නොවීය. අවුරුදු හතක මහන්සියෙන් පසු 1935 දී 'අක්‍රම' යන වචනයෙන් අවසන් වූ **ඉංග්‍රිසි–සිංහල ශබ්දකෝෂයෙහි** ප්‍රථමභාගය ද, 1942 දී 'අනුප්‍රඥප්ති' යන්නෙන් අවසන් වූ හවැනි භාගය ද ප්‍රකාශයට පැමිණියේ ය. මේ කාර්‍යබහුලයෙහි ම පිටු ගණන දෙසිය හැටහයකට වැඩි නොවීය. **සිංහලඡන්දඃශාස්ත්‍රය සිංහලශබ්දකෝෂයක්** ම මේ සිංහලවිෂයට අත්‍යාවශ්‍යක නමුත් එය පුස්තකාලයට වඩා බෙහෙවින් පමාවීය. ඒ 'සිංහලශබ්දකෝෂ'යෙහි "අක්නොල්"යන වචනයෙන් අවසන් වූ ප්‍රථමභාගය 1937 අප්‍රේල් මාසයේ දී ද 'අඹුබෑඩි' යන්නෙන් අවසන් වූ පඤ්චමභාගය 1941 දී ද ප්‍රකාශයට පැමිණියේ ය. ඒ කොටස් පහේ ම ඇත්තේ පිටු 232 කි.

සිංහලශබ්දකෝෂ **සම්පාදන කාර්යය** 1941 දී **ලඞ්කාවිශ්වවිද්‍යාලය** විසින් භාර ගැණීමෙන් මේ අත්‍යාවශ්‍යක මහාකෘතිය නොපමාව නිමාවට පැමිණෙයි යන විශ්වාසයින්ගේ අපේක්ෂාව නවත් වරක් අවුත් වීය. ලක්වැසියෝ අපගේ විශ්වවිද්‍යාලය කෙරෙහි විශ්වාසය තබා අවුරුදු අවක් ඉවසිල්ලෙන් බලාපොරොත්තුව සිටියහ. එහෙත් **ශ්‍රීමත් ඩී. බී. ජයතිලක** මැතිඳුන් විසින් පිළියෙල කළ සැලැස්ම අනුව සම්පාදිත ශබ්දකෝෂයක් ප්‍රකාශයට නොපැමිණියේ ය. ඒ වෙනුවට අපේ මහාචිද්‍යාපීඨයෙන් බිහි වූයේ **සඞ්ක්ෂිප්ත සිංහල– ඉඞ්ග්‍රිසිශබ්දකෝෂ** (A Shorter Sinhalese English Dictionary) යක ප්‍රථමභාගය යි. බුද්ධිමත් ගුණදෝෂවිවෙචකයන් මේ කෘතිය පිළිගත් පරිදි හා එයින් ඊට පැමිණි දුර්භාග්‍යඅවස්ථාවත්, **ජයතිලක මැතිඳුන්ගේ** සැලැස්මට නැවත ද පෙරළුනු අයුරුත් මහාජනයාට නවමත් මතක නිබෙන කරුණු ය. එහෙයින් සිංහලශබ්දකෝෂසම්පාදනය පිළිබඳ ඉතිහාසයෙහි ඒ පරිවේදය විස්තර කිරීමට අපි නොවෙහෙසෙමු. අවුරුදු අවක් මුළුල්ලෙහි ඒ සඳහා විශදම් කළ මහඩම්බාකාර්යයට ලැබුනු ප්‍රතිඵලය අනියසින් ම අල්ප ය යනු පමණක් මෙහි දී අපි කියමු.

1927 දී ආරබ්ධ මේ '**සිංහලශබ්දකෝෂ**'යෙහි විලම්බයට හෙතු වශයෙන් නොයෙක් කරුණු ඊට සම්බන්ධ අය කියා පෑහි†. ඒ කරුණුවලින් එකක් දෙකක් අපි පරිහාරකර බලමු.

---

* මෙවැනි සාහිත්‍යකෘතියක් අර්ථකථාවාර්‍ය බුද්ධඝෝෂ තෙරුන් වහන්සේගේ කාලයෙන් පසු ලක්දිව නොඇරඹූ බව කියාමින් ඒ කාලයෙහි සම්හරු මහත් ඥෝෂා කළහ. සිංහලශබ්දකෝෂසම්පාදකයන් සවකීය කාර්‍යය අවසන් කිරීමට රුචියක් නොදැක්වීමේ හෙතුව සම්හරවිට මේ කියමනෙන් තේරුම් ගත හැකි ය. බුදුගොස්තෙරණුවන්ගේ අවුවා ලියුම අවසන්හි මහපොළොව කම්පා වූ බව සම්හර පොත්හි සඳහන් වේ. තමන්ගේ කෘතිය අවසානයෙහි දී ද මහපොළොව කම්පා වෙනැයි සිතා ලෝවැසියන් කෙරෙහි අනුකම්පාවෙන් මේ ශබ්දකෝෂ සම්පාදකයන් සවකීයකෘතිය කෙළවර නොකරනැයි සිතමු. අපේ ජීවිතකාලය තුළ දී මහාභූමිකම්පාවකින් විය හැකි තිරිහැරයෙන් අප මිදවීම ගැණ මේ ශබ්දකෝෂසම්පාදකයන්ට අපි කෘතඥ වෙමු. එහෙත් ඒ භවතුන් ඊට වෙනස් වූ කම්පාසඤ්ඤාවන්ට අප (=ලක්වැසියන්) භාජන කළ බව කිය යුතු ය.

† සම්හරවිට මේ සිංහලශබ්දකෝෂසම්පාදකයන් නිතොපදෙශයෙහි සඳහන් මියන්ගෙන් පිබිලැබූ 'මහා වික්‍රම' නම් සිංහයාගේ හා ඉඤ්ඡු විසින් පවරණු ලැබූ මෙහෙය ඉක්මනින් හා හොඳිනුත් ඉටු කළ පසු අනාථ වූ 'දඨිසාණී' නම් බළලාගේත් කථාවෙහි පෙණෙන

"නිරපෙක්ඛා න කාතව්‍යා භෘත්‍යෛඃ සවාමි කදාචන,
නිරපෙක්ඛං ප්‍රභුං කෘත්වා භෘත්‍යාඃ සාදඨිසාණීවත්"

යන නීතිය අනුව ක්‍රියා කිරීම ශබ්දකෝෂයේ පමාවට හෙතුව ය යි සම්හරු සිතති. 'නිත්‍යානුකූල' ව ක්‍රියා කරන්නන්ට දෙෂාරොපණය කිරීම නුසුදුසු ය. වැරැද්ද සවාම්පක්ෂය කෙරෙහි ම ය.

ශබ්දයන්ගේ ප්‍රභවය (etymology) පෙවිම භාෂාවිද්‍යාත්මකයට හෙතුවකැයි කියනු ලැබේ. භාෂාවෙහි නිබෙන සියලු වචනවල ප්‍රභවය ඒ ශබ්දකෝෂයෙහි දක්වන බව මෙතෙක් ප්‍රකාශයට පැමිණි කොටස්වලින් නම් නොපෙණේ. පහසුවෙන් දක්විය හැකි ප්‍රභව ඇති ශබ්දයන්ගේ ප්‍රභව පමණක් එහි දක්වන ලද්දේ ය. ඒ දක්වූ ප්‍රභව ද හැම විට ම නිවැරදි යයි ද කිය නොහැකි ය.

තවත් හෙතුවක් ලෙස දක්වන්නේ සමහර වචනයන්ගේ අර්ථ විනිශ්චය සඳහා නොයෙක් පරීක්ෂණ කරන්ට සිදු වන බව ය. මේ තෙක් ප්‍රකාශයට පැමිණි භාෂායන්ගෙන් නම් ඒ බව ප්‍රකට නොවේ. මෙහි මතු දක්වනු ලබන කරුණු සාධාරණයෙන් වුව ද එය ස්ථිර වනු නිසැක ය.

ඉංග්‍රීසිභාෂාවට කරණලද **ඔක්ස්ෆෝඩ්මහාශබ්දකෝෂය** සම්පාදනය සඳහා ඉතා දීර්ඝකාලයක් ගත වූ බව කීම ද නවත් හෙතුවකි! සිංහලශබ්දකෝෂසම්පාදකමණ්ඩලය ස්ථිරකායීය නිම කරන්නට සිංහලභාෂාව හැදෑරූ වැඩි අවසන් වන තෙක් (හෙවත් මළබසක් වන තෙක්) බලා සිටිනැයි ද කිය හැකි තරම් ය.

සිංහලශබ්දකෝෂසම්පාදනය පිළිබඳ තත්ත්වය යට කී ලෙසින් පවත්නා අතර ම, ඉතා මහත් නුවූ, විශ්වාස කට හැකි, සිංහලශබ්දකෝෂයක අත්‍යාවශ්‍යකත්වය දිනෙන් දින ම අධික අධික ව දැනෙන්ට වී ය. මහාවාශ්‍රී **ගුණපාල මලලසේකර** මහතා එබදු සිංහල ශබ්දකෝෂයක් සම්පාදනය සඳහා අවශ්‍ය උපකරණ රැස් කරණ බව 1934 දී අප සමග කී ය. තවත් කෙනෙකුන් එ ම කාර්‍යයෙහි යෙදීම නිෂ්ප්‍රයෝජනය යි සැලකූ හෙයින් තවත් ශබ්දකෝෂයක් සෑදීමට අපගේ සිත ඒ අවස්ථාවෙහි නොනැමුනේ ය. විශ්වාස කට හැකි සිංහලශබ්දකෝෂයක අත්‍යාවශ්‍යකත්වය බලවත් ලෙස අපට වැටහෙන්ට වූයේ 1946 දී **සාවසිඑමිණ** සකස් කළ අවස්ථාවේ දී ය. **මහාවාශ්‍රී මලලසේකර මහතාගේ** සිංහල-ඉංග්‍රීසි ශබ්දකෝෂයෙන් කොටසක් වත් ඒනාක් ප්‍රකාශයට නොපැමිණි හෙයින් සිංහලශබ්දකෝෂයක් සම්පාදනය කරන්ට ඉවාංගත් අපි 1946 වර්ෂයේ මධ්‍යභාගයේ දී ඒ සඳහා කටයුතු ආරම්භ කෙළෙමු. ඒ කාර්‍යය අප මුල දී බලාපොරොත්තු වූ කාලයට ද වඩා ඉක්මනින් නිමාවට පැමිණියේ ය. පුරාතන සිංහලග්‍රන්ථ මහත් රාශියක වචනානුක්‍රමණිකා 1948 දී මහාවාශ්‍රී මලලසේකරමහතාට පරිත්‍යාග කරන්ට හැකි වීම අපගේ මහත් ප්‍රීතියට කාරණයකි. පැරණි ග්‍රන්ථයන්ගෙන් වචන රැස් කර ගැණීම සඳහා අපට උපකාරී වූ ගිහි පැවිදි භවතුන්ට අපගේ කෘතඥතාපූර්වකඝනුතිය මෙහින් පිරිනමමු. ඒ භවතුන්ගේ සම්පූර්ණ නාමලේඛනය මෙහි අග පිටුවල සඳහන් වෙයි. වචනානුක්‍රමණිකා සම්පාදනය 1947 වැන් නෙහි අග දී සම්පූර්ණ කරගත හැකි වූ නමුත් අපට වැලඳුනු රෝගාබාධ නිසා සෙසු කටයුතු 1949 මැයි මස 16 වන දින වන තෙක් ආරම්භ කළ නොහැකි වී ය. දැන් මහාප්‍රස්තාවය අනට පත් කරණු ලබන මේ ශබ්දකෝෂප්‍රථමභාගය 1951 මැයි මාසේ දී ලිඛිත අවසන් කළ හැකි වීමු. මෙය දැන් තරමක් දුරට සම්පූර්ණශබ්දකෝෂයක තත්ත්වයට පැමිණි බව කිය හැකි ය. 1953 වන අවුරුද්ද අවසන් වන්ට මත්තෙන් මේ ශබ්දකෝෂයෙහි ඉතිරි කොටස ද අවසන් කළ හැකි වෙතැයි සිතමු.

මේ ශබ්දකෝෂය සම්පාදනය කළ යුතු පිළිවෙල තීරණය කරගන්ට මත්තෙන් අප බොහෝදුරට සිතූ ප්‍රශ්නයක් නම් මෙහි වචනයන්ගේ ප්‍රභව දැක්විය යුතු ද? නැත් ද? යන්නයි. සෙසු අනික් භාෂාවන්හි මෙන් ම සිංහලයෙහි ද සැකෙවින් ප්‍රභවය නොදැක්විය හැකි වචන ඉතා බොහෝ ය. භාෂාවෙහි ඇති තෙක් වචනයන්ගෙන් බහුතරයෙන් පංගුවක පමණ ප්‍රභවය දැක්වීමේ දී තරමක් දුරට වත් විස්තර ලියන්ට සිදු වන බව අපේ හැඟීමයි. එසේ නුවුවොත් වචනයෙහි ප්‍රභවය තේරුම් ගැණීම අපහසු වෙයි. අපි එසේ ප්‍රභව දක්වන්ට ගියෙමු නම්, මේ ශබ්දකෝෂය මීට වඩා ඉතා මහත් වනු සමග ම මුද්‍රණ වියදම් ආදිය බෙහෙවින් අධික වනු ද එකඟතා ය. නවීනයන්ට තබා ප්‍රවීණයන්ට ද දුර්බෝධ වූ වචන

මහත් රංගියක ප්‍රභව දක්වීම හැර දමා උගතුන්ට අපහසු නොවන වචනයන්හි පමණක් ප්‍රභව දක්වීම එතරම් ප්‍රයෝජනවත් ද නො වේ. එහෙයින් මෙය ප්‍රභවදර්ශනපූර්වකශබ්දකොෂයක් සේ සම්පාදනය නොකරන්ට තීරණය කර ගතිමු. වචන යෙදීම ද මේ තීරණය අනුව ම සිදු වී ය. වෙනස් වෙනස් වූ මූලයන්ගෙන් බිදුනු නොහොත් විවිධාංශ ඇති ප්‍රකෘතීන්ගෙන් සිදුවූ, එහෙයින් ම භින්නප්‍රභව ඇති, සමානරූපවත් වූ ශබ්ද එකක් හැටියට ම යොදා අඛණ්ඩලිඛිතවශයෙන් විවිධාංශ දක්වීමු. බොහෝවිට වචනයෙහි ප්‍රභවය වූ පාලිවචනය හෝ ඊට සමාන සංස්කෘතවචනය හෝ අර්ථකථනයෙහි දී පර්‍යායශබ්දයක් සේ යෙදීමු. සමහර තැන අප කියූ අර්ථය නිවැරදි ය කි ඔප්පු කරණු සඳහා සමහර වචන යන්ගේ ප්‍රභව වූ ද්‍රවිඩවචනාදිය වරහන් තුළ දක්වන ලදි.

මේ ශබ්දකොෂය හැකි තාක් සඞ්ක්ෂිප්ත කිරීමට හැමවිට ම උත්සාහ කළ නමුත් ඇතුළත් කළ යුතු වැදගත් වචන හෝ කරුණු අඩු කිරීමට කිසිවිටක නො සිතීමු. ඒ සඳහා මෝනියර් විලියම්ස්, ආප්ටෙ යන පඬිවරුන්ගේ සංස්කෘත-ඉංග්‍රීසිශබ්දකොෂයන්හි පෙණෙන ක්‍රම අනුගමනය කෙළෙමු. අපට පුරෝගාමී වූ සිංහලශබ්දකොෂකාරයන්ගේ ක්‍රම අනුගමනය කෙළෙමු නම්, මේ පිටු 496 හි ඇතුළත් වචන යෙදීමට මෙවැනි පිටු 1000 කටත් වඩා වුවමනා වෙයි. නිදසුනක් වශයෙන් 'සං.සිං.කොෂ'යෙ* දක්වීය හැකි ය. එහි සිංහලවචනයට හුදු ඉංග්‍රීසිඅර්ථය පමණක් මිස වචනය යෙදුනු තැන ආදි අනික් කිසි විස්තාරයක් නැත්තේ ය. එහි පිටු 435 ක් වූ ප්‍රථමභාගයෙහි ඇතුළත් සියලු ම වැදගත් පැරණි වචන හා එහි නැති තවත් වචන සියගණනක් ද අවශ්‍ය විස්තර ද ඇතුළත් කිරීමට යෙදුනේ අපේ මේ ශබ්දකොෂයෙහි පිටු 235 කි.

ව්‍යුත්පාදවචනයන්හි අර්ථය අවබෝධ කර ගැනීමට පාඨකයන්ට උපකාර වීම ශබ්දකොෂයකින් අපෙක්ෂා කරයුතු පරමාර්ථය යි. ඒ අර්ථය නො පිරිමසන නොහොත් එබඳු තන්හි දී පාඨකයන් මුළාවේ හෙළන ශබ්දකොෂ ශෘඤ්ඛලාකූල ය යි කිය නො හැකි ය. පැරණි සිංහල පුස්කොළපොත්හි පමණක් නො ව මුද්‍රිතග්‍රන්ථයන්හි ද අව්‍යක්තලේඛන යන්ගෙන් වූ වැරදි නිසා ව්‍යුත්පාදවූ බොහෝ පාඨ තිබේ. අපේ පුරෝගාමී වූ සිංහල ශබ්දකොෂසම්පාදකයෝ එබඳු සමහර වැරදි වචන සියගන්හි යොදුගෙණ නමන්ට හිතුනු අර්ථයක් ඊට කියන අතර එබඳු තවත් බොහෝ වචන මුළුමනින් ම අමතක කර හැර දමති.

දළ 15[21] හි පෙණෙන 'අකලප' යන්නට 'සමාන කළ නොහැකි; අනුපමෙය; අසදෘශ'යි 'සිං.ශ.කොෂ'යෙ† අර්ථ කියයි. ඒ අර්ථය වැරදිබව අපේ මේ ශබ්දකොෂයෙන් දත හැකි ය. රංජශෙඛරසංස්කරණයෙහි අඩොලිපියක 'අකලප' යන්නෙහි විෂමපාඨයක් ලෙස 'අකල්ක' යන්න දක්වන ලදී. ඒ 'අකල්ක' යන්න ම ශුද්ධපාඨය ම ය යි අපි හඟිමු. එය ම ඉතාමත් සත්‍යානුකූලය. එහි අර්ථය 'කපට නුවූ; අවඤ්ඤ; නිර්දෝෂ' යනුයි. ශබ්දයන්ගේ ප්‍රභවය සොයමින් අර්ථ මතු කර දක්වතැයි වර්ණනා ලබන ශබ්දකොෂයක් මෙබඳු අශාස්ත්‍රීය අර්ථ දක්වීම ඉතාමත් වැරදි ය. ප්‍රමාණවැයෙන් සැලකිය යුතු වූ ශබ්දකොෂයක තිබෙන මෙබඳු අර්ථකථනයන්ගෙන් ශිෂ්‍යයන් පමණක් නො ව වචනය යෙදුනු පාඨය පරීක්ෂා කර බලා ශුද්ධපාඨය සොයාගැනීමට ඉඩපහසුකම් නැති ශිෂ්‍යයන් ද මුළාවේ වැටෙන බව කිය යුතු ය.

ඔහැ 107[3] හි "අකිඤ්ඤෝ අහං වත් ඇත ද" යන පාඨයෙහි 'අකිඤ්' යන්නට 'දුෂ්කර නො වූ; අපහසු නොවූ; පහසුවෙන් ලැබෙන; සුකර; සුලභ' යන අර්ථ කියමින් එය 'අකිච්ච' යන පාළිවචනයෙන් බිඳී එනබව ද 'සිං.ශ.කොෂ'යෙ දක්වයි. 'අකිඤ්' යන්න 'අකිච්ච'

---

* සංක්ෂිප්ත සිංහල-ඉංග්‍රීසිශබ්දකොෂය. † සිංහලශබ්දකොෂය.

යන්නෙන් බිඳුනැති කිම ශබ්දබම්විස්තරවට විරුද්ධ ය. පදවසාතයෙහි 'වඡ' යන්නට 'ජ්' යන්න ආදේශ වූ අනික් තැනක් නොමැත්තේ ය. මේ 'අකිඤ්' යන්නෙන් පර ව යෙදුනු 'ඛොඤ්' යන්න පාළි 'හොඤ්ඤ' යන්නට සමාන ය. පාළියෙහි දී ඒ හා තිතර යෙදෙන අනික් වචනය නම් 'බඤ්ඤ' යන්න ය. 'බාහුඤ්ඤ' යන සංඛ්‍යාතවචනය සිංහලග්‍රන්ථයන්හි ද සුලභ ය. 'බඤ්ඤ' යන්න 'භඤ්' හි ද 'භඤ්ඤ' හි ද සිංහලයට ආබව ධම්පියාඅටුවාගැටපදයෙන් ඔප්පු වේ. මුද්‍රිත ධම්පියාඅටුවාගැටපදයෙහි යථොක්ත පාඨයෙහි පෙණෙන මේ 'අකිඤ්' යන්න ද ඒ 'භඤ්' යන්න ම වරදවා ලිවීමෙන් ඇති වූ අශුද්ධපාඨයකි. 'අකිඤ්' සද සිංහල ව්‍යවහාරයෙහි නොපැවැත්තේ ය. එබන්දක් පිළිගණිවින් සිංහලශබ්දකොෂසම්පාදකයෝ එය 'පොහොසත්' කරති.

ධම්ප 51[18] හි "දූනඤංවිභාගරතෝ-දන් හා සංවිභාගයෙහි අදුසර" යන පාඨයෙහි ඉතා සැක කටයුතු ශබ්දයක් සේ පෙණෙන 'අදුසර' යන්න ඡඝනිලඛනමැතිඳුන්ගේ සිංහල ඉංග්‍රීඤිශබ්දකොෂයෙහි යොදා ඊට "fond of; devoted to, addicted to" හි අර්ථ කියන ලදි. ඒ අර්ථය නම් ඒ තැනට ගැලපේ. එහෙත් ඒ 'අදුසර' යන්න අශුද්ධ පාඨයක් බව ඒ පොතෙහි අනික් තැන් පරීක්ෂා කරණ්විට ඔප්පු වේ. මේ 'අදුසර' යන්න යෙදුනේ 'රතෝ' යන්නෙහි අර්ථය ලෙස ය. 'දූනඤංවිභාගරතෝ' යන්නට ධම්ප 88[25], 123[17] යන තන්හි කී අර්ථයන්හි 'රතෝ' යන්න සඳහා යෙදුනේ 'ඇලුණේ' යන්න ය. එයින් අන්තැන්හි ද 'රත' යන්නෙහි අර්ථය ලෙස යෙදුනේත් එය ම ය යනු ධම්ප 123[6], 88[20], 96[15], 123[15] යන තැන්වලින් පෙණේ. පාඨ භයක ම 'රත' යන්නට 'ඇලුණු' යන්නෙන් අර්ථ කියන ලද්දේ නම්, හත්වැනි සථානයෙහි පෙණෙන 'අදුසර' යන්න 'ඇලුණේ' යන්නෙහි අශුද්ධ පාඨයකැයි නිරණය කිරීම සුදුසු ය. 'අදුසර' යන වචනයක් භාෂාවෙහි අනික් තැනක නැත්තේ ය. මේ කරුණුවලින් ඔප්පු වන්නේ අවෘකතලෙඛකයන් විසින් වැරදවූ පාඨ ශුද්ධපාඨ ලෙස යථොක්තශබ්දකොෂයන්ට ඇතුළත් වූ බවයි. ඒ පාඨ සිංහල ද? නැද්දැයි සැක කළ බවට ලකුණක්දු එහි නොපෙණේ.

'සං.සිං.කොෝ'භය ද මේ වැරදි වචන සියල්ල ම රකියි. එහි ඇතුළත් වචන සඛ්‍යාව වැඩි හෙයින් එහි නවාතැන් ගත් අශුද්ධ පාඨ ද බොහෝ ය.

විශ්වවිද්‍යාලය 'සං.සිං.කොෝ'භය "a kind of musical instrument" (=තූර්‍යභාණ්ඩ වර්ගයක්) හි අර්ථ කියන "අනුක්ඛන්තුලි" යන්න ද ථූපවංසයෙහි එන අශුද්ධපාඨයකි. එහි ශුද්ධපාඨය වූ "අනුක්ඛම් තුණ්ඩි" යන්න දඹ 5[27] හි පෙණේ. 'අනුක්ඛම්' යනු හා 'තුණ්ඩි' යනු ද වෙන් වෙන් වූ තූර්‍යභාණ්ඩයි. ඒ ශබ්දයෝ ද්‍රවිඩභාෂාවෙන් පැවැණියහුයි.

ධම්ප 241[9] හි "විවරිතමගඝං-සුරුමඟ; ආවිජිතමඟ හි සේකි" යන තන්හි පෙණෙන 'ආවිජිත' යන වචනයට 'සං.සිං.කොෝ'භය "walked along; traversed" (=ගමන් කළ) හි අර්ථ දක්වයි. ඒ අර්ථය නම් සථානොචිත ය. එහෙත් 'ආවිජිත' යන්නෙහි ඒ අර්ථය නොමැති හි. "පළමු ව දිනූ" "අවුත් දිනූ" යනු ඊට කිය හැකි අර්ථය යි. 'ආවිජිත' යන්න 'විවරිත' යන පාළිවචනයට සමානයක් සේ යෙදුනුහෙයින් ඒ අර්ථය කිසිසේත් ඊට නොගැලපේ. එහෙයින් එය ලෙඛකයන් විසින් වැරදවූ වචනයක් විය යුතුයි. ධම්පියා අටුවාගැටපදකාරයන්. මෙහි ලියන්නට ඇත්තේ 'ඇවිජි' යන්න විය යුතු ය. එය වත්මන් වහරෙහි 'ඇවිදි' යන්නට සමාන ය. 'ඇවිජි' යන්න 'ආවිජි' හි ද, පසු ව 'ආවිජිත' හි ද පහසුවෙන් ම වෙනස් විය හැකි ය.

'සං.සිං.කොෝ'භය "Destructive කම්; A කම් which prevents the fruition of another කම්" (=විනාශ කරණ කර්ම ය; අනික් කර්මයක විපාකය වළක්වන කර්මය) හි අර්ථ කියන 'උවසෙවනිකම්' යන්න ද වැරදි පාඨයකැයි පැහැදිලි ලෙස ම පෙණේ. එය යෙදුනේ ධම්ප 50[31] හි "නිරයසන්තාපෙ උපඛහි යන්නෙන් උවසෙවනිකම්හු විවාදපතව අරමුණුහි නිමිත් වැටහූ සේ කිහු" යන පාඨයෙහි ය. යථොක්ත ඉංග්‍රීඤිඅර්ථය යෙදුනා

වන්නේ මේ 'උවසෙවනිකම්' යන්න 'උපවෙජ්දකකම්ම' යන්නෙන් බිඳුනක් වුව හොතිනි. මේ 'උවසෙවනිකම්හු' උපවෙජ්දකකම්ය නොවන බව යථොක්තපාඨයෙන් ම ඔප්පු වේ. ඒ පාඨයෙහි ඇතුළත් 'අරමුණුහි නිමිත්' යන්න ද 'අරමුණු ගිනිමිත්' යි ශුද්ධ විය යුතු ය. එවිට ඒ පාඨයෙහි අර්ථය වන්නේ "නිරයසන්තාපෝ උපඤි යනුවෙන් 'උවසෙවනිකම්හු' විපාකඋපපත්තියට අරමුණු වූ ගතිනිමිත්තය වැටහෙන්ට සැලසූ පරිදි කිහ" යනුයි. මෙයින් හැඟෙන්නේ මරණාසන්න ව සිටි චුන්ද නම් ගුරුවැද්දට මළ පසු උපදින ජාතියෙහි ලකුණක් වූ ගිනිදැල් 'උවසෙවනිකම්' යන්නෙන් මෙහි දක්වූ කම්ය විසින් පෙණෙන්ට සැලැස්වූ බවයි. උපදින ජාතියෙහි ලකුණ වූ ගතිනිමිත්තය දක්වන්නේ ප්‍රතිසන්ධිජනකකම්ය යි. උපවෙජ්දකකම්ය ප්‍රතිසන්ධිජනක නො වේ. ප්‍රතිසන්ධිය දෙන්නේ උපපජ්ජවේදනීය වූ හෝ අපරාපරියවේදනීය වූ කම්ය යි. ඒ දෙකින් මෙහි ගත යුත්තේ පළමුවැන්නයි. ඒ බව යථොක්තපාඨයට මුලින් තිබෙන "දුවුඛම්වෙනියකම්" යන්නෙන් ද ඔප්පු වේ. අභිධම්ය අනුව ඒ පාඨය සාධාරණ වීමට නම් මේ "උවසෙවනිකම්" යන්න වෙනුවට "උපපජ්ජවේදනීයකම්ම" යන්නෙන් හෝ "අපරාපරියවේදනීයකම්ම" යන්නෙන් බිඳී ආ සිංහලවචනයක් යෙදිය යුතු ය. "අපරාපරියවේදනීයකම්ම" යන්නෙන් බිඳුනු වචනයක් පෙන්නි තිබෙන "උවසෙවනිකම්" යන්නට බෙහෙවින් අසමාන ය. "උපපජ්ජවේදනීයකම්ම" යන්නෙන් බිඳුනු 'උවවදවෙනියකම්' යන පැරණි සිංහලවචනය අව්‍යක්ත ලෙඛකයන්ගෙන් පහසුවෙන් ම 'උවසෙවනිකම්' යි වෙනස් විය හැකි ය. 'ඔහු' යි අර්ථ ලිපියකින් දැක්වූ "උවවෙජ්නි" යන විෂමපාඨයෙන් ද පැහැදිලි වන්නේ මේ 'උවසෙවනිකම්' යන්න නිසැක නොවන බව ය. එහෙයින් එය 'උවවදවෙනියකම්' යන්න වැරදවීමෙන් වූවක්‌යැයි නිරණය කළ යුතු වෙයි. එසේ නුවුවොත් සංක්ෂිප්ත සිංහලඉංග්‍රීසිශබ්දකොෂයෙහි මුඛ්‍යමනින් ම වරදවා අර්ථ කියන 'උවසෙවනිකම්' යන්න සහිත යථොක්ත පාඨය බුද්ධඝෝෂ හා නො ගැළපෙන්නක් වේ.

මේ දක්වනලද්දේ සිංහලකොෂග්‍රන්ථයක ඇතුළත් වීමෙන් ඉතා බරපතළ වැරදි අදහස්වලට මග පාදන වචන සවලාපයකි. විශ්වවිද්‍යාලය මඟින් බිහි වූ 'සං.සිං.කෝෂයෙහි' මෙබඳු වචන තවත් බොහෝ ය.

භාෂාවක පරිණාමයට ඒ භාෂාව ව්‍යවහාර කරන්නන්ගෙන් වන වැරදි බෙහෙවින් ඉවහල් වේ. ඉතා දිඝිකාලයක් මහත් ජනසමූහයක් විසින් ව්‍යවහාර කරගෙණ ආ එබඳු වැරදි වචන භාෂාරීති ලෙස හා නිවැරදි ගැටියට ද ශබ්දකොෂකර්තෘන් විසින් හා වෛයාකරණයන් විසින් ද පිළිගත යුතු වෙයි. යට දක්වන ලද්දේ දිඝිකාලයක් නොයෙක් දෙනා විසින් ව්‍යවහාර කිරීම නිසා ම නිර්දෙෂයයි සැලකිය යුතු එබඳු වචන නොව අව්‍යක්තලෙඛකයන් විසින් වරදවනලදා, එක් තැනැක ම රැඳුනු වචන ය. අපේ පුරෝගාමී වූ යථොක්ත ශබ්දකොෂසම්පාදකයන් කළ සේ පැරණිපොත්හි වැරදීම නිසා දුර්බෝධ වූ වචන හැරදැමීම හෝ ශබ්දකොෂයෙහි ගොදුරු නිතර නැඟුනු අර්ථයක් කිම හෝ සුදුසු ය යි අපි නොසිතමු. එහෙයින් ඔවුන්ගේ ඒ ක්‍රමය මෙහි දී අපි අනුගමනය නොකෙරෙමු. අපට හමු වූ එබඳු වචන රාශියක් යට දක්වූ අන්දමේ හෙතූන් අනුව සකස් කර සුබෝධ වන්ට සැලැස්වීමු. පොත්හි අව්‍යක්තලෙඛකයන්ගෙන් වූ වැරදි රකින්ට අපි නොසැරසෙමු. අපේ ඒ ශුද්ධි හැම විට ම නිරණාත්මක ලෙස ම පිළිගත යුතු ය යි අපි නොකියමු. එහෙයින් වැරදි ය යි පෙණුනු වචනය කඵඅකුරින් ගොදු ඊලඟට වරහන් තුළ එය ගෙදුනු තැන ද ඉක්බිති ඊට අපේ ශුද්ධිය ද දක්වා 'ශුද්ධි?' යන්න යෙදින.

ශ්‍රීමද්ජයතිලකමැතිඳුන්ගේ සිංහල-ඉංග්‍රීසිශබ්දකොෂය අතිපුරාතන සිංහලභාෂාවට "සිංහලප්‍රාකෘත" යි නමක් තබා ශිලාලෙඛනයන්හි පෙණෙන ඉතා පැරණි සිංහල වචන රාශියක් හැරදමයි. සංක්ෂිප්ත සිංහලඉංග්‍රීසිශබ්දකොෂය ද එය අනුගමනය කරයි. එද්දා මෙන් ම අදත් සිංහලභාෂාව ප්‍රාකෘතයකි. අතිපුරාතනභාෂාව පමණක් "ප්‍රාකෘත" යි ගැණීම අයුතු ය. එහෙයින් දැනට ප්‍රකාශ ව පවත්නා පුරාතන ශිලාලෙඛනයන්හි පෙණෙන සියලු වචන ම මේ ශබ්දකොෂයෙහි ගෙදීමු.

මේහි බෙහෙවින් ශබ්දප්‍රකෘති හා ධාතුප්‍රකෘති ද දක්වුවත් නොයෙක් තන්හි සඵර විපර්‍යාසාදිය නිසා ප්‍රකෘතියට වඩා වෙනස් වූ 'දෙනෙ' 'දිවි' යනාදි නාමපද හා ක්‍රියාපද ද දක්වන ලදී. 'දෙනෙ' 'දිවි' යනාදි පද 'දා', 'දිස්' යනාදි ප්‍රකෘතිවලින් සිද්ධ වන බව දත හෙන්නෝ විසරණ දන්නෝ ය. සාමාන්‍ය ශිෂ්‍යයෝ එය දත නො හෙති.

මෙහි අර්ථ ලිවීමේ දී යෙදුනු 1, 2 යනාදි අඩකයන්ගෙන් අර්ථයන්ගේ ප්‍රධාන අප්‍රධාන භාවාදිය නො දක්වේ. අර්ථයන් ප්‍රධානකථාදිය අනුව ගොදන්ට කාලය නො ගෙවීමු.

ප්‍රතිෂේධාර්ථ 'අ' යන්න හෝ 'අන්' යන්න මුලට යෙදුනු සියලු ම ශබ්ද මෙහි දක්වීම අවශ්‍ය ම ය යි නො සැලකිමු. එබදු ශබ්දවල අර්ථ තේරුම් ගැණීමට අවශ්‍ය උපදෙස මෙහි 3, 50 වන පිටුවල කළුඅකුරින් දක්වන ලදී.

මෙහි පිටුව අග දක්වනු ලබන උපෘදග කියවා බලා සමාසශබ්දාදිය මෙහි යෙදූ පරිදි අවබෝධ කර ගැණීම මේ ශබ්දකොෂය පරිශීලනය කිරීමට පහසුවක් වේ.

ශබ්දාන්ත අනුව වචන ගෙදීමේ දී අල්අකුරින් අවසන් වන ශබ්දය මුලට ම යෙදුනේ සවරාදිය සමග බැඳුනු ව්‍යඤ්ජනාක්ෂරයට වඩා අල්අකුර ම ව්‍යඤ්ජනාක්ෂරග්‍රහණයෙහි දී ප්‍රධාන ලෙස සැලකිය යුතු හෙයිනි. එසේ අල්අකුර අන්ත කොට ඇති ශබ්දය මුලට ම ගොදා, එය පූර්වාවයවය වශයෙන් ගෙණ සමාස වූ ශබ්ද ඒ අනුව ම දක්වනලදී. 'අක්' යන්න හා එය මුල් කොට සිද්ධ සමාසනාම ද යෙදූ පරිදි බැලිය යුතු. 'අක්' යන්නෙන් පසු ව සවරාරූඪ 'ක්' යන්න සහිත "අඤ, අකාඩ, අකැප" යනාදිය ද ඉන් පසු ව්‍යඤ්ජනයන් හා බැඳුනු 'ක්' යන්න සහිත 'අක්ක ණඩි', 'අකඩ' යනාදිය ද දක්වනලදී.

අර්ථවගීකරණය හා බැඳුනු 'ඟ ජ ඩ ද බ' යන අකුරු ඒ ඒ වගීයන්හි අන්‍යාක්ෂරයෙන් පසු ව යෙදීමු. එහෙයින් 'අඟ' යන්න 'අඩ්ක්‍රි' යන්නෙන් පසු ව ද, 'අජන්' යන්න 'අඤ්ඣිඳ්‍රිය' යන්නෙන් පසු ව ද දක්ක හැකි ය.

සිංහලවෛද්‍යකග්‍රන්ථයන්ට ම විශෙෂ වූ වචනරාශියක් මෙහි ඇතුළත් ය. **ශොභ රත්නාකරයෙහි** පෙණෙන රොග ඖෂධාදි නාම සියල්ල ම වාගේ මෙහි යෙදිනැති කිය හැකි ය. පැරණිපොත් කියවන්නන්ගේ පහසුව උදෙසා මෙය සම්පාදිත වුවත් කථා ව්‍යවහාරයෙහි පවත්නා වචන රාශියක් ද මෙහි ගොදනලදි.

මෑත දී ලියූ පොත්හි අර්ථතෙන් සාදූ යෙදූ වචන තේරුම් ගැණීමට ඒ පොත්හි ගැටපදවිවරණාදිය තිබෙන හෙයින් එබදු වචන මෙහි ගොදා මේ පොත මහත් කර මුද්‍රණ ව්‍යයම් ආදිය අධික කරන්ට අපි උත්සාහ නො කෙළෙමු.

බොහෝ වචන යෙදුනු පොත් හා පිටු පේළි ආදිය ද මෙහි සැකෙවින් දක්වීමු. වචන ආදිය පිළිබඳ ව පරීක්ෂා කරණ අයට එය ඉවහල් වෙනැයි සලකමු. අප්‍රසිද්ධ වචනවල දී එය යෙදී තිබෙන හැම තැන් ම දක්වූ නමුත් ප්‍රසිද්ධ වචනවල දී එක් තැනක් හෝ දෙතැනක් දක්වීම සෑහෙනැයි සිතීමු.

මෙය හැකි තාක් දුරට සම්පූර්ණ වූ ද නිර්දෙෂ වූ ද ග්‍රන්ථයක් කිරීමට අපි හැම විට ම උත්සාහ කෙළෙමු. එහෙත් අපේ උත්සාහයට විරුද්ධ ව වැරදුනු තැන් හා අඩුපාඩු ද මෙහි නැතැ යි නො කියමු. සර්වනිර්දෙෂ වූ ද සර්වසම්පූර්ණ වූ ද කොෂග්‍රන්ථයක් ලොකයෙහි කිසි ම භාෂාවකින් මේ තාක් අැති නො වී ය.

ඉතා මහත් විශදමක් හා මහන්සියක් ද දරා සියලුපහසුකම් ඇති විශාලසම්පාදක මණ්ඩල යක් ඒසින් දිර්ඝකාලයක් ගෙවා සම්පාදනය කොට ප්‍රකාශයට පැමිණවූ **සිංහලශබ්දකොෂ** යෙහි හා සිංහල-ඉංග්‍රීසි ශබ්දකොෂයෙහි ද මේතාක් ප්‍රසිද්ධ වූ කුඩා කාණ්ඩ කිපයෙහි පවා, **ශ්‍රීමද්ඩී. බී. ජයතිලක** මැතිතුමන් ම සිංහලශබ්දකොෂසංස්ථාපනයෙහි කියන පරිදි, නොයෙක්

දේස් තිබේ. එහින් බොහෝ තැන් ඉතාමත් සුලු සෙවීමකින් හා මහන්සියකින් ද නිදොස් කළ හැකි ය. පැරණි ග්‍රන්ථයන්හි පෙණෙන වැදගත් වචන රාශියක් ද ඒ ශබ්දකොෂ කාණ්ඩයන්ට ඇතුළත් නොවී ය.

විශ්වවිද්‍යාලය මගින් කළ **සංක්ෂිප්තසිංහල- ඉංග්‍රීසිශබ්දකොෂයෙහි** යෙදුනේ ශ්‍රීමද් ජයතිලක මැතිඳුන්ගේ උපදෙශ අනුව රැස් කළ වචනමාලාව ම ය. එය නමින් "සංක්ෂිප්ත"ය. එහි සංක්ෂිපත භාවය වූයේ සම්පාදකයන්ට ලැබී තිබෙන අනවශ්‍ය වචන අඩු කිරීම නිසා නොවන බව "අඤ්ඣාරූ, අප්පජ්ජා, අබ්භන්තරා, ආසි ක්‍රියතුවේ* " යනාදි අවශ්‍යකතාවෙන දහස් ගණනක් තිබීමෙන් ම ඔප්පු වේ. ඒ ශබ්දකොෂප්‍රථමභාගයෙහින් පුරාණග්‍රන්ථයන්හි එන අත්‍යාවශ්‍යකවූවන මහත් රාශියක් හැරදමන ලදී. මේ ශබ්දකොෂයන් සඳහා රැස් කළ වචනමාලාව නොයෙක් ඌනතාවන්ගෙන් යුත් බව එහින් පැහැදිලි වේ.

යථොක්තශබ්දකොෂයන්හි සදෙෂසථාන ද සවලප නොවේ. කඞ්ඛා 21[17]හි 'නිඞ්ඛඛොඝ' යන්නට අර්ථ කිම සඳහා යෙදුනු 'අක්සෙනග්' යන්නට 'මුදුන්වහල අග; පියහි මුදුන' යන අර්ථය සිංහල ශබ්දකොෂය දක්වයි. මේ අර්ථවිවරණය අනුව 'නිම්බකොස' යනු 'වහලේ මුදුන' ය යි තේරුම් ගත යුතු වෙයි. ධම්මපදඅට්ඨකථාවෙහි කාලියඝකිණ්ණකථාවෙහි ගෙයක නිම්බකොසයෙහි කාලියකින්න නැවැත්වූබව සඳහන් වෙයි. බාලයන් එහි මලමූත්‍ර කරණ හෙයින් ඇය එහි සිටින්ට කැමැති නොවූ පරිදි සලී 2. 94[26] හි ද කියන ලදී. මෙහි දී යථොක්තශබ්දකොෂය ප්‍රමාණ කොට ගණිනොත්, ඒ පුරාතනකාලයෙහි කූඛා දරුවන් මලමූත්‍ර කිරීම සඳහා ගෙයි වහල මුදුනට නැංගෂයි නිරණය කළ යුතු වෙයි. 'අක්සෙනග' යන්නට කිය යුතු නිවැරදි අර්ථය අපේ ශබ්දකොෂයෙන් දත හැකි ය.

'අවවාදුන' යන්නට **සිංහලශබ්දකොෂය** "යම්කුගේ අභාවයෙන් පසු ව ඔහු වෙනුවෙන් දෙන දානය" යි අර්ථ කියා එය සපුට කිරීමට පෙ "අවවාදුනය වනාහි ගිහිධර්මයකි" යන පාඨය ද ගෙණ ඇර දක්වා යි. විශ්වවිද්‍යාලයශබ්දකොෂයද ඒ අර්ථය ම ඉංග්‍රීසියෙන් කිය යි. මෙසේ ශබ්දකොෂ දෙක ම අවවාදුනය හා මතකදුනයන් එකක් සේ පිළිගණියි. මතකදන් දීම ගිහියන්ට පමණක් සීමා වූවක් නොවේ. මළවුන් උදෙසා දන් නොදිය යුතු ය යන නිෂෙධයක් භික්ෂූන්ට නොමැති යි. එහෙයින් **සිංහලශබ්දකොෂය** දක්වන සාධකය එහි කි අර්ථය සපුට කිරීමට සමර්ථ නොවේ. **අවවාදුන** යනු, අපේ ශබ්දකොෂයෙහි දැක්වූ පරිදි, කෙනෙකුගේ දේපල ඔහුගේ මරණයෙන් පසු අන් කෙනෙකුට අයිති වන සේ නියම කර තැබීම යි; හෙවත් අන්තිමකැමැත්තපත්‍රයකින් දීමයි. එය "ගිහිධර්මයකි" යි කියේ එය වලංගු වන්නේ ගිහියන් එය කළ විට පමණක් හෙයිනි. භික්ෂුශ්‍රාමණෙරාදීන්ට අයත් දෙය ඔවුන් මැරෙණ විට ම සාඛ්‍යික වන හෙයින් ඔවුන්ගේ අවවාදුනය හෙවත් අනාත්ම කැමැත්තෙන් දීම වලංගු නොවේ. අනාත්මකැමැත්තෙන් නියම කර තැබූ පුද්ගලයාට අයත් නොවේ. ඒ "ශාසත්‍රීය"ශබ්දකොෂසම්පාදකයන් විසින් කළ බරපතල වැරදි අතුරෙන් මෙය ප්‍රධානය යි කිය හැකි ය. සාඛ්‍යික දේපල පිළිබඳ අධිකරණයන්හි දී විනිශ්චයකාරයන් නොමග යවන්නට මෙය හෙතු වන හෙයිනි.

"**අසාදෙසාගාමිනියවත්ථුවෙසේ**" යන්නට අර්ථ කිමේදී **සිංහලශබ්දකොෂය** හා **සිංහල-ඉංග්‍රීසිශබ්දකොෂයන්** එකිනෙකට විරුද්ධ වෙයි. **සිංහලශබ්දකොෂය** කියන්නේ "පාරාජිකාපන්න වූවකුගේ ක්‍රියාව දැන උපසපන් පැවිද්දකුව එලෙසින් වොදනා කිරීමෙන් හෝ කරවීමෙන් හෝ සිදු වන ගරුකාපත්තිය" යන අර්ථය යි. **සිංහල-ඉංග්‍රීසිශබ්දකොෂය** "a Sanghadisesa offence (Vin. iii 166 - 170) which consists in imputing to an ordained bhikkhu a fault committed by another bhikkhu" (අනික් භික්ෂු නමක් විසින් කළ වරදක්

* මේ වචනය සිංහල භාෂාව දන්නා ක්‍රියතුභාෂාවක්තිකයෙකු තබා ශිෂ්ට වූ අන්‍යභාෂාවක්තිකයෙක් පවා නොදනී. ක්‍රියතුස් වහන්සේ උදෙසා 'ක්‍රියතුවා, ක්‍රියතුවේ' යි යෙදීම එතුමාට කරණ අගෞරවයෙකි.

උපසම්පන්න භික්ෂුනමකට අංරෝපණය කිරීමෙහි ඇතුළත් වන සඞ්ඝාදිසෙසාපත්තිය) යන අර්ථය දක්වයි. විශ්වවිද්‍යාලය 'සං.සිං.කොෝ'ෂය ඒ වචනය වත් නොදකියි. යථොක්ත විවිධ අර්ථය ම මුළමනින් ම විනයවිරුද්ධ ය. නිවැරදි අර්ථය අපේ මේ ශබ්දකෝෂයෙන් දතහැකි ය.

ධගැ 241[19] හි "අවජානාහි පඤ්ඤාය" යන පාඨයෙහි තිබෙන "අවජානා" යන්නට **සිංහලශබ්දකෝෂය** කියන්නේ "යතර මඟ යතර ඵලයට පැමිණි අට දෙන; අර්හත්ත්‍ව පුද්ගලයෝ" යන අර්ථය යි. යථොක්ත ධගැ. පාඨය වනාහි **ධම්මපදට්ඨකථාවෙහි** 339 වන පිටුවෙහි පෙණෙන "(මිච්ඡාදිඨිආදීනං) අඤ්ඤං පහානං කරොනෙතා" යන්නට ලියූ විවරණය යි. 'අට දෙනෙකුන් ප්‍රහාණය හෙවත් නැසීම කරන්නේ' යනු එහි අදහස යි. **සිංහලශබ්දකෝෂය** ප්‍රමාණ කර ගණිනොහැත් අඤ්ඤාපුද්ගලයන් මැරිය යුතු ය යි ත්‍රිපිටකයට අයත්, පෙර පවත් ම ධම්ධරයන් විසින් ගරු කරණු ලබන, පොතක ම කියා තිබෙනු යි පිළිගත යුතු වෙ යි. අඤ්ඤාපුද්ගලයන් නැසීම බරපතල පාපයකි. රහතුන් වහන්සේ අඤ්ඤාපුද්ගලයන්ට අයත් වෙති. රහත්කෙනෙකුන් නැසීම පඤ්චානන්තර්‍ය කර්මයෙන් එකක් බව බොහෝ බෞද්ධයෝ දනිති. එහෙත් ඒ කිරීමට අපේ සිංහලශබ්ද කෝෂසම්පාදකයෝ අනුදනිති. **'සං.සිං.කොෝ'ෂකාරයෝ** මේ වචනය ද නොදකිති. නැසන්නට කි ඒ අවදෙන නම් අඤ්ඤාපුද්ගලයන් නොම ම මිච්ඡාදිඨි, °සඞ්ඝාපප, °වචන, °කම්මන්ත, °ආජීව, °වායාම, °සති, °සමාධි යන මොහු ය.

'අත්දෙණ' යන්නට **සිංහල-ඉංග්‍රීසිශබ්දකෝෂය** දක්වන "a (wooden) trough or basin used for washing the hands" –"අත් සේදීම සඳහා යෙදුනු (ලීයෙන් කළ) ඔරුව හෝ බේසම" යන අර්ථය ද වැරදි ය. **සංක්ෂිප්ත සිංහලඉංග්‍රීසිශබ්දකෝෂය** ද මේ වැරදි කරයි. එහි ඇතුළත් වචන සඞ්ඛ්‍යාව යථොක්ත ශබ්දකෝෂයන්ට වඩා වැඩි හෙයින් වැරදි ගණන ද වැඩි ය. ඒ සියල්ල දැක්වීමට මෙහි ඉඩ නොමැතිහ. එහෙත් නිදර්ශනවශයෙන් කිපයක් පමණක් දක්වමු.

සංක්ෂිප්ත සිංහල-ඉංග්‍රීසි ශබ්දකෝෂය **'අභිපාඝ'** යන්නට ඉංග්‍රීසියෙන් කි අර්ථයෙහි අදහස "පාඨය සඳහා කඩු ඇත්තා; දෙවතාපඛ්‍යාතික නමක්" යනු යි. මේ අර්ථය මුළමනින් ම වැරදි ය. **'අභිපාඝ'** නමින් දෙවතාපඛ්‍යාතියක් ඇති බව කිසි තැනක සඳහන් නොවන හෙයිනි. මේ වචනය යෙදුනේ **සිංහලමිලිඳප්‍රශ්නයෙහි** 217 වන පිටුවෙහි අග පවත් පෙණෙන "මහාපෘථිවියෙහි ජනසමූහයෝ වෙන් වෙන් ව පවතිති. හේ කෙසේ ද? යක්ඛ-මල්ලවයෝ ය. .....අසිපාඝයෝ ය.....යනාදි ජනසමූහ කොනෙක් ඇත් ද" යන පාඨයෙහි ය. මේ වචනය යෙදුනු මෙයින් අන් තැනක් නොදක්කෙමු. **'සං.සිං.කොෝ'ෂසම්පාදකයෝ** පරනිර්මිතයක් සවශයට ගන්ව නොගොස් **මිලිඳප්‍රශ්න** යෙහි ඒ පාඨය පරීක්ෂා කර බැලුවාහු නම් **'අසිපාඝ'** යනු ගණරාජ්‍යයක් (සමූහආණ්ඩුවක්) වශයෙන් නොහොත් කම්මාසදම්මාදිහෙතුවක් නිසා ශ්‍රේණියක් වී සිටි ජනසමූහයක් ය යනු වැටහෙනු නිසැක ය. ඉන්දියාවේ පුරාණඉතිහාසය ඉගෙණ ගන්නා ශිෂ්‍යයෝ පවා යථොක්ත වාක්‍යයෙහි මුල ම පෙණෙන **'මල්ල'වයන්** ගණරාජයන් බව දනිති. යථොක්ත සිංහලපාඨය පාළි **මිලිඳපඤ්හපාඨයෙහි** පදානුපදිකපරිවර්තනයෙකි. **එංගලාණනයේ** පාළිපොත්සමාගම විසින් සම්පාදිත **පාළි-ඉංග්‍රීසිශබ්දකෝෂයෙහි** සම්පාදකයන්ගේ හදිසි ප්‍රමාදයක් නිසා මේ වචනයට යථොක්ත වැරදි අර්ථය දෙන ලදි. අපේ විශ්වවිද්‍යාලයෙහි සිංහලශබ්දකෝෂකාරයෝ කිසිත් පරීක්ෂා නොකොට එහි යෙදුනු ඉංග්‍රීසිවාක්‍යය ම අනවශ්‍ය වූ ක්ලිෂ්ට වෙනසක් කොට සුකියනාතියෙහි ගොදා ගත්හ.

'සං.සිං.කොෝ'ෂයෙහි 'උපන්න' යන්නට දුන් අර්ථයක් නම් 'present; gift (=තෑග්ග) යනු යි. මෙය ද ඒ ශබ්දකෝෂකතෘන් නොවිමසා **පරනිර්මිතවශවර්ත්තී*** වන්ට සැරසීමෙන් වූ

---

* **'අනුන් විසින් මවනලද්ද සිය වසඟයට ගන්නා' යනු මේ විග්‍රහයෙහි තේරුම යි. මේ වාක්‍යයි උඩින් මේ තිබෙන දෙවලොවට කියන නම ය. ඊට පහතින් තිබෙන්නේ 'නිම්මාණරතී' නම් දෙවිලොවයි. 'මිරිමේත් සතුටු වන' යනු ඒ වචනයෙහි අර්ථය යි. විශ්වවිද්‍යාලයයේ අනික් විද්‍යාලයයන්ට වඩා උඩින් සිටිති.**

වරදකි. මේ වචනය **සද්ධම්මරත්නාවලියෙහි** **නාඳුනෙරුන්ගේ** කථාවෙහි එන "නැතක් දවසින් දුටු පියරජ්ජුරුවන්ට **උපන්නක්** දෙන්නාක් මෙන් ගාථාපමණෙකින් සෝවාන් කරවා" යන පාඨයෙහි පෙණේ. **ජිනචරිත** මැහිතුමාගේ **සද්ධම්මරත්නාවලිග්‍රන්ථපදවිවරණ** යෙහි එය 'උපාඝන' ශබ්දයට සමාන කර 'පඹුරක්' යි අර්ථ කියනලදී. 'ෂං.ඕං.කෝෂ' සම්පාදකයෝ මේ අර්ථය ම අනුගමනය කරන්ට ඕස වචනය ගෙදුනු පාඨය පිරික්සා ඒ අර්ථයෙහි යොඝාඃයොඝාඃඝ්‍යය විවෙචනය කරන්ට නොසිතූහ. ඒ පාඨය ගෙදුනේ **බුදුරජානන්** වහන්සේට දීඝිකාලයකින් පසු ව සිය පියාණන් වූ **සුදොවුන්මහරජතුමා** පළමු වරට ගමු වූ අවසාඃව සම්බන්ධ පුවත කීමට ය. බුදුරජාණන් වහන්සේ විසින් **එතුමාට** විචිත්‍ර වූ සවිඤාණ බෂ්දෙගනාවක් කිරීමෙන් විශෙෂ සැලකිල්ලක් දක්වීම ප්‍රසාඃවොවිත ය. සමාඃය ලොකයා අතර ද කලකින් හමු වූ ඉතා හිතවත් කෙනෙකුන්ට විශෙෂ සත්කාර කිරීම සිරිත ය. එහෙත් බුදුරජාණන් වහන්සේ එබදු වූ පියරජතුමාට දෙගනා කෙළේ එක ම ඤුඛා ගාථාවකි. මෙය **සද්ධම්මරත්නාවලිකතෘපාදයෝ** 'උපන්නක්' දීමට සමාන කරති. බොහෝ කලකින් නෑගෙදරකට ගිය කෙනෙකුන්ට ඒ ගෙදර වැසියන් විශෙෂයෙන් සම්පාදනය කළ භොජනාදියෙන් සත්කාර කිරීම සිරිත වුවත් බුදුරජාණන්වහන්සේ එබදු උසස් අමුත්තෙකු වූ පියරජුට සත්කාර කළ ආකාරය ඊට විරුද්ධ ය. එය 'උපන්නක්' හෙවත් හැදුනු දෙයක් හෝ ගෙදර වැසියන් සඳහා සාමාඃය වශයෙන් පිළියෙල වූ දෙයක් දීම වැනි ය. එහෙයින් 'උපන්නක්' යන්නට 'උපාඝනය; තෑග්ග' යි අර්ථ කීම වැරදි ය. මෙහි 'උපන්' සද **පා.** 'උපපන්න' (ෂං. උතපඃන්න) ශබ්දයෙන් එන්නකි. 'උපාඝන' ශබ්දයෙන් 'උපන්' යි බිඳේ නම්, 'එකාඝන, නාරාඝණ, පලාඝන, රසාඝන' යන ශබ්දයන්ගෙන් 'එකන්, නරන්, පලන්, රසන්' යි ද බිඳිය හැකි වේ. එබදු සද්ක් භාෂාවෙහි නොමපණේ.

ගම්වැසියන් අතර ද ව්‍යවහාර වන 'අඝුපැවත' යන වචනය 'අඝුපැවැත' යි ද, එහි ප්‍රථමරූපයක් වූ 'අඝුපැවත' යන්න 'අඝුපැවැත' යි ද 'ෂං.ඕං.කෝෂ'කාරයෝ වෙනස් කරති. 'අඝුපැවත' යන්න සලී 2. 165[9] හි පෙණේ. එහෙත් එය සලී 2. 559[18] හි දී 'අඝුපැවැත' යි වෙනස් කරණලදී.* සලී 2. ග්‍රන්ථපදවිවරණයෙහි 'අඝුපැවැත' යන්න ගෞඩ ගෙණ එය 'ශස්‍යාප්‍රවෘත්ති' (**පා.** 'සස්සපවත්ති') යන්න හා සමාන කරමින් 'සරුසාරකම' යි අර්ථ කියා "අඝුපැවැත යනු වර්තමාන ව්‍යවහාර" යි යනුවෙන් නැති වර්තමානව්‍යවහාරයක් ද දක්වන ලදී. අප දන්නා හැටියට නම් වර්තමානව්‍යවහාරයෙහි පවත්නේ 'අඝුපැවත' යන්න ම ය. 'ෂං ඕං.කෝ'කතෘඃනු පරීක්ෂාවක් නොකොට ම ඒ සැහැසි විපර්‍යාසය පිළිගණිති. ඒ විපර්‍යාසය වචනයෙහි සැබෑ අර්ථය තේරුම් ගැණීමට බාධක වෙයි. **බෙන්තර ශ්‍රද්ධාතිෂ්‍ය** සථවිරපාදයන්වහන්සේ විසින් සකස් කළ **විශුද්ධිමාර්ගමහාසන්නයෙහි** 79 පිටුවෙහි "වපුල හොත් තමහට වියයුතු හසුපැ† නොබලා බිජුවට කන්නක්නු මෙන්" යන පාඨයෙහි පෙණෙන 'හසුපැ' යන්න 'අඝුපැවත' යන වචනය අවයව දෙකක් නොව තුණක් ඇති සමාසශබ්දයක් ය යන බව පැහැදිලි ලෙස ම දක්වයි. 'හසුපැ'(>අඝුපැ) යන්නෙන් 'අස්වැන්න' යන අර්ථය ගනයුතු බවත්, **පා.** 'සස්ස + උප්පාද' (ෂං. ශස්‍ය + උතපාද) යන්නෙන් එන 'හස් + උපැ' යන දෙකින් සිද්ධ විය යුතු බවත් ඒ සාධකයෙන් ඔප්පු වේ. ඒ සමාස නාමයෙහි අන්තිම අවයවය වූ 'වත්' යන්න **පා.** 'වන්තු' (ෂං. වඃතු) යන්නෙන් බිඳුනකි. එවිට සම්පූර්ණ වචනයෙන් ලැබිය යුතු අර්ථය වන්නේ "ශස්‍යොත්පාදයෙන් වූ වඃතුව හෙවත් ධනය" යන්නයි. 'හඝුපැවත්' ය්න්නෙන් අා 'අඝුපැවත්' යන්න වර්තමන් ගම්වැසිවහරෙහි '(බත් ආදි යෙහි) පිරුණිබව; දියුණුව; සමෘද්ධිය' යන අර්ථයන්හි යෙදේ.

---

* සලී '. 559[18] හි යෙදුනු "ඔරුකෙනක කැහි ඔොනම් අඝුපැවැත වන සේ විපාක ඉලවත් වේ ද" ය්න පාඨයෙහි පෙණෙන "අඝුපැවැත වන සේ" යන්න සලී 1. 60[18] හි. "අඝුද්‍ය වන සේ" යි පෙණේ.

† මෙය 'හඝුපැ' යි ඃවිඃඤුතු.

'සං.සිං.කොෂ'යෙහි 'අවටනවා' යන භාවක්‍රියාපදයක් දක්වමින් 'වට කරවනු ලැබීම නොහොත් වස්වනු ලැබීම' යන අර්ථ ඇති "to cause to be surrounded or enveloped" යන ඉංග්‍රීසිපාඨය එහි අර්ථය ලෙස දක්වන ලදී. මේ භාවක්‍රියාපදය සාදුගන්ට ඇත්තේ ධර්ම 81[22] හි එන "ගුණෙන් අවටවා බුදුන් දැකිය යුතු සේ පෑහු" යන පාඨයෙහි පෙණෙන 'අවටවා' යන පූර්වක්‍රියාපදය අනුව ය. 'අවටවා' යන්න ශුද්ධ වුවත් 'අවටනවා' යන්නට දුන් අර්ථය යොග්‍ය නොවේ. ගුණයන්ගෙන් වට කරවීම හෝ වැස්වීම මෙහි නොගැළපෙන හෙයිනි. 'බුදුන් දක්නට නොකැමැත්තෙතුට උන්වහන්සේගේ ගුණ කියා අංශා කරවා උන්වහන්සේ දැක්ක යුතු බව දැක්වූහ' යනු යථොක්ත පාඨයෙහි අදහස යි. 'අවටවා' යන්න 'අංවට්ටන' යනාදිය සිද්ධ වන. පා.'අා + වට්ට' යන ධාතුවෙන් අා 'අවට' යන දෙකින් සිද්ධ වූවකැයි ගණිනොත් 'අවටවා' යන්නෙහි අර්ථය 'අංවත්තනය කරවා; හරවා' යනු යි. එවිට 'අවටනවා' යන්නෙහි තේරුම 'හැරීම' යනුයි. ඒ අර්ථ ඇති 'අවට'යි ධාතුවක් හෝ එයින් සිද්ධ පදයක් හෝ භාෂාවෙහි නොමැතියි. එහෙයින් මේ 'අවටවා' යන්න අශුද්ධ යයි ද; එය 'අවුටවා' යි ශුද්ධ විය යුතු යයි ද අපේ අදහස යි. ධර්ම 21[23], 185[17] හි යෙදුනු 'ඇවිවි, ඇවිවු' යන පද හා භාෂාවෙහි නොයෙක් තැන පෙණෙන 'ඇවිමිලි' යන්න ද සිද්ධ වන්නේ ඒ 'අවුට' දයිනි. රූප කිපයක් පමණක් නබා අතුරුදහන් ව ගිය 'කැඳ, ගෙ, පිරිර, බුමුස් ආදි ධාතූන් මෙන් ම මේ ධාතුව ද යට දක්වූ රූප පමණක් නබා අතුරුදහන් වූවකි. ඒ ධාතුවෙන් සිද්ධ වන ප්‍රයොජ්‍යක්‍රියාව 'අවුටවා' යන්න ය. එහි අර්ථය 'අංශා කරවා' යන්නයි.

'සං.සිං.කොෂ'යෙහි ද අංගමධර්මයෙහි එන ඉතා සුප්‍රසිද්ධ වූ ද බොහෝ වචනයන්ට වැරදි තේරුම් දෙයි. එබඳු එක් වචනයක් නම් 'අනෙනාවුත්ථ' යන්න ය. ඊට 'සං.සි.කොෂ' යෙහි "(Vin.)one who has lived in (a forbidden dwelling)"– ('නහනම් කළ වාසස්ථානයක්)අැතුළෙහි විසූ අය' යන අර්ථය කියයි. '(Vin.)' යන්නෙන් අගවන්නේ 'අනෙනාවුත්ථ' යන්න විනයපිටකයට අයත් වචනයක් ය යන බව යි. විනයපිටකයෙහි දී ඒ වචනය යෙදුනේ අනුපසම්පන්නයෙකුට හාර නොකොට, උපසම්පන්න භික්ෂුනමක් වසන ගෙයි එක් රැයක් වත් නැවැ, ශාඛාකාලික වූ හෙවත් පෙරවරුවෙහි වැළඳිය යුතු ආහාරවගී හා ශාඛාකාලික වූ හෙවත් පස්වරුවෙහි ද වැළඳිය හැකි, පලතුරුඉස්ම ආදිය ද සදහා ය. සං.සිං.කොෂ යෙහි මෙබඳු අංගමධර්මයට විරුද්ධසථාන බොහෝ ය.

යට දක්වූ ශබ්දකොෂ කාණ්ඩ කිපය සඳහා පොදුමුදලින් රුපියල් ලක්ෂගණනක් වියදම් විය. ඒ ඉතාමත් සුලු වූ මිපැටියෙකු වැනි වූ ප්‍රතිඵලය බිහි කිරීම සඳහා උසස් වැටුප් ලබන විශ්වවිද්‍යාලයෝපාධිධාරීන් දැතුළු විශාලසම්පාදකමණ්ඩලයක් ඉතා දීර්ඝකාල යක් මහකන්දක් පෙරළීමට තරම් මහත් පරිශ්‍රමයක් දරුහ. එය ම ඔවුන්ට පැවරුණු එක ම කාර්‍යය විය. අනික් දෙයක් ගැන චින්තාවකුදු කිරීමට හෙතුවක් නැත. අවශ්‍ය සියලු ම පෞනපතින් පිරුණු ප්‍රකාශාලය, ඉඛපහසුකම් ඇති කාර්‍යාලය ආදියෙන් ඒ සම්පාදකමණ්ඩලයට අඩුවක් නැත.

ඒ හා සසඳ බලනවිට ඒ අතින් අප ඉතාමත් දිළිඳුබව කිය යුතු ය. වචන රැස් කිරීම වට හා ශුද්ධිපත්‍ර බැලීමටත් අප හිතවතුන්ගෙන් උපකාර ලැබුනු නමුත් අනික් සියලු කටයුතු දෙය තනි අප විසින් ම කරණලදී. අප නිදන!සුඛ කාමරය ම අපේ ප්‍රකාශාලය හා කාර්‍යාලය ද විය. මේ සඳහා අවශ්‍ය පෞත්පත් ගැණීමට හා මුද්‍රණයට ද අවශ්‍ය මුදල් සපයා ගැනීම පිණිස අපේ කලපතාව යොමු කරන්ට ද සිදු විය. ඉතැන්වීම ආදි තවත් නොයෙක් කටයුතුවල ද යෙදෙන්ට අපට සිදු වූ හෙයින් අපේ සම්පූර්ණකාලය ම මේ සඳහා නොයෙදුනේ ය.

හැම ලෙසින් ම ඉතා උසස් වූ පඳුනුකම් ඇති ව සම්පාදිත වූ ඒ තුඩා ශබ්දකෝෂකාණ්ඩ කිපයෙහි ඒ තරම් අඩුපාඩු හා වැරදිත් තිබේ නම්, එබඳු කිසි පඳුනුකමක් නැති තනි අප විසින්, ඊට ගත වූ කාලයට වඩා බෙහෙවින් අඩු වූ කාලයක දී කළ, ඊට වඩා විශාල වූ මේ කෘතියෙහි අඩුපාඩු හා වැරදිත් නැති වුවොත් එය ප්‍රාතිභාශ්‍යයක් විය යුතු ය. අන්‍ය සාහිත්‍යකෘතීන්හි සේ ශබ්දකෝෂයක වැරදි සොයාගැණීම පඳුනු නොවේ. වැරදි පෙණෙන්නේ ශබ්දකෝෂය පරිශීලනය කරණ විට ය. ඊට බොහෝකලක් ගත වේ. බොහෝ වචනයන් ඒ ඒ අර්ථයන්හි යෙදුනු නැත්ද මෙහි දක්වූ හෙයින් අප කි අර්ථවල සාවද්‍ය නිරවද්‍යත්වාදිය විනිශ්චය කිරීම සම්ක්ෂ්‍යකාරීන්ට අපහසු නොවේ. මෙය මුද්‍රණය කරණ අවස්ථාවෙහි නුදුටු වැරදි තැන් එකක් ශුද්ධිපත්‍රයකින් දක්වන ලදි. ඒ සමහර තැන් වූ පරිදි අපේ ම පුද්ගලයට හෙතු ය. 234 වන පිටුවෙහි දෙවෙනි තීරයෙහි මුල ම යෙදුනු 'ඝාල' යන්න එබන්දකි. එය 'ඝාල' යි විය යුතු ය.

අපේ අපෙක්ෂාව වූයේ පැරණිපොත් කියවීමේ දී සුදුසු සිංහලශබ්දකෝෂයක් නැති කමින් නොයෙක් අපහසුකම්වලට මුහුණ පාන්නා ශිෂ්‍යාගන්ට උපකාරී වීම ය. මේ පිටු 496 න් එයින් අර්ධයක් සම්පූර්ණ වී ය. 'ප' යන්න පටන් ඇති ඉතිරි අර්ධය ද තව අවුරුදු දෙකකින් හෝ තුනකින් ශිෂ්‍යයන් අතට දෙන්ට බලාපොරොත්තු වෙමු. දැනට 'ල' යන්න දක්වා ලියා අවසන් ය. 'ප' යන්නේ පටන් 'මෙලච්ඡ' යන්න අවසන් කොට ඇති පරිශීලක වචන ලිවීමට 'ප්‍රූල්ස්කැප්' කඩදසි පිටු 400 ක වඩා වුව මනා වී ය. එයින් ඒ දෙවෙනි කාණ්ඩය කොතරම් විශාල විය හැකි දැයි සිතාගත හැකි ය. එහින් ඒ දෙවෙනි කාණ්ඩය කොතරම් විශාල විය හැකි දැයි සිතාගත හැකි ය. මේ පොත කාණ්ඩ තුනකින් සම්පූර්ණ වේ. පැරණිසිංහලපොත්ආදියෙහි ඇතුළත් සථානප්‍රදාලආදීන්ගේ සංඥානාම පිළිබඳ සංක්ෂිප්තාවිවරණ හා ඒ නම් යෙදුනු තැන් ද, ඒ පිළිබඳ වැඩි විස්තර බලාගත හැකි තැන් ද ඒ තුන්වැනි කාණ්ඩයෙහි ඇතුළත් වේ.

මේ තරම් මහත් ශබ්දකෝෂයක් සම්පාදනය කරන්ට මුල දී අපි අදහස් නොකෙළෙමු. විශාලග්‍රන්ථයක් මුද්‍රණය කරවීමට අපට ශක්තියක් නැත. එබඳු දෙය සඳහා ධනවතුන් වෙත ගොස් උපකාර ඉල්ලන්ට අප තුළ කැමැත්තක් හෝ පුරුද්දක් ද නැත. එහෙයින් අප අදහස වූයේ පැරණිපොත්හි පෙණෙන දුර්බෝධසිංහලවචන හා අකුරු නොදන්නා නමුත් තුගත් හෝ අශිෂ්ට නුවූ ගම්වැසියන්ගේ කථාව්‍යවහාරයෙහි එන වැදගත් වචනත් මේ ශබ්දකෝෂයට ඇතුළත් කිරීම ය. සිංහලභාෂාවෙහි පැවැති පැරණි විශිෂ්ටලක්ෂණ අවබෝධ කර ගැණීමට ගම්වැසිවහරෙහි පෙණෙන වචන බෙහෙවින් ඉවහල් වේ. බොහෝ උගතුන් පවා මේ සමහර වචනයන්හි පැකිලෙන බව යට දැක්වූ 'අනුපැවත' යන්නෙන් ම ඔප්පු වේ. අපේ "ප්‍රගතිශිලි" ලේඛකයන් තුළ යම්කිසිව ඇති තදබල අංශාව නිසා ඒ ගම්බද බස දැන් ක්‍රමයෙන් අතුරුදහන් වෙවීන් පවතී. අපේ සමහර 'උගත්තු' සිංහල ඉගෙණීමට **එංගලන්නෑට** යති. එය **එංගලන්නෑයේ** උගතෙකු ඉංග්‍රීසි ඉගෙණීම සඳහා **ලේඛකාවට** ඒම වැනි විහිළුවකි. පොතපතින් උගත නොහැකි සිංහල උගත හැක්කේත් පරීක්ෂා කිරීමට යොග්‍ය වචන ලැබෙන්නේත් අපේ පිටිසරගම්වල දී ය.

සිංහලභාෂාවට ඇතුළත් ව තිබෙන දහස්ගණන්ක පාලිසංස්කෘතඉව්බවවන හැර දමා යට කී අන්දමේ සිංහලවචන පමණක් ගෙණ ඒ පිළිබඳ අවශ්‍යවිස්තර සහිත තුඩා ශබ්දකෝෂයක් සම්පාදනය කරන්ට මුල දී අදහස් කළ නමුත් දිසත්‍රික්ප්‍රාඥශාලාපරීක්ෂක ඒ. ඩබ්ලිව්. කඩුඅරච්චි මහතාගේ ඉල්ලීම පරිදි ඒ අදහස හැරදමා අවුරුදු 2500 ක් මුළුල්ලෙහි දියුණු වෙමින් පවත්නා සිංහලභාෂාවෙහි රැස් කර ගත හැකි සියලු ම වැදගත් වචන යොදා මේ ශබ්දකෝෂය සම්පාදනය කරන්ට තීරණය කර ගතිමු. එබඳු ශබ්දකෝෂයක් මුද්‍රණය කිරීමට අවශ්‍ය විශාල සඳහා පාරිතෝෂික මුදලක් ලබාගැණීමට ලබාගත හැකි බව ද අප දැනගත්තේ ඒ මහතාගෙන් ම ය.

කළුආරච්චිමහතාගේ කීම පරිදි මෙහි විෂයම සඳහා ලඛ්කාණ්ඩුවේ අධ්‍යාපන මාන්‍යාංශයෙන් උපකාර ඉල්ලීමු. එකල ගරු අධ්‍යාපනාමාත්‍ය ව සිටි **සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නංගර මහතා** උපාධ්‍යාපනාධ්‍යක්ෂ වූ පරලොකප්‍රාප්ත **ඇස්. ඇල්. බී. කතුකෝට්ටුව මහතාගේ** හා ලඛ්කාණ්ඩුවේ ප්‍රධානභාෂාපරිවර්තික ධුරන්ධර වූ **ජී. ජී. අභයශේඛර මුදලි තුමාගේන්** ලබාදෙන් අනුව ඔහුන් 'රටට අතිශයාවශ්‍යක වූ මේ කෘතිය සඳහා එතුමාට කළ හැකි සියලු ම උපකාර කරණ බව' අපට දන්වී ය. එහෙත් මේ සම්බන්ධ කිසිවක් කරන්ට මත්තෙන් **කන්නංගරඇමැතිතුමා** ඒ ධුරයෙන් ඉවත් වී ය. **ජී. ජී. නුගවෙල මහතා** අධ්‍යාපනාමාත්‍යධුරයට පත් වී ය. පළමු අධ්‍යාපනාමාත්‍යතුමා විසින් පිළිගෙණ තුබුනු අපේ ඉල්ලීම අමාත්‍යමණ්ඩලයට හා මන්ත්‍රීමණ්ඩලයට ද ඉදිරිපත් කෙළේ **නුගවෙල ඇමැතිතුමා** ය. ආණ්ඩුව මේ පොතෙහි කාණ්ඩ තුන මුද්‍රණය කිරීමේ විෂයම සඳහා රු 15,000 ක් කොටස් වශයෙන් පරිත්‍යාග කරන්ට සතුටු වී ය. ඒ වනාහි අප ඉල්ලූ ගණනින් අඩියකි. මෙහි මුද්‍රණය සඳහා රු 30,000 ක් විෂයම් වෙතැයි අප මුල දී කල්පනා කළ නමුත් මුල්දී අදහස් කළ පමණට වඩා කඩදැසි මිල ඉහළ නැඟීම, මුද්‍රණශාලා ශාස්තු අධික වීම යන කරුණු නිසා මේ සම්පූර්ණ පොත (පිටපත් දෙදහක්) මුද්‍රණය කිරීමට රුපියල් හැට්දහසකට කිට්ටු ගණනක් විෂයම් වන බව දැන් පෙණේ.

අධ්‍යාපනාමාත්‍යාංශයේ මහලෙඛකනායකධුරන්ධර **ඇල්. ජේ. ද ඇස්. සෙනෙවිරත්න මහතාගෙන්** ද මේ කෘතියෙහි දී බොහෝ උපකාර හා උපදෙස ද උත්සාහජනකවවන ද නොයෙක්විට ලැබුනුබව කෘතඥතාපූර්වක ව සඳහන් කරමු. මෙබඳු උපකාරයක් ලබන්නෙකු හා ආණ්ඩුවත් අතර ඇති කර ගන්නා පොරොන්දුපත්‍රයෙහි අපේ ගෞරවයට හෝ නිදහසට හානියක් විය හැකි අනවශ්‍ය කොන්දේසි සිඟල්ලක් ම එහින් බැහැර කරවූයේත් ආණ්ඩුවේ උපකාරය සඵල ලෙස ලැබෙන්ට සැලැස්වූයේත් එතුමා ය. **කන්නංගර, නුගවෙල, සෙනෙවිරත්න** යන මැතිවරුන් මේ කෘතිය කෙරෙහි දක්වූ සැලකිල්ල හා දුන් අනුබල යත් මෙය මෙතරම් ප්‍රයෝජනවත් ලෙස අවසන් කිරීමට ඉවහල් වූ බව සඳහන් කරන්නේ අනිශය කෘතඥතාවෙනි.

පුරාවිද්‍යාධිකාරි දර්ශනවිශාරද **සෙනරත් පරණවිතාන මහතා** සීගිරිපද්‍යයන්හි ඇතුළත් වචනමාලාව හා එහි අර්ථ ද අපට පරිත්‍යාග කෙළේ ය. මේ කෘතිය සඳහා ඒ මහතාගෙන් විශිෂ්ට උපකාර ලැබුනු බව ප්‍රීතිපූර්වක ව සඳහන් කරමු. විවිධ ශාස්ත්‍රීයකාරණයන්හි නිතර යෙදී සිටින, පුරාවිද්‍යාතාත්ත්විකකාර්‍යයේ සඳහා ලක්දිව නොයෙක් පළාත්වල සඤ්චාරය කිරීම පිණිස මාස් පතා විශාල කාලයක් ගත කරණ, පුරාවිද්‍යාදිකාරියේ පාලනභාරය ද මුළුමනින් උසුලන, ඒ මහතාගෙන් මේ කෘතිය සඳහා උපදෙශයක් හෝ පැරණිවචන පිළිබඳ ඒ මහතාගේ තීරණය හෝ අපට අවශ්‍ය වූ හැම විට ම අපේ සංකල්පනාවන්ට ප්‍රධානසථානය ලැබිනි. පැරණි ශිලාලෙඛනයන්හි වරදවා මුද්‍රිත වූ පාඨරාශියක් ඒ මහතාගේ සහායත්වය නිසා සකස් කළ හැකි වීම ප්‍රීතියට කාරණයකි.

දිසත්‍රික් පාඨශාලාපරීක්ෂක **ජී. ඩබ්ලිව්. කළුආරච්චි මහතා** නොයෙක් ක්‍රමවලින් මේ කාර්‍යයට අනුබල දුන්නේ ය. මේ සම්බන්ධ ඉංග්‍රීසිලියුම්වල දී ඒ මහතාගෙන් අපට ලැබුනු උපකාරය ඉතා මහත් ය. මීට අවශ්‍ය දුලීභ වූ පොත් සමහරක් සපයාදුන්නේ ඒ මහතා ය. පොත් කිපයක වචන එකතු කර දීමෙන් හා අපට සිවුපසයෙන් සඞ්ග්‍රහ කිරීමෙන් ද අපේ රෝගාබාධයන්හි දී අවශ්‍ය දෙය සම්පාදනය කර දීමෙන් ද මේ කාර්‍යීය ඉක්මනින් නිම වීමට ඒ මහතා බෙහෙවින් ම උපකාරී වූ බව සඳහන් කරන්නේ කෘතඥතාපූර්වක ව ය.

ජී. ජී. අභේසේකර මුදලිතුමාගෙන් මේ සඳහා ලැබුනු උපදෙශ හා උපකාර ද ඉතා උසස් කොට සලකමු.

අධ්‍යාපනාමාත්‍යාංශයේ නීතිඥ උපදේශක **ඩී. ඩබ්ලිව්. පෙරේරා** මහතාගේත් හා **ඒ. රත්නපාල** මහතාගෙනුත්, අධ්‍යාපනකාර්‍යාලයෙහි **ඒ. පණ්ඩිතරත්න** මහතාගෙත් හා **කේ. ඩබ්ලිව්. ඩී. ඒ. විජේසිංහ** මුදලිතුමාගෙනුත් ලැබුනු උපකාර ද කෘතඥතාපූර්වක ව මෙහි සඳහන් කරමු.

කළ වැඩ සඳහා රුපියල් දහස්ගණනක් තමන්ට ලැබිය යුතු ව තිබිය දීත් මෙහි මුද්‍රණය නොා නවත්වා සෙමෙන් සෙමෙන් වුව ද කර ගෙණ ගිය **මහාබෝධි යන්ත්‍රාලයාධිපති** **කෘත්‍යාධිකාරී** මහතා හා **පාලකමණ්ඩලයත්** අපේ කෘතඥතාවට භාජන වෙත් ම ය.

මේ සිංහල දෙනාට ම අපගේ ශුභාශීර්වාදපූර්වකඥතිය මෙයින් පිරිනමමු.

මිට,

වැලිවිටියේ සොරත

ශ්‍රී බුද්ධ වර්ෂ 2496 ක් වූ ඇසළමස
පුරදෙළොස්වක් ලත් ගුරුදින
විද්‍යෝදයපිරිවෙණේ දී ය.

සංලක්ෂ්‍යය:-

මේ ශබ්දකෝෂයේ පිටපත් සැලකිය යුතු ගණනක් ශෝභ්‍යඅංගතනයන්ට පරිත්‍යාග කිරීම සඳහා අධ්‍යාපනමණ්ඩලයට පරිත්‍යාග කළ බව මෙහි සඳහන් කරන්නේ අතිශය ප්‍රීතියෙනි.

"මෙ කියන වදන්රැ සි
නිවිහු ම දනිති ගුණදෙ ස
දන්නා තැනට මි සි
වෙයෙස නො දැනේ රැවන් නතු ලෙ ස"

(කාශෙ 1-23

'මැපෙළ පමණ සිඹි-
නිවිමන් දනන් පසසත,
ගරහත යළි දු කම් කිම්?-
පඬුවෝ ම මෙහි පමණෝ"

(සිදත)

PREFACE

SINHALESE, a language belonging to the Indo-Aryan family, is spoken by the people of that name who, according to the tradition recorded in the *Mahā-Vaṃsa*, migrated to Ceylon from North India in the sixth century B.C. No document belonging to the earliest phase of the language, *i.e.*, before the introduction of Buddhism to the Island in the third century B.C., has come down to us. The earliest datable Sinhalese documents yet discovered are a cave inscription of the reign of Uttiya (207–197 B.C.) and a few records of rulers who flourished in the two centuries preceding the Christian Era, including one at least of Duṭṭhagāmaṇī (161–137 B.C.). The language spoken by the early North Indian immigrants to Ceylon could not have differed very much from that of these early Brāhmī inscriptions.

The early development of the Sinhalese language has been influenced by two main factors, viz., the arrival in the Island of successive bands of immigrants and the greatest cultural event in our Island's early history, the introduction of Buddhism during the reign of Devānampiyatissa, the contemporary of Asoka. These two factors explain the presence of characteristics peculiar to different Middle Indian dialects which may be traced in the Sinhalese language. The composite nature of the Sinhalese Tongue has often misled those who have attempted to formulate theories on the origin and early development of the race solely from their researches into the characteristics of the language.

The evolution of the Sinhalese Language has been a very gradual one, and can only be understood by a careful study of the various writings of each period in history, the most valuable on account of their permanency being the Sīgiri graffiti, deciphered and commented on by Dr. S. Paraṇavitana, and the inscriptions that have been edited and published with comments in the *Epigraphia Zeylanica*. For the most part, the changes have been so gradual that they are evident only when documents separated by several centuries are compared one with the other.

The long and chequered history of the Sinhalese people has had its influence on the language. The vicissitudes of history have at times called into existence a large number of words in place of others which have gone out of currency and of which the meanings are not readily understood at the present day.

The absence of a suitable dictionary, which would help as a guide to arrive at the meanings of these words, is a great drawback to the students. It is difficult to believe that the ancient Sinhalese, who compiled Pali lexicons such as the *Abhidhānappadīpikā*, did not attempt at the compilation of lexicons in their own language. However, a Sinhalese lexicon compiled prior to the Kotte period has not been discovered yet. It is possible that such Sinhalese lexicons of the ancients, just as the other valuable ancient literary works might have been destroyed by the enemies both native and foreign such as Rājasiṅha the First of Sītāvaka (16th century A.D.) and Māgha, the Indian invader (13th century A.D.)

There are three old lexicons, *Piyummala*, *Ruvanmala* and the *Purāṇa Nāmāvaliya*, dating from the Kotte period (15th century A.D.) ; but these afford very little assistance to the present day student. Their vocabularies are very limited, consisting for the most part of words occurring in poetical works, in addition to those coined by the compilers themselves from Pali and Sanskrit words in accordance with phonological rules (so far as they were aware of them). These lexicons are no more than handbooks for versifiers.

The *Eḷu Akārādiya* and *Śuddha Siṅhala Akārādiya*, two dictionaries compiled in recent times, contain little more than the words found in the old lexicons. The small dictionary entitled *Śabda Muktāvalī*, compiled by Pandit Vēragama Puñchi Baṇḍāra, is a very meagre compilation providing little guidance on the meanings of words in the old texts ; the *Siṅhala Mahā Akārādiya*, compiled by the Ven. B. Sri Rēvata (Nayaka) Thera, though an improvement on its predecessors, is not always a reliable guide.

The Sinhalese-English Dictionaries of Clough and Carter, while avoiding the obscure words of the early texts, are needlessly encumbered with numerous Sanskrit words which never had currency among Sinhalese writers, ancient or modern. How such words crept into these dictionaries can be explained by referring to the method employed by the compilers, who set their native catechists the task of finding Sinhalese equivalents for words in English Dictionaries. These catechists, on their part, it is said, resorted to English-Sanskrit Dictionaries for equivalents, a device unfortunately not despised by compilers of Sinhalese dictionaries even today.

The need for a dictionary embodying the fruits of researches into the meanings of obscure words in our language is felt more than ever before by those reading the Sinhalese texts, in view of the revived interest in the study of the language today. Equally pressing is the need for a proper dictionary meeting the requirements of the student of Sinhalese—a need that was felt even in our student days, and not yet made good.

What baffles even a learned scholar reading an old Sinhalese text is not the Sanskrit and Pali *tatsamas* occurring therein, but the genuine Sinhalese words and those of Dravidian origin. Even eminent scholars who have undertaken the task of editing the classical Sinhalese texts often failed when they attempted to elucidate words of the latter type.

This is our real problem and the average compiler of Sinhalese dictionaries, intended for students, never understood it. His method was to take at random any words he fancied, attaching to them meanings given in existing dictionaries. Then he added as many words from a Sanskrit dictionary as he needed to make up the limit he desired, without taking the trouble even to ascertain whether they occurred in any Sinhalese text. Compiling a dictionary on this plan is no difficult task. But a dictionary, if it is to serve any useful purpose, must be the result of the classification of words contained in literary works, and ascertainment of their meanings from a careful study of them in the various contexts in which they occur. The labour that would be necessary for the successful accomplishment of an undertaking of this nature is immense. Such a venture is beyond the resources of a private individual.

In the circumstance, therefore, it was gratifying that the task of compiling a comprehensive etymological dictionary of the Sinhalese language was undertaken by the Ceylon Branch of the Royal Asiatic Society, with the financial backing of the Ceylon Government and under the editorship of no less a person than (then Mr.) Sir Baron Jayatilaka.* This was in 1927. Unfortunately, the results have not come up to the high hopes of scholars both at home and abroad. In 1935, the first fasciculus ending with *akrama* appeared. The sixth fasciculus up to *anu-prajñapti* made its appearance in 1942, the total number of pages in all the six fasciculi being no more than 266. The Sinhalese-Sinhalese Dictionary, though more urgently needed than the Sinhalese-English, was published appreciably later, the first fasciculus ending with *aktol* appearing as late as 1937 and the fifth ending with *aḍu-vädi* in 1941, the total number of pages being only 232.

අවිග්‍රහ= නිර්මත්ත හෝ ශරීර නැති (වි 6. 18[2-20]). [නැති.

අවිඝන=1. අනුපද්‍රවය (ජාගැ 1[5]). 2. උපද්‍රව

අවිචාරී (-වාදිය- සර 125[5])= 1. විචාරණය නොකටයුතු. 2. අසදෘශ (සද්ධ 86[12]).

අවිච්චි=පක්ෂියෙක්.

අවිච්ඡින්න=නොසිඳුනු; නිරන්තර.

අවිච්ඡේද=1. නොසිඳීම. 2. සිඳීමක් නැති.

අවිජ්=අවිද්‍යාව (බගැ 1[3]).

අවිජ්ජමාන්=අවිද්‍යමාන; නැති (බගැ 133[6]).

අවිජ්ජමානපඤ්ඤත්ති= පරමාර්ථවශයෙන් අවිද්‍යමාන වූ ද්‍රව්‍යයන්ට කැබූ 'ඝෘහ, රථ, මනුෂ්‍ය' ඝනාදි සම්මුති නාම.

අවිජ්ජා=අවිද්‍යාව. -අනුසය=සිතෙහි ලැගගෙණ සිට ප්‍රත්‍යය ලද කල නැඟී සිටින අවිද්‍යාව. -ආසව= හැම අතින් ම වැහිරෙණ නොහොත් දීඝීකාලයක් සන්තතිපරම්පරාවෙහි පල් වූ අවිද්‍යාව. -ඔඝ= ඔඝය වැනි අවිද්‍යාව. -ඛාණගණ්ඨ=නාමරූපකාරයන් එකට ගැට ගසන නොහොත් සත්ත්වයන් සසර බඳින අවිද්‍යාව. -ධාතු=සත්ත්වපුද්ගලාදීන් තොර සභාවධර්මමාත්‍රයක් වූ අවිද්‍යාව. -නීවරණ= චිත්තය මුවහ කරණ අවිද්‍යාව. -යොග= අවිද්‍යාව නමැති යොගය; සත්ත්වයන් සංසාරයෙහි යොදන හෝ බඳින අවිද්‍යාව. -සංයොජන=සත්ත්වයන් සසර බඳින බන්ධනක් වැනි අවිද්‍යාව.

අවිඤ්ඤප්තිජනක=විඤ්ඤප්තිය නුපදවන; සිතෙහි අදහස් ප්‍රකට වන වචන හා ක්‍රියා ද අැති නොකරණ (වි 1. 88[2-5]).

අවිඤ්ඤාණක, අවිඤ්ඤාණ්ණක= විඤ්ඤාණය කෙවත් සිත නැති ඔස්ගල් ආදිය.

අවිත?=අවිහිංසා? (ශිසං IV. 281[2]).

අවිතක්ක=විතර්ක නැති (ජාගැ 108[27]).

අවිතථ=නොඑසේ නුවූ; එසේ වූ; සතය.

අවිතථාග්‍රාහක= වෙනස් ලෙස නොගන්නා; තත්වූ පරිද්දෙන් ම ගන්නා (වි 6. 191-19).

අවිතක්කි=විතර්කරහිත.-අවිචාරබ්‍යාන(සමාධි)= විතර්කවිචාර දෙක ම නැති විශෙෂකාඟ තාව; වතුර්ධ්‍යානයෙහි චිත්ත්‍යාදිබ්‍යාන

තුණෙහි හෝ පඤ්චකනයෙහි තෘතීයාදි ධ්‍යාන තුණෙහි යෙදෙන විත්තෛකාග්‍රතාව (වි 1. 311[1-28]). -විචාරමත්තසමාධි=අවිතර්කී වූ විචාරය පමණක් ඇති (පඤ්චක නයෙහි) චිත්තඒකාග්‍රතාසමාධිය (වි 1. 308[2-5]).

අවිදග්ධ=බොලඳ (බෝ 283[24]).

අවිදු-ලේවැරැල්ල (වත 66).

අවිදූ= 1. අවිද්‍යාව (කව් 88). 2. මෝඩ (සර 264[14]). 3. අසුරකායෙක (රූ 133). -පස=අවිද්‍යා නමැති ප්‍රත්‍යය.

අවිදූමනු=අවිද්‍යමාන (කව් 314).

අවිදූමන්විදි= අවිද්‍යමානවිධිය; ඇති අංදිය විමට නිමිති ඇතත් එය නොවන විධිය (සිදත් 33[1]).

අවිදූරෙනිදාන= දුර නුවූ, සමීප වූ, නිදානය හෙවත් හෙතුව; මහාබොධිසත්ත්වයන් තුසිත දෙව්ලොවින් චුත වීම පටන් බුදු වීම තෙක් වූ සිදහි. [මන් විදිය.

අවිද්‍යමානෙ=නොං පෙණෙන; නැති. -විධි=අවිදූ

අවිද්‍යා=මොහය (විභාග-වි 6. 133 පටන්). -අනුශය, -ආශ්‍රව අංදිය 'අවිජ්ජානුසය' යනාදිය මෙනි. -ඛ්‍යාන=මෝඛතම නමැති ධ්‍යානය (මිලි 715).

අවිඛ්‍යාන= 1. නියම නොකිරීම. 2. අකාරං දෙයය නියම කිරීම (පසං 73[12]).

අවිනය= 1. විනය නොවන දෙය. 2. නොහික්මීම. -වාදි=විනය නොකියන.

අවිනාභාව= නොවෙන් ව පවත්නාබව (නාය 25[11]). -ආත්මකව්‍යාප්ති= අවිනාභාවය ආත්ම කොට ඇති(එයින් ම යුක්ත වූ) සාධ්‍ය සාධන දෙදෙනාගේ අන්‍යෝන්‍ය සම්බන්ධය (නාය 85[10]). -සම්බන්ධ=අවිනාභාවය නමැති සම්බන්ධය (නාය 62[27]).

අවිනාභාවි=වෙන් ව නොපවතින සුලු.

අවිනිශ්චිත අම= වෙන් ව නොසිටින පෘථිවි, ආප්, තෙජස්, වායු, වර්ණ, ගන්ධ, රස, ඕජස් යන අවවැදෑරුම් රූප (වි 7. 244[21]). 2. වෙන් නොවීම නමැති අර්ථය.

අවිනීත=1. නොහික්මුනු. 2. නොහික්මුනුබව (දහම් 172[22]).

අවිපරීතදර්ශන=විපර්‍යාසය නුවූ දැක්ම; සම්‍යග් දර්ශනය (වි 7. 198[2-18]).

අවිපාකවිඤ්ඤ=විපාක නොවන කුශලාකුශල ක්‍රියාවිත්ත (වි 7. 16[1-33]).

අවිපවාසසම්මුති=ඉවූ සිවුරු අරුණු නැඟෙන විට අත්පස නොතිබුනත් නිසැකි නොවන සේ සඞ්ඝයා විසින් කළ සම්මුතිය (පාරූ 451[13]).

අවිප්‍රවාස=වෙන් නොවීම; යුක්ත වීම (සව්ී 179[6]).

අවිබන්=විභක්තිප්‍රත්‍යය යෙදීමට සුදුසු වුවත් එය නොයෙදූ ශබ්ද (සිදත් 32[1]).

අවිභක්තික=1. බෙදීමක් නැති. 2. විභක්ති නොගත්. [ප්‍රකට නුවූ අරමුණ(අභි වි 274[1]).

අවිභූත=ප්‍රකට නුවූ; -ආලම්බන=අභිගහිත්

අවිය=1. ව්‍යයයක් නැති. 2. නිපාතොපසර්ග (සිදත් 115[5]). 3. නිවණ. 4. අඛ්‍යාත(රූ 47). -'කිණ්ණිය=අව්‍යය අක්ඛාතණ්ණිය; මේ දැ නොකිරීම හා ක්‍රියා නොකිරීම (ඛිසං III. 171[3]). -සද්ද=අව්‍යයශබ්ද; වරනැඟි අවසන් වීම නැති නිපාතොපසර්ග (සිදත් 32[2]). -සමස්=අව්‍යයක් මුලින් යෙදී වන 'යවිදිවි, දුලද' යනාදි සමාස (සිදත් 115[3]).

අවියත්=අව්‍යාකෘත; නුහුත්.

අවිරතිශීල= විරතිචෛතසිකය හා යෙදුනු සෙසු චෛතසිකාදිචෛතසික (වි 1. 491-16).

අවිවරදර්ශන=අතර සිදුරු නැති දන් ඇති බව (සමී 128[23]). [(වි 6. 174[1-11]).

අවිලෝම=1. විලෝම නොවන. 2. එළුලෝම්

අවිවාහක=විවාහයට නොපැමිණි.

අවිශෙෂ=විශෙෂ නොවන; සාමාන්‍ය.

අවිෂය=ඉන්ද්‍රියයන්ට ගොචර නොවන; සිතිය නොහැකි. -ප්‍රමාණ= සිතීම් අංදියට සථාන නොවන ප්‍රමාණ ඇති (සර 191[1]).

අවිෂ=විෂරහිත. [(බුත් 159[14]).

අවිෂංවාදක=නොරවටන; බොරු නොකියන

අවිසර= 1. අවිචාර; විචාරය නැති (ජාගැ 108[27]). 2. අභිචාරිකාව (සි 578).

අවිසාවිවූ†=1. අකිකරු. 2. වණඹ.

අවිසාර=නොවිසිරීම (වි 1. 304[2-10]).

අවිසේ=අවිශෙෂ; සමාන (රූ 409).

අවිහ (-තල)=ශුද්ධාවාසබ්‍රහ්මලොකය.

අවිහිංසක=හිංසා නොකරණ.

අවිහිංසා=හිංසා නොකිරීම. -බාහු=සත්ත්වයා මාතෘගයක් වූ අවිහිංසාව (වි 5. 303[1-30]). -චිත්තඛ්, -සඞ්කල්ප=අවිහිංසාව පිළිබඳ ඥාන පත් කල්පනාව.

අවිතික=1. නොකළ. 2. නියම නොකළ.

අවිචි=දුක් අංදියෙන් අතරක් නැති නිරය. -ජරා= අතරක් නැති, දුක්ක නොහැකි, රූපබඹියන්ගේ ක්‍ෂණිකජරාව (බපු 156[21]. වි 5. 116[2-25]). -මහානරක=දුක් අංදියෙන් නිරන්තර වූ මහනිරය. -සහනාප=අවීචියෙහි පවත්න දුහඟ (බහැ 50[21]).

අවිතරාග (ගී)=පහ නොවූ රාගය ඇති.

අවු= 1. අංතපය; නිරුළුලිය (බහැ 54[3]). 2. ප්‍රභාව. 3. හාවය; විලාසය (කවි 488). 4. (ක්‍රිප)=අංහු, 'ඒ' බ. -අතු=ප්‍රධානයන් යන විට අව්ව වළකනු පිණිස දෙපසින් අල්ලපු ලබන වටකුරු අවන්අතු (G). -කැවිම්= අව්වෙන් වේලීම (කඛවි 69[3]. 85[5]. පහැ 7[20]). -කාෂවඛ†=ඉතා තද අව්ව. -ගඳ†= අව්වෙහි වියලීමෙන් ඇති වන ගන්ධය. -රඛ†=වරින් වර ඇති වන අව්ව.

අවුජ්(බහැ 2[19]. 44[1] ශිසං III 290[6] අවුජ්ජ(සී 165), අවුජ්ජු (සී 243), අවුජ්ජිනි(සී 426). } = අවුත්.

අවුව (බං)=ඇවිවිමෙනි; පෙලෙඹීමෙනි, අංශා කිරීමෙනි. අක. අවුවං, අවුවත්, ඇවිවි ඇවිටු. (නිර්බන්ධ= ඇවිවිශෙන් -ජාන82[21]).

අවුටවා (පූක්‍රි)=අංශා කරවා (බහැ 81[22]).

අවුණ (බං)= ඇවිණිමෙනි; ගෙනීමෙනි. සක. 'අමුණ (බං)' බ. (සලි 1. 4[17]. කවි 13. 84).

අවුණන=ගොතන (ජාහැ 51[17]).

අවුණු= 1. අම්මණය; ඔරුව (බහැ 102[11]. ජාහැ 104[22]). 2. අංවරණය; දිය නවත්වන අමුණුබැම්ම (බහැ 218[5]. අම 2. 125[35]). 3. අංපණය; සල්පිල (බහැ 101[24], කාගෙ 2-9). 4. ගෙතූ (රූ 442). -දෙර=සල්පිල්දොරකඩ (වි 1. 108[1-38]).

අවුතු=1. අංගනතුක (බහැ 17[3]. 26[1] ඈ). 2. අනුකම්පා; ක්‍රියාවෙන් නොකියූ(සිදත් 168[3]). 3. අංග්‍රකන්ත; ශෛද්‍ය. -බාන්=('අමුදුබාන්' බ. (පූ 1. 329[35]). [පැමිණ.

අවුන්= 1. අනුකම්පා. 2. (පූක්‍රි) (<අංගතාය?)= අවුතාන=නොකි; උකහා නොවූ.

අවුදින් (පූක්‍රි) (< අංගතාවාන?)=පැමිණ.

අවුදු(ද්) (පූක්‍රි)=අවුත්. [168[3]).

අවුන් (<අපූත්<අපපණා)= අපිණාවූ (බහැ

අවුර (බං)=ඇවිරීමෙනි. සක. අවුරං, අවුරත්; ඇවිරී, ඇවිළී, ඇවිරූ, අවුළු (කවි 712).

අවුරණ=අංවරණය කරණ.

අවුරූ=1. ප්‍රාකාරය (මුව 27. සප 201). 2. අංවරණය (සිදත් 50[4]). 3. අංබාරකය; පං තබන ප්‍රවරුව (බහැ 225[23]).

අවුරුදු=වසීය; මාස දෙළොස. -කුමාර=ලිත් ගණින්නන් විසින් කුමාරයෙකු ලෙස රූපණය කළ අභිනවවසීයක අංරම්භය. -කුරුදු†= අවුරුද්දක් තුළ එක් කාලාංක දී පමණක් පෙණෙන පක්ෂිවිශෙෂයක්. -පූජා= අවුරුදු පතා කරණ පූජාව(ශිසං III. 69[5]).

අවුර්=අංකාරය හෝ අංබාරය (ශිසං 1. 218[6]).

අවුල(බං)= 1. ඇවිලීමෙනි; කලහ කිරීමෙනි (බහැ 138[25]). අක. ඇවිලේ, ඇවිලෙන්; ඇවිලී, ඇවිලූ. 2. ඇඟිලීමෙනි, එකතු කිරීමෙනි (සලි 1. 215[21]. කාගෙ 4-19). සක. අවුලා, අවුලත්, ඇවිලී, ඇවිලූ.

අවුලනු=දබර කරණ (බහැ 138[25])

අවුලු (බං)=පවිලැවීමෙනි (දහවි 329[16]). අක. 'ඇවිලේ' ඈ.

අවුලු=1. ව්‍යඤ්ජන (ජා 75[21]). 2. රසකැවිලි (ගුත් 117). -පත්=කැවිලිවගී (සලි 1. 42[17]. සද්ධ 149[29]).

අවුල්=අංකුල; ගැවසුනු (කවි 136). -තර= ඉතා අවුල් (මිලි 142[9]). -දැති=කිඹුලා (රූ 150). -දැල්= අවුල් වූ දැල (සද්ධ 718[16]). -°බැඳුම්= දුෂ්කර පදබන්ධවිශෙෂයක් (කවි 441 බ). -පවුල්= (<අංකුලපංකුල)= අනිගණින් අංකුල (මුව 150). -විශවුල්= 1. අංකුලව්‍යංකුල. 2. කලබල. -හර=අංහරණයක්; මුඛතාංහාරවිශෙෂයක් (සද්ධ 91[24]).

අවුල්ලිනී=අවුල් වූ නැනැත්නි? (එස 83).

අවු(ව්)සද=බංෂඩ; බෙහෙත් (යෙංග 43).

අවුසේ (සිය 130)=අබිසේ?

අවුස් (බං)= 1. ඇවිසීමෙනි; වැකීමෙනි. අක. 2. අංපුවජ්ජනයෙනි; විවාරීමෙනි, බෙදීමෙනි ('ඇවිස්නා' බ). සක. අවුසි,අවුසිත්; ඇවිසි, ඇවිසි (මුව 57- අවුසි=සඤ්චරණය කෙළේ සි?. මුව 90- අවුසි=මිශ්‍ර ව?. සිඛ 84[18]- ඇවිස්සෑ=විවාරූ).

අවුස්= අංතොදැහැ; තුහීම් (ජාගැ 17[10]. -බප්‍ර 285[18]). **-බඩු**=තුහීම්භාණ්ඩ (සිඛ 7[5]. 68[20]). **-වා වැදුරුම්**= අංතොදැවැංදෑකුල ජෝෂ්ඨ යං (බෝකැ 145[11]).

අවුස්ස†(බං)= ඇවිස්සිමෙහි. සංස්. අවුස්සං අවුස්සන්; ඇවිස්සි. ඇවිස්සූ.

අවුළ (බං)= 1. ඇතිදීමෙහි; එකතු කිරීමෙහි. 2. වෙළීමෙහි; බැඳීමෙහි (බගැ 55[28]). 3. පටලැවීමෙහි (දහම් 323[9]). සංස්. අවුළං, අවුළන්; ඇවිළි, ඇවිළු. 4. ගිනි ගැණීමෙහි. අකු. ඇවිළේ, ඇවිළෙන්; ඇවිළි ඇවිළිනි; ඇවිළි, ඇවිළුනු (දහම් 338[26] -අවුළවා).

අවුළ=1. ආවරණය කළ; වැසූ. 2. ව්‍යඤ්ජනය (බගැ 75[2]). 3. කැදෑ ආදිය රැවි වීමට කන කැවිලි (බුත් 263[1]). **-පත්**=කැවිලි වර්ගී.

අවුල්පත්=කැවිලි (ශිසං I. 24[15]).

අවෙජේ?=ආවජ්ජනං කොට? (වි 4. 347[1-5]).

අවෙණික?= 1. අංවෙණික. 2. ප්‍රිය කරණ (ජා 511[28]. පා-සම්පියංයමංනං.) [සිඛ 76[4]).

අවෙන්වා=ආදීනව (බගැ 10[17]. 30[12]. 33[22].

අවෙය (ශිසං IV. 282[10])?.

අවෙස්=අංවෙශය; වැඟීම (පරෙවි 169).

අවෙහිමින් (නෛස්ත්‍රි)=පිරික්සමින් (සී 321).

අවෙක්ඛක=බලන.

අවෙක්ඛණ=බැලීම; සැලකීම.

අවෙත්‍යප්‍රසාද=ගුණ දැන පැහැදීම (බප්‍ර 171[3]).

අවෙදයිත=ඇස් ආදියෙන් විඳුනය නොකළ.

අවේදී=නොං දන හැකි; දනගැණීමට අමාරු.

අවෙහඩ්ඛිය=නොං බෙදිය යුතු.

අවේලා=නුසුදුසු අවසාංව.

අවෛර (ති)=විරෝධීන් හෝ පංපඛම් නැති (වි 3. 5[2-12]). **-සභාග**=වෛරී නුවූ සමානයා හෝ එක් ව කවයුතු කළ හැකි පුද්ගලයං (කඛවි 39[21]).

අවෛවචනික= පෙරළීමක් හෝ වෙනස් වීමක් නැති (බප්‍ර 184[23]). [ඉගු?

අවෝ(කඛවි 127[23]. පා- ඔමසති)='අත ඔවං'

අවොසුතුව (බගැ 78[23])='අවං ඝතුව' ඉගු?

අව්‍යාකත= 1. අප්‍රකව. 2. නුගත්. අදක්ෂ. 3. (සාඛ්‍යමතයෙහි) සියලු දෙයට මූලික හෙතුව වූ රූපාදියෙන් තොර වක්‍ෂුරාදියට හොවර තොවන ශක්තිවිශෙෂය. 4. (වෙදනාතමතයෙහි) සූක්ෂ්මශරීරවත් ඉඹ්මය. **-නාද**= අකුරුවලින් ලියං දක්වියහොඟකි අත්පොළසන් ආදි ශබ්ද (පසං 244[22]). **-ශබ්ද**= 1. අව්‍යකතනාදය. 2. ව්‍යාකරණානුකූල නුවූ ශබ්දය.

අව්‍යතික්‍රමශීල=ඒ ඒ පාපඛම්යන් නො කිරීම් වශයෙන් පවත්නා චිත්තචෛතසිකයන්ගේ මනා වූ සවභාවය (වි 1. 198[2-9]).

අව්‍යග්‍රතා=නොයෙක් අදහස් නැතිබව; සිත එකඟබව (ජාස 175[1]).

අව්‍යපෙත=වෙන් නොකළ; ඈත් නුවූ. **-යමක**= ශබ්දලඛ්කාරයක්.

අව්‍යභිචාර=1. අවිඝටනය. 2. විකල්පයක් නැති (පඤ්චි 106[22]). **-නියම**= එකකින් අනෙක වෙන් ව නොං පැවැත්ම නාමැති නියමය සවභාවික සම්බන්ධය; සාධ්‍යසාධන දෙක්හි සහචරභාවය.

අව්‍යභිචාරී= 1. කිසිම විරුද්ධහෙතුවකින් වැළැක්විය නොහැකි; වෙන් ව නොං පවතින. 2. සාධ්‍යසාධනයන් හා සම්බන්ධ ව පවත්නා හෙතුව (න්‍යාය 103[14]).

අව්‍යය=1. වැය නොවන. 2. වරනැඟිය නොහැකි නිපාත හා උපසර්ග. **-සමාස**='අව්‍යය සමස්' බ.

අව්‍යයීභාවසමාස=අනව්‍යය වූ නාමපදයන් අව්‍යයත්වයට පැමිණීමට හෙතු වන සමාසය.

අව්‍යවස්ථාන=ස්ථිර ව නොං සිටින.

අව්‍යවහිත=අතරක් නැති; අනන්තර; ඒ එක්ක ම තිබෙන (පඤ්චි 26[24]).

අව්‍යාකෘත= කුශලාකුශලවශයෙන් ප්‍රකාශ නොං කළ විපාකචිත්ත හා ක්‍රියාචිත්ත (අභි 16[19]). **-ව්‍යානාව්‍යාකෘත**=අව්‍යාකෘතචිත්තයන්හි යෙදෙන ව්‍යානාව්‍යාකෘත වූ චිත්තක්ෂොභය (අභි වි 429[3]). **-මූල**=ක්‍රියාචිත්තයන්ට මුල් වන අලොභාදිචෛතසික තුණ. **-ස්පර්ශී**=අව්‍යාකෘතචිත්තයන්හි යෙදෙන ස්පර්ශාදිචෛතසිකය (අභිවි 116[22]). **-හෙතු**=ක්‍රියාචිත්තයන් ඉපදීමට හෙතු වන අලොභාදිය (අභි 45[17]).

අව්‍යාපාද=අක්‍රොධය; මෙෂ නොං කිරීම. **-බාහූ**=සවභාවධර්මමාත්‍රයක් වූ අව්‍යාපාදය. **-චිත්තී**, **-ඝඩිකල්ප**=අව්‍යාපාදය පිළිබඳ කල්පකාංව,

අව්‍යාප්ති=1. නො පැතිරීම. 2. සාධ්‍යවස්තූන් ගෙන් එක් කොටසක සාධනය නො පැතිරීම.

අව්‍යුත්පන්න=1. අවයවවගයෙන් බෙදූ අර්ථ අවබෝධ නො කට හැකි ශබ්දය. 2. ශබ්දාර්ථ නොදන්නා අය (පඤ්චි 92[32]). -ජන=සුගත් ජනයා (පසා 2[32]).

අව්වස්සේ(<අනුඅස්සේ<අනුඅස්සේ)(නාම)† =අනතුරුවෙනි. 'අනුහස්සේ' බ.

අවිසදකෘපැන්= ඕෂධසමපත්තිය; සුදුසු බෙහෙත් නිසි සේ ලැබීම (සෝ 48).

අනක්ඛ=අසමර්ථ (බප්‍ර 315[14]). [මර්ථ්‍යය.

අශක්‍යති=1. ශක්තිය නැති(දහම් 173[17]). 2.අසා

අශක්‍ය=නො හැකි (බප්‍ර 83[35]). -උපාය=නො හැකි වන උපාය (පඤ්චි 15[20]).

අෂණි=1. හොඳ්නය; කෑම (බප්‍ර 81[25]).

අෂණායං=බඩගින්න.

අෂණි=හෙන (සර 333[4]). -ඝොෂ=හෙනහඬ (බප්‍ර 68[13]). -පාත=හෙන හැසීම. -ප්‍රහාර=හෙනපහර. -මණ්ඩල=වක්‍රාකාර වූ හෙන පහර. -වාත=හෙනපිපුරුම් සහිත සුනාවුව. -ශබ්ද=හෙන හඬ.

අශබල=කැලැල් හෝ කබර නැති(බප්‍ර124[10]).

අෂරණ=පිහිටක් නැති; බැහැපත්.

අෂරීර=ශරීරයක් නැති. [නැති.

අෂඝ්‍ර=1. ඇඟුබ නොවන දෙය. 2. ඇඟුබ

අෂාෂ්වත=සදකාලික නොවන.

අෂික්ෂිත=නො හික්මුනු.

අෂිත=අනුභව කළ.

අෂිව=1. අයහපත. 2. අමොඝය. [සූත්‍රීයා.

අෂිශිර=සිහිල් නොං වූ; උෂණ. -කිරණ=

අෂිෂ්ට-ශිෂ්ට නොවූ; නො හික්මුනු. -සෙවා= අශිෂ්ටයන් සෙවනය කිරීම.

අෂිනි=අසූව; 80. -අනුව්‍යඤ්ජන=මහාපුරුෂ ලක්ෂණයන්ට අනු ව ලක්ෂණ ප්‍රකාශ කරණ කුඩා ලකුණු අසූව (බප්‍ර13[3]. බුත් 243). -මහාශ්‍රාවක=බුදුරජාණන් වහන්සේගේ ප්‍රධාන ශ්‍රාවක වූ අසූ නම (බුත් 68—76 බ.

අෂුචි=අපවිත්‍ර. -භූමි=අපවිත්‍ර දෙය තිබෙන සථානය. -මහානරක=අශුචියෙන් පිරුණු මහනිරය (බුත් 163[21]).

අෂුද්ධ= අපිරිසිදු. -අනුවර්තක=අශුද්ධපුද්ගල යන් අනු ව පවතින(නික්ා11[23]. සර295[22]).

අෂුද්ධිමාර්ග=ශුද්ධියට හෙවත් නිවණට මාර්ග නො වූ හොඹලිංදි ප්‍රතිපත්ති(වි 7.521-[29]).

අෂුන=1. යහපත් නොවන. 2. පිළිකුල් වශ යෙන් අයහපත් ව වැවහෙන උද්ඛුම්මාත කාදි අරමුණු දහය. -අනුදර්ශන=අශුභයන් නැවත නැවත දක්ම හෝ සැලකීම; නමාගේ ශරීරය ද අශුභ සේ සැලකීම. -අනුස්මෘති= අශුභයන් නැවත නැවත සිහි කිරීම. -ආහාර= අශුභනිමිත්ත (වි 2. 907[1-4]). -කර්මස්ථාන= භාවනාකර්මයට ආධාර කර ගණු ලබන උද්ඛුම්මාතකාදි දශවිධ අශුභ (විස 11[5]). -ධ්‍යාන=අශුභයන් අරමුණු කොට ඉපදවූ ධ්‍යානය. -නිමිත්ත= අශුභ වූ උද්ඛුම්මාතකාදිය. -භාවනා=දශඅශුභ යන් භාවනා කිරීම. -මනස්කාර=අශුභයන් මෙනෙහි කිරීම.

අෂුන්‍ය=නිස් නො වූ.-අසඞ්ඛ්‍ය=බුද්ධාදි උත්තම යන්ගේ ඉපදීමෙන් නිස් නොවූ අසඞ්ඛ්‍ය කල්පය (සද්ධ 333[3]).-කල්ප=බුද්ධාදීන්ගෙන් නිස් නොවූ පඤ්චවිධ කල්ප (සර 229[30]).

අශෛෂ=ඉතිරියක් නැති; පිරිපුන්; සියලු.

අශෛක්ෂ=නික්මී අවසන් හෙයින් නොහික්මෙන රහතුන් වහන්සේ. -ඥාන=අර්හත් ඵලඥානය.-ධර්ම=රහතුන්ට අයත් සම්‍යක්ත්ව ධර්මදශය (බුත් 28[30]. බුත්. ගැවපදගෙහි විසතර). -ධර්මස්කන්ධ=අශෛක්ෂයන්ට අයත් ශීල, සමාධි, ප්‍රඥා, විමුක්ති, විමුක්තිඥානදර්ශන යන ධර්මරාශි පහ (සලී 1. 185[15]). -ප්‍රතිපද= අශෛක්ෂයන්ගේ ප්‍රතිපත්තිය. -ප්‍රභේද=අශ්‍රාවකාදිවශයෙන් වන ක්ෂීණාශ්‍රවයන්ගේ කොටස්.-භූමි=අර්හත්මාර්ගඵල (අමා 2. 99[6]). -රත්න=ශ්‍රේෂ්ඨ වූ අශෛක්ෂයා (බදූ43[13]). -ශීල=රහතුන්ගේ ශීලය (වි 1. 581-[10]).

අශොක=1. ශොක නැති. 2. හෝපලු. 3 රස දිය. 4. බමාශොක රජ. -අක්ෂර=බමාශොක රජුගේ ශිලාලේඛනයන්හි තිබෙන අකුරු. -අඞ්කුර=හෝපලුදලුව.

අශෝභන=නො ශොබනා. -හේතු=අයහපත් හෙතු වූ කෙලස. [නො හැකි (දහම් 85[1]).

අශෝභ්‍ය=විශලීය නො හැකි; අවසන් කළ අස්ම=ගල්. -පුෂ්ප=1. ගල්මල්. 2. කප්පරවල් ලිය. -භිද්, -භේදෘ=පහරණ බෙහෙ; පොල්පලා,

අස්මිං=මූතුංයංයෙහි සැදෙන ගල්. -ඝණ=ලුණුවරණ.

අශ්‍ර=කොණ; පැත්ත.

අශ්‍රද්ධ=ශ්‍රද්ධාරහිත (සර 66[23]).

අශ්‍රමණ=ශ්‍රමණ නොවූ.

අශ්‍රාද්ධ=ශ්‍රද්ධාව නැති (සර 262[11]).

අශ්‍රී=කාලකණ්ණිය (ජාස 82[19]). -ක=1. කාල කණ්ණි. 2. ශොභා රහිත; විරූපි. -°මේඝෙහ=පහත් වැඩ (සවි 13[35]).

අශ්‍රු=කදුළු. -පාත=කදුළු හෙලීම.

අශ්‍රුත=1. නො අසූ. 2. ශාස්ත්‍ර නො දත්. -පුබ්බ=නොඅසූ විරූ. -වන්=අසූ පිරූ තැන් නැති; සුගත. -ව්‍යාඛ්‍යාන=සුගතයාගේ අරුත්විවරණ (පඤ්චි 118[15]). [ශ්‍රාමණ්‍යකථා.

අශ්ලීල=අසුවන්ට ලජ්ජාදිය ඇති කරණ

අශ්ව=තුරඟ. -අධිප=නිදහස් වූ අශ්වයා. -අලඞ්කාර=අශ්වයන්ගේ ඇදුම්. -ආවාහි, -ආවාහිත=අශ්වයන් හික්මවන්නා(දජා 205[3]). -ආරොහක=1. අසුන් පිට නැගෙන්නා. 2. අසුන් හික්මවන්නා. -°ඛම=අසුන් දම නය කිරීම (මනි 49[29]). -ආරොහණ=අසුන් හික්මවීම; සිවුසැටකලාවන්ගෙන් එකක් (සඩ 88[8]. පූ 2. 147[16]). -ඛණ්ඩ=1. මහා මෙරුව අවට තිබෙනැති සැලකෙන පවිත්‍ර යන්ගෙන් එකක්. 2. මුරුත (සැළ 36); ඔෙලමුරුත(ජාස 94[13]). -ඝණ්ඨා=අමුක්කරා. -තර=වෙළෙඹගේ තුසෙහි කොටඑවාට දැව උපන් අශ්වයා(බගැ 74[31].ජාස 42[19]). -දම්ය=අශ්වයන් දමනය කරන්නා (විමු 80[18]). -දම්‍යසාරථි=අශ්වදමකයා(බප්‍ර 226[31]). -පාල=අස්එඬේරා (වි 4. 213[1-16]). -පුර=දඹදිව ශ්‍රීමහාබොධියට දකුණුදෙසින් පිහිටි නගරයක් (පූ 2. 106[8]). -පොතක=අස්පැටියා. -බන්ධ=අසුන් රැක බලා ගන්නා (ජා 29[24]). -බල=නවීනශිල්පීන් විසින් යන්තුයන්ගේ වෙගය මැනීම සඳහා යෙදෙන මිම්ම; තත් පරයක දී රාත්තල් 550 ක් අඩියක් උසට එසෙවීමට අවශ්‍ය ශක්තිය. -මණ්ඩල=දූවිලිය; රේස්පිට්ටනිය (ජාස 77[27]). -මාරක=කණේරු. -මුඛ=1. අශ්වයාගේ මුඛය. 2. එවැනි මුඛය ඇති කින්නරවිශේෂය. 3. අනව තප්තවිලෙහි මුඛ සතරින් එකක්. -මුත්‍ත=අශ්වරූපාකාරමුතුවෙසෙසක්(ස්තූ 109[6]). -මේඛ=ප්‍රධානවයඥයෙන් අශ්වයෙකු මරා කරණු ලබන මහායාගය. -ශාන, -ශානා(පූ 2. 241[1])=යුද්ධ උපකාර වන අශ්වයා. -රත්න=සක්විතිරජුන්ගේ සප්තවිධරත්නයන්ගෙන් එකක් වූ ශ්‍රේෂ්ඨඅශ්වයා. -රථ=අශ්වයා බැඳි රථය. -වාහන=වාහනයා වූ අශ්වයා. -ශාලා=අශ්වයන් බඳින ශාලාව. -සෙනා=චතුරඞ්ගිනී සෙනාවෙහි එක් අඞ්ගයක් වූ අශ්වසමූහය.

අශ්වඝෝෂ=අැසතුගස.

අශ්විනී=1. අස්විද නැකත. 2. සූර්‍යභාර්‍යාවට වූ අස්වෙළෙඹවෙස් ගත් සංඥාදේවිය. -කුමාර, -පුත්‍ර=අශ්විනියගේ පුත්‍ර වූ දෙවි වෙද්දු දෙදෙන.

අෂ්ට=අට. -අක්ඛණ දෙසනා=අෂ්ටදුෂ්ටක්ෂණයන් දෙසනා කිරීම. -ආපණ=ප්‍රසිද්ධ ආපණ, ගණිං, ඵලං, අගදං, මාංසාදිං, අමෘතං, රත්නං, හෙම් යන සල්පිල් අට. -ඖෂධි=නාරද, බඹුනතරි, අඹ්බිරස, කපිල, කණාදි, අගතිසොම, අතුල, ධන්වන්තාර්‍යයන යන වෛද්‍යශාස්ත්‍රප්‍රසිද්ධ ඍෂිවරු අට දෙන. -කණ්ණී=මහාබ්‍රහ්මයා. -කුලදුෂණ=කුලයන්ගේ ශ්‍රද්ධාව දූෂණය වීමට හෙතු වන ප්‍රාණඝාත, අදත්තාදාන, කාමේසුමිච්ඡාචාර, මුසාවාද, සුරාමේරයමද්‍යප්‍රමාදස්ථාන, වෙණු යන මෙය දිම හා වෙදකම හා පනිවුඩපණත් ගෙණ යෑම ද යන අට. -ගුරුධම්ම='අෂ්ටගුරු ධම්ම' බ. -ඡුන= උදශව්‍යයාඥුදශීනා, භඞ්ගා, භයතඋපසථානඡුන, අනදිනවා, නිර්විදා, මොක්ඛුකම්‍යතාඡුන, ප්‍රතිසඛ්‍යා, සංඝාරෝපෙක්ෂාඡුන යන විදර්‍ශනාඥාන අට (වි 8. 21[1-2]). -ජ්වර=වාතජ්වර, පිත්ත, කඵ, වාතපිත්ත, වාතකඵ, පිත්තකඵ, සන්නිපාත ආගන්තුක යන ජ්වර අට. -දුෂ්ටක්ෂණ=නිර්වාණාවබෝධයට හෙතු වන විදර්‍ශනාභාවනාදිපුණ්‍යයන් නොකට හැකි දුෂ්ටඅවස්ථා වූ නිරයෙහි ඉපදීම, තිරිසන් ව, ප්‍රෙතලොකයෙහි, අරූපතලඅසංඥතල යන්හි, බුද්ධබර්ශ නැති ප්‍රත්‍යන්තයන්හි, ඉන්ද්‍රිය විකල ව, මිත්‍යාදෘෂ්ටික ව, අබුද්ධොත්පාදයෙහි ඉපදීම යන අට. -දුෂ්ටලක්ෂණ=පනිවුඩය හොඳින් ඇසීම, එය කියුවකුට ම නැවත කියා හැරවැරදි බැලීම, එය ඉගෙණීම, හිසේ තබා ගැණීම, එහි හොඳ නොහොඳ දැනීම, එය කිය යුත්තාට නිසි සේ කීම, ගැළපෙන නොගැළපෙන කරුණු පිළිබඳ දැක්ෂභාවය, කලහ නොකර

කරණ බව ඇත දූනයෙකු තුළ පිහිටිය යුතු ලක්‍ෂණ අට; -ධම්=1. සත්‍රීන් ඔනාපකාශිකාය නම් දෙවියන් කෙරෙහි ඉපදීමට හෙතු වන ධම් අට (විසතර-බප්‍ර 129[35]). 2.මහබෝසත් කෙනෙකු නියතවිවරණය ලබන අවස්ථාවෙහි යුක්ත ව සිටිය යුතු මනුෂ්‍යත්ව, පුරුෂභාව, උපනිශ්‍රයසම්පත්ති, සම්බුද්ධදර්ශන, ප්‍රව්‍රජ්‍යා, ගුණසම්පත්ති හෙවත් ධ්‍යානලාභිත්ව, අධිකාර හෙවත් බුදුන්ට දිවි පිදීම, බුදු වීමෙහි මහත් වූ කැමැත්ත ඇත ධම් අට. -°සම්මවධාන=මනුෂ්‍යත්වාදි ධම් අට එක් රැස් වීම; එයින් යුක්ත වීම (සර 5[10]. සවි 12[3]). -නාගකුල=1. අනන්ත, වාසුකි, තක්‍ෂක, කාර්කෝට, පද්ම, මහාපද්ම, සඞ්ඛපාල, ගුලික ඇත නාගරජුන්ගේ කුල අට. 2. ඓරාවතාදි හස්තිකුල අට. 'අට දිගැන්' බ. -නාථ=මහායානබෞද්ධයන් බෝසත්හු සේ සැලකූ ශිවනාථ, බ්‍රහ්ම, විෂ්ණු, ගෞරී, මන්ජුශ්‍රී, හද්‍ර, බෞද්ධ, ගණනාථ ඇත අටදෙන. -නිෂඤ්ඤදෝෂ=උතුමන් වෙත හිදගැණීම පිළිබඳ දෙෂ අට; පිටිපස හිදගැණීම, අභිමුඛයෙහි, අත්‍යාසන්නයෙහි, අතිදූරයෙහි, උඩුසුළඟෙහි, යටිසුළඟෙහි, අනාවරණයෙහි, අත්‍යවනතයෙහි හිඳ ගැණීම ඇත අට. -පද=ඍද්ධිප්‍රතිලාභය පිණිස පවත්නා ඡන්ද, චිත්ත, විරිය, වීමංසා ඇත සතර හා ඡන්දසමාධි ආදි සතර දැ ගි ඇත අට (වි 4. 233[2-21]). -පරිවාර නරජුන්= අෂ්ටමහානරකයන්ට පරිවාර වසිටින අබ්බුද, නිරබ්බුද, අබබ, අහහ, අට්ට, සොගන්ධික, උපපල, පදුම ඇත නිරය අට. -පරිෂ්කාර= 'අටපිරිකර' බ. -පරිද්=අටපිරිස් බ. -පාරාජිකා=භික්ඛුණී පාතිමොක්ඛයේ සඳහන් මෙථුනධම්මපාරාජිකා, අදින්නාදාන, මනුස්සවිග්ගහ, උත්තරිමනුස්සධම්ම, උබභතොසඞ්ඝාදිසේසිකා, පාචිත්තිය, පාටිදේසනිය, සේඛිය, අධිකරණසමථ ඇත අට. -පාසාදික=ප්‍රසාදජනක වූ රූනි, හාස, ශෝක, ක්‍රෝධ, උත්සාහ, උද්වේග, ත්‍රාසුප්සා, විස්මය ඇත කරුණු අට. -භෛරව=මහාභෛරව, සංහාර, අසිතාඞ්ග, රුරු, කාල, ක්‍රෝධ, කාමුචුඞ්ග, රුද්‍ර ඇත භෛරවයෝ අටදෙන -භොගවන්ත= ප්‍රයෝජන ඇත යුතු සුගතවිලෙපන, කාන්තා, වස්තු, නෘත්‍යගීත, තාම්බූල, අභරණපාන, ශයනාසන, ගෘහ ඇත අට (සඞ්ඛ්‍යා). -මඞ්ගල='අටමඟල' බ. (බෝගැ 60[6]). -මහාදිශානාතර= නැගෙනහිර, ගිනිකොණ, දකුණ, නිරිත, බටහිර, වයඹ, උතුර, ඉසාන ඇත මහාදිශා අට (පූ 2. 17[8]). -මහානරක='අටමහනිරය' බ. (බප්‍ර 67[31]). -මහාපුරුෂචින්තක= මහාපුරුෂ ඇත්ගේ කල්පනා කිරීම් අට (බුත් 28[10]. විසතර-බුත්. ගැටපදයෙහි). -මහාභිදර්ශනාඥාන= 'අභිඥාඥාන' බ. -මහාවිපාකචිත්ත= සොමනස්සසහගතඤ්ඤණසම්පයුක්ත අසඞ්ඛාරිකාදි කාමාවචරමහාවිපාකසිත් අට. (විසතර- අභිස 20). -මහාවිඤ්ඤ= අපරාපරොත්පත්තියෙහි කොලොම්රුක, ගරුඩභවනයෙහි ඉඹුල්, දඹදිව දඹ, පූර්වවිදේහයෙහි මහරි, අසුරභවන්හි සිත්පැළාල්, උතුරු කුරුදිවසිනෙහි කප්, තව්තිසාදෙව්ලොව පරසතු, නාලොව කඩුපුල් ඇත රුක් අට. -මහාභිඥා=ඍද්ධිබලයෙන් ඇති වන අණිමා ලඝිමා, ප්‍රාප්ති, ප්‍රාකාම්‍ය, මහිමා, ඊෂිතා, වශිතා, යත්‍රකාමාවසායිතා ඇත කරුණු අට. -මාණ්ඩඛ=අණ්ඩීමාණ්ඩියෙහි අවශ්‍ය වූ සම්‍යග්දෘෂ්ටි ආදි අට. -මිථ්‍යාමාණ්ඩ= මිථ්‍යාදෘෂ්ටි, මිථ්‍යාසඞ්කල්පාදි අටවැදෑරුම් මිථ්‍යාමාණ්ඩය. -මුඛ=දෙවනපැතිස්ර්ජුගේ කාලයෙහි ඇති වූ භයමුතු, ඉජ්, රිඟ්, ඇඹුලුල්, වළලු, මුදු, කුඹුක්, පියෙවි ඇත මුතු ජාති අට (සද්ධ 339[31]). -මුත්තිහි= 1. ඊශ්වරයා. 2. ඔහුගේ මූර්ත්තිසේ සැලකෙන ආකාශ,වායු, අග්නි, ජල, පෘථිවී, චන්ද්‍ර, සූර්ය්, යජමාන ඇත අට. -යෝනි=නකුල ආදි ජාති අට. 'අඹතල ඇවග' බ. -ලෝකධර්ම= ලාභ, අලාභ, යශස්, අයශස්, නින්ද, ප්‍රශංසා, සුඛ, දුඃඛ ඇත ලොකසඞ්ගාව අට (ජාස 205[33]). -ලෝහ=රන්, රිදී, තඹ, පිත්තල, තුත්තනාගම්, ඊයම්, යකඩ, වාණේ ඇත ලෝහජාති අට. -වඩ්ඪකමාණ්ඩ්‍ය=අටතැන කින් වක් වූ මැණික. -වර='අටවර' බ. -වර්ග=වෛද්‍යපොත්හි සඳහන් ජීවක, ඍෂභක, මේද, මහාමේද, කාකොලී, ක්ෂීරකාකොලී, ඍද්ධි, වෘද්ධි ඇත ලූලිහ ඖෂධ අට. -විඤ්ඤාණඨිතා=සංසරණයක්හි කරණ සැකසී. -විද්‍ය= විද්‍යාධිනාඥාන, මනොමය ඍද්ධි, ඍද්ධිවිධඥාන, දිව්‍යශ්‍රොත්‍ර, පරචිත්තවිජානන,

පූවේනිවාසානුස්මෘතිං, දිව්‍යචක්ෂුර්°, ආශ්‍රව ක්ෂයකර° යන ශ්‍රෙෂ්ඨගුන අට (බප්‍ර 32[7]). -විධ=අටවැදෑරුම්. -°ශාකි=මුල්ගඳ, අරටු°, පොතුරු°, සුඹුළු°, කොළ°, මල්°, ගෙඩි° යන ඔත හා සියල්ල මිශ්‍ර සවිසංහාරශාකිය දැයි යන අට. -°පාතවශී=භික්ෂූන්ට විකාල යෙහි ද වැළැදිය හැකි අඹ, දඹ, රඹ, ඇට කෙහෙල්, මී, මිදි, බොරලුදමුනු, ඔලු යන මේ ද්‍රව්‍ය මිරිකා පෙරා ගත් පැන් (ජාගැ 148[32]). -විමොක්ෂ=තමාගේ කෙශාදියෙහි නීලකසිණාදිය භාවනා කොට ධ්‍යාන උපදවා නුවණැසින් බාහිරනීලකසිණාදිය දක්න හුගේ රූපාවචරධ්‍යානය,බාහිරකසිණයන්හි පරිකර්ම කොට එහි ම ඉපදවූ රූපාවචර ධ්‍යානය, සුවිශුද්ධ වූ නීලාදිවර්ණකාන්ස්න මණ්ඩලයන්හි ම ඉපදවූ ධ්‍යානය, ආකාසා නඤ්චායතනාදි අරූපධ්‍යාන සතර ය, සංඥ වෙදයිතනිරෝධය යන විරූඪ වූ නිවරණ ධර්මයන්ගෙන් මිදීමට හා අරමණයන්හි අභිරතිවශයෙන් නිඝවයට යෑමට ද ඉවහල් වන ධර්ම අට. -චූනපද=මිලිඳුරජු නාගසෙන තෙරුන් හමු වීමට යන්ට මත්තෙන් සමා දන් ව සත්දවසක් පිරූ ගුණ අට (විසාර-මිලි 95[25]). -ශත= 1. අටක් සහිත සිය; 108. 2. අටෙන් ගුණ කළ සිය; 800. -°කාෂණා=ප්‍රභෙද 108 ක් ඇති කාෂණාව; රූපකාෂණා, ශබ්ද°, ගන්ධ° රස°, ස්ප්‍රෂ්ටව්‍ය° ධර්ම° යන කාෂණා හය කාම, භව, විභව යන වශයෙන් වැඩි වූ විට 18 කි. එය ආධ්‍යාත්මිකබාහිරවශයෙන් ගුණ වූ විට 36 ක් ද, එය කාලත්‍රයවශයෙන් ගුණ වූ විට 108 ක් ද වේ. -°කාෂණාවිවර්ජිත= 108 ක් ප්‍රභෙද ඇති කාෂණාවගේ හැසිරීම හෝ පැවැත්ම. -සංවෙගවස්තු=සංවෙගය ඉපදවීමට අඛාර වන ජාති, ජරා, ව්‍යාධි, චුති අපාය, අතීතදුඃඛ, වර්තමාන°, අනාගත°, යන කරුණු අට. -සමාපත්ති= සමවදිනු ලබන රූපාවචරධ්‍යාන සතර හා අරූපාව චරධ්‍යාන සතර දැයි යන අට. -සම්‍යක්ත්ව= ශ්‍රාවකත්ව ඇති සම්මාදිට්ඨි ආදි මාර්ගඵල අට. -හසති='අවදිහැත්' බ.

අෂ්ටක=1. අටක් ඇති. 2. මඛලාදියෙහි දිනියනු ලබන පදය අටක් ඇති ශ්ලෝක-ගාථා-පඛක්ති. -වර්ෂ=රවි ආදි සප්තාග්‍රහයන් හා ලඟනය ද යන අට පිළිබඳ වර්ෂ.

අෂ්ටම=අටවැනි.

අෂ්ටමී=අටවක්පොහොය.

අෂ්ටාංශ=පැති අටක් ඇති (බප්‍ර 73[4]).

අෂ්ටාඛ්‍යක=1. භික්ෂුණීන්ට අවවාද කිරීම සඳහා සම්මත කරණු ලබන භික්ෂූහු තුළ පිහිටිය යුතු සිල්වත් බව, බොහෝ උගත්, උභය ප්‍රාතිමොක්ෂයන් ඉතා පුහුණු, ශාසනත් වවන ඇති, භික්ෂුණීන්ට ප්‍රියමනාප°, අවවාද කිරීමෙහි සමර්ථ°, භික්ෂුණීන් හා ඔවුන් අනුප සම්පන්නාකාලයෙහි වත් ගරුකාපත්තියකට නොපැමිණියෙකු°, විසිවස් පිරුනු° යන ගුණ අට. 2. ශිලරක්ෂණයේ දී ඇති විය යුතු අඛණ්ඩතා, අවිච්ඡිදතා, අශබලතා, අකල්මාෂතා, භුජිෂ්‍යතා, විඤ්ඤූප්‍රශංසනතා, අපරාමෂතා, සමාධිසංවර්තනිකතා යන අඛ අට (බප්‍ර 124[11]).-ආයුෂ්මේද=ගාලා, ගාලාකා, කාශවිකිත්සා, භූතවිද්‍යා, කුමාරභෘත්‍යා, අගදතන්ත්‍ර, රසායනතන්ත්‍ර, වාජීකරණ යන අඛ අටෙන් යුත් වෛද්‍යශාස්ත්‍රය (දඋම් 7[12]. 344[1]). -ඤාන='අටඟනිස' බ. -ධර්ම= මනුෂ්‍යත්වාදි අඛ අටක් ඇති සවභාවය (පූ 2. 27[31]). -බ්‍රහ්මස්වර='අට්ඨ බඹගොස්' බ. -මාර්ග= ආශ්‍රවිඅෂ්ටාඞ්ගිකමාර්ගය. (දඋම් 31[31]). -ශීල=පොහෝදවස්නි සමාදන් වන ශීලය; 'අට්ඨසිල්' බ. -සම්මුපෙතප්‍රත්‍ය වෙක්ෂා= පිණ්ඩපාතප්‍රත්‍යවෙක්ෂාවෙහි දී ලැබෙන අඛ අට. (වි 1. 139[1-35] පටන් පෙණේ). සිවුපසය සඞ්ඛ්‍යා අෂ්ටාඞ්ඛ ප්‍රත්‍ය වෙක්ෂාව ලැබෙන පරිදි ධම්ප්‍ර. ගැටපදයෙහි 2-199 හි පෙණේ. ඒ ඒ ප්‍රත්‍යය පරිභොග යෙහි දී එහි තත්ත්වය හා එයින් ලැබෙන ප්‍රයෝජනය එක් අඛයක් ලෙස ද, සවකිය ශරීරයෙහි නත්ත්වය සැලකීම එක් අඛයක් ලෙස ද ගෙන සිවුපසයෙන් ගුණ කර අඛ අට එහි දක්වන ලදී. -සම්මුපෙතස්වර= 'අට්ඨබඹදෙගාස්' බ.

අෂ්ටාඞ්ගික= අඛ අටක් ඇති. -පෞෂධ= අඛ අටක් ඇති පෙතෙවස; අෂ්ටාඞ්ගශීලය (බප්‍ර 218[13]). -මාර්ග=ආශ්‍රවිඅෂ්ටාඞ්ගිකමාර්ගය. -මිථ්‍යාමාර්ග= මිථ්‍යාදෘෂ්ටි, °සඞ්කල්ප, °වාචා, °කර්මාන්ත, °ආජීව, °ව්‍යායාම, °සතිං °සමාධි යන අඛ අට ඇති වැරදිමග.

අෂ්ටාදශ= අටළොස; දඹඅට. -අාවේණිකබුද්ධ=‘අටළොස් බුද්ධබල’ බ. -දෙස=‘අටළොස් රට’ බ. (පූ 2. 745[7]). -පුරාණ=බ්‍රහ්ම

පුරාණ, පද්මං, විෂ්ණු°, ශිවං, භගවත්°, නාරද°,මාකණ්ඩෙඛය°,අග්නි°,භවිෂ්‍යත්°,බ්‍රහ්ම වෛවර්ත°, ලිඞ්ග°, වරාහ°, සකන්ද°, වාමන°, කූර්ම°, මත්ස්‍ය°, ගරුඩ°, බ්‍රහ්මාණ්ඩ° යන පුරාණග්‍රන්ථ අටලොස. -මහාවිදශීනා= 'අටලොස් විදශීනා' බ. -රාග=ද්‍රව්‍ය සංගීත යෙහි ඇතැම් සලකනලද රාග දහඅට (සැළ 21-පැරණි සන්නය. සංස්කෘතසංගීත යෙහි දැන් ප්‍රසිද්ධ ව නිබෙන්නේ රාග හයකි). -විද්‍යා, -ශිල්ප='අටලොස් ශිල්ප' බ. (ජාතැ 72[1]. සද්ධ 88[14]).

අෂ්ඨාපද=දූපෝරුව; ද්‍යූතපෙත.

අෂ්ඨාශරීපුද්ගල='අටඅරිපුතුල්' බ.

අෂ්ඨාශුචි (ස්තු 6[13])=අනවශ්‍යයි' ශුද්‍ය.

අෂ්ඨාංගසමන්විතාගි=අරිඅටඉගිගය (පූ 2. 6[32]).

අෂ්ඨාග්‍ර=පැතැ අටක් අැතිව; අටපට්ටම්.

අෂ්ඨාශ්‍රවඛ=අටක් අැති රාශි අව(උපා 229[34]).

අෂ්ඨොත්තරශතක=අටක් අධික සිය; 108.

අස් (ධා)= 1. ප්‍රකට කිරීමෙහි. 2. වැපිහියා ආදියෙන් තුනි කිරීමෙහි; 3. පතුරු අස් කිරීමෙහි. 4. උදැල්ලෙන් තණකොළ ආදිය ඉවිරීමෙහි. 5.නම් තැබීමෙහි(කතිකා 44[11]. සක. අසි (අස්සි), අසිත්; අැසි, අැසි (ඔහු කළ කම් ඔහු අස්සි -සිඛ 57[5]=ඔහු විසින් කළ කම්ය තෙමේ ඔහු ප්‍රකාශකෙරෙයි.= පසුකුරුසිසෑනි සකෙන කමෙමන -පාවිතනිය පාලි).

අස්=1. මුදුන්ව; 'සිල්' සටහන (කව් 222. ජා 502[31]). ආරම්භයෙහි දී රාජමුද්‍රාවෙනි හංස රූපය වූ හෙයින් මේ නම වී ය. 2. අංශය; ඵරහිස (කව් 362. අමා 2. 161[27]). 3. දිශාව (කව් 419. සැළ 63-දකුණ'ස). 4. අහස (කව් 415). 5. අශ්‍රය; පැත්ත. 6. අංශුව; ඉතා ච්කා (කිරා 3). 7. සමීපය; අද්දර (කව් 143. සර 29[24]). 8. ආශය; අදහස (කව් 320). 9. අංශාව; රැවිය (සස 136. 144) 10. ශස්‍ය (අස්වැන්න). 11. අඛ; කොටස (රැ 64). 12. වලසා (රැ 236). 13. අශ්වයා. 14. සුල (ජාතැ 132[7]). 15. මොහොත. 16. අැසිම? (බතැ 58). 17. වස්‍රය. 18. සිදුර (කාශෙ 11-35). 19. අශ්‍රු; කඳුළු (සී 97). -අඹු=වෙළෙඹ. -අරූ = අශ්වාරෝහකය (අමා 2. 72[27]). -අැණි=අශ්වසෙනාව. -ඉල (ජා 931[13])='අස්වල්' ශුද්‍ය. -ඒපැ (අසුපෑ)=ශස්‍යොත්පාදය (සලී 1. 600[29]). -ඔබන=සිල් තබන (සලී 1. 209[27]). -කටු† (උෑව)=වලන්කබල. -කඩ=1. අංසකඛය; 2. අංශුකඛණ්ඩය; රෙදි කැබැල්ල (බුත් 2[15]. සවී 2[33]). -කණ්ඩුකුඹුරු†= යංගේ කෙළ වර කැලෑ අසල පිහිටි කුඹුරු (විසතර-G). -කන්=මුරුතඟය (රැ 215). -කුඩ(ඬ)= හිනජාතික ඛලුඛක නම් අශ්වයා (සලී 1. 278[32]). -කුර= ඵලකවරෝලු (වෛව). -කූඩා†=තවලම්කූඛය. -කෙඳි=අශ්වලෝම (ශෝග 3110). -කොන්†=1. සෑනොඟැකි කුඹුරුමුල්ල. 2. ඝන්බුන්; අඛුපාඛු. -ගොඳු= අමුක්කරා. -ගොවු=අශ්වපාලයා. -තර= අශ්වතරයා (බතැ 74[36]); තරුණ අශ්වයා (රැ 346). -දම්සෑයි= අශ්වදමාසාරථියා (බතැ 74[33]). -දෙන්=වෙළෙඛ. -නැවි= නැවෙන් අශ්වයන් ගෙණ ගොස් විකුණන්නා (ථූප 19). -පත්= 'අඟස්පත්' බ. (සලී 1. 258[14]. 874[13]). -පොවු=අශ්වපෝෂකයා. -බඳන= සිල් තබන (දළ 58[27]). -බෙවි= අශ්වයන්ගේ වර්චස් (බස 151[10]). -බෙර?= අසුන් ඝනවිට ඟසන බෙර?. "අස් සැදි ලාගෙණ අස්බෙර ඇස්වා (ගස්වා?) ගෙණ අස්ගමනිනි්...ආ"(දඟම් 142[13]).-මී= වේතුඛස්ති තිබෙන මිවද වැනි දෙය (ශෝ 3521). -මුදු=හංසරූපය සහිත මුද්‍රාව; රජුගේ සිල් සටහන (සද්ධ 239[33]). -මුළු= අශ්වසමූහයා (අනා 103[12]). -රිපු, -රූපු= මීවා. -රොදු= ආවිඤ්ඡනරජ්ජුව; අඟුල අදින රැහැන (ස්තු 93[29]). -ලවණ (ශෝග 3038), -ලුණු (ශෝග 1000 අෑ)=යෙකිව ලුණු. -වසු (බතැ 250[28]), -වදු (සිධ 76[31]. සුදු 270)= අංසබන්ධකයා; පංතු පසුම්බි ආදිය ඵරෙහි එල්ලාගන්නා පටිය. -වදුපුවෙණි†= රාජාදින්ට අශ්ව කුඹුරුයායඟින් හොරෙන් අල්ලාගෙණ වඟා කරණ කුඩා කුඹුරු (G). -වනාන්= 1. මියන් ආදින්ගෙන් ගොයම රකිනු පිණිස කුඹුර අවට ශුද්ධ කර තබා ගන්නා බම්පටිය (G). 2. කුඹුරේ පැසුනු ධාන්‍ය ඇති කොටස (ශු සිං අ). -වනු=අස් වැන්න; ශස්‍යසමෘද්ධිය (කාශෙ 1-43). -වන්=ශස්‍ය වැදුනු; ශස්‍යසමෘද්ධිය ඇති (සැළ 37). -වල්, -වාල= අශ්වලෝමය (ස්තු 27[8]. ජා 931[14]). -වාහන=අශ්වවාහනය (සර 112[8]). -වැද්දිම=ශස්‍යසමෘද්ධිය කිරීම; කුඹුරු වඟා කිරීම (කතිකා 28[13]). -වැද්දුම්†= මෑත දී කුඹුරුබවට හැරවූ ඉඩම්

(G සහ ARK. 116). -ඤැනි (අස්වනු ම)= සස්‍යසමෘද්ධිය. -ඤැන්න= එනම් බෙහෙත් ද්‍රව්‍යය (වත 7. පඤ්චි 147[29]). -වෙළෙඳ= අසුන් විකුණන්නා. -වෙළෙඹි=අශ්වවෙනුව. -සද්දු (-'සද්දූ' ඉශු)='අස්සැද්' බ. (ජාගැ 38[1]). -සරම්= අශ්වශිල්පය (මනි 49[23]). -සල=අශ්වශාලාව හාර නිලධාරියා; අසුන් බලන්නා (ථූප 10[4]. දඹ 2[26]). -°ආරච්චිල= අශ්වශාලාවෙහි නිලධාරියෙක් (රාජා 54[13]) -සැද=අශ්වයස්ජාවා; අශ්වයාගේ අැදුම; සැදලය (දහම් 142[18]).-සැම්=අශ්වසාරථිය; අසුන් පුහුණු කරන්නා (නිකා 10[10]) -සෙනහ, -සෙන්=අශ්වසෙනාව. -හල= අස්ගොව්වා (සද්ධ 454[14]). -හල්=අශ්ව ශාලාව (අමා 2. 10[24]).

අස(බා)=1. ශ්‍රවණය කිරීමෙහි. 2. ප්‍රශ්න කිරීමෙහි. 3. ආඥාණය කිරීමෙහි(සලී 1. 949[11]. කාශෙ10-94.බුත් 169[22]). 4. ප්‍රකාශ කිරීමෙහි (සිව 57 අබෙ 2. අස්-බා-බ). සක. අසා අසත්; ඇසි, ඇසූ.

අස=ආසව; මත්පැන් (සී ...)

අසංඛ(ඝ)=අසඞ්ඛ්‍යය (බුදු 259).

අසංඥ= සංඥා නැති. -තල=සංඥව නැති සූක්ෂ්මතරරූපය පමණක් පවත්නා බඹ ලොව. -°ඉන්‍රියඤ්ඤ=අසංඥතලයෙහි පිළිසිඳ ගැණීම (වි 6. 203[22-23]). -භව, -සත්ත= අසංඥතලය. -සත්තකම්මජරූප= අසංඥතල යෙහි කර්මයෙන් හටගත් රූපය.

අසංඥි=සංඥාව නැති. -වාද=ආත්මය පරිකල්ප නය කර එය සංඥා නැත්තාකැයි ප්‍රකාශ කරණ මිථ්‍යාවාදය (බප්‍ර 316[14]).

අසංවර=නොහික්මීම (බප්‍ර 144[30]).

අසංඝ්කාර
අසංඝ්කාරික
}=තමා විසින් හෝ අනුන් විසින් කළ පසුබැසීම් ආදී පූර්වප්‍රයෝග නැති (අභිස 8[14]). [කළ.-බම්=නිවණ(අභිස 5[26]).

අසංසට්ඨ=ප්‍රත්‍යයාදියෙන් පිළිගෙල නො

අසක්=(බා)=සැක කිරීමෙහි. සක. අසකි, අස කිත් (බගැ 27[4])

අසක්=1. අංගඛණ්ඩාව; සැකය (කව් 26). 2. අවකුඩු; ඇස්නැති. 3. අසඞ්ඛ්‍යය.-දුමල= පෙර සිටි මහාකවියෙක් (නිකා 17[23]). -බිහිලි=සැක බහුල කොට ඇති (බගැ 77[4]).

අසංසීර=කම්පිත නොවන; නොසැලෙන.

අසඤ=සවකිය නොවන; අන්‍ය (පසං 284[4]).

අසකි=1. අසඞ්ඛ්‍ය (ගුත් 45 අබෙ). 2. අගණ්‍ය; නොගැනි (සිව 63. 231). 3. අසකාත්; නොගෙක්වර.

අසඤ්ඤුවවාරණ=එක්වරකට වඩා කිම.

අසක්නා=සැක කරණ (බගැ 27[2]).

අසඞ්කර=අම්ශ්‍ර.

අසඞ්ඛත=අසංඝඨිත; නිවණ (වි 6. 35[2-10]). -අඞ්ග=අසංඝඨිතය යන අර්ථය (විමු 233). -ධාතු= නිර්මාණධාතුව (වි 5. 303[1-33]). -පඤ්ඤත්ති= අසංඝඨිතධාතුවට කැබූ 'ඉමංඝ' යන ආදී නම්.

අසඞ්ඛාරපරිනිබ්බායි= නිරුත්සාහයෙන් ම අනීන්මාගීවෙ බැඹය කරණ අනාගාමී අංශීයා (වි 8. 298[1-13]).

අසඞ්ඛාරික=('අසංඛාරික' බ.

අසඞ්ඛ්‍යෙය්‍ය=ගිණීය නොහැකි (බප්‍ර 165[15]).

අසඞ්ඛ්‍ය= 1. මහාකල්පය සිහය (සද්ධ 33[3]). මහාකල්පය සිහක්දහ (බප්‍ර 56[11]. විසුද්ධි-ටීගැ 6[7]). 2. එකවචනාදිය නැති අව්‍යය පද (පඤ්චි 59. පසං 149[13]). 3. ගිණීය නොහැකි. -ආයුසංඛා= අසඞ්ඛ්‍යයක් ආයු ඇති. -කල්ප=මහාකල්පයකින් හතරෙන් පංගුව (සද්ධ 34[21]); අන්තරකල්ප විශේෂ (බප්‍ර 53[3]). -ගුණ=1. අසඞ්ඛ්‍යයෙන් වැඩි වීම. 2. බොහෝ ගුණ ඇති. -සමාස=අව්‍යයසමා සය (වාතනි 160[24]).

අසඞ්ඝ=1. නො ඇල්ම. 2. ඇල්ම නැති. -පූජා=නො ඇලීම පෙරදැරි කොට ඇති.

අසඞ්ඝත=නොගැළපෙන; අගුනු(පඤ්චි 27[24]).

අසංඝිතල (සද්ධ 767[9],='අසංඥතල' ඉශු.

අසඤ්ඤත්තභව
අසඤ්ඤිභව
}=අසංඥතලය.

අසඤ්ඤිවාද='අසංඥිවාද' බ. (නිකා 89).

අසඤ්ඤී='අසැණි' බ. (අමා 1. 120[3]).

අසති=සිතිය නැතිබව (කඩ්ඛා 73[25]).

අසති=පතිවූතා නොවූ ස්ත්‍රිය (ජාගැ 75[1]).

අසතු=අසතක්ත (සී 99).

අසතුවු=1. අසත්තුෂ්ටිය. 2. සතුටු නොවූ.

අසත්=1. අවිද්‍යමාන; නැති. 2. අශෝභන්. -දිවු=මිථ්‍යාදෘෂ්ටිය (රැ 97). -පුරුෂ=ගුණධර්ම යෙන් තිනවූ අශෝභන් පුරුෂයා. -°ආශ්‍රය, -°ඵලාශ්‍රය=අසත්පුරුෂයන් සෙවනය කිරීම.

-පුරුෂදාන= අශ්‍රාවක්ගේ දෙන දානය (බලු 86[27]). -ශෝ= අන්‍යාගතාසංයොගය; කාලය හෝ මාංශයන් ද්‍රව්‍යගුණක්‍රියාවන් ගෙන් අතරක් නැති සේ සම්බන්ධ වීම (සිද්ත් 71[7]). -සම්වාස, -සමාගම= නරකාදිනිසුන් හා එක් වීම. -සහවුන්=අසත්පුරුෂසහභාවනිය; නැති ගුණ ඇති සේ දැක්වීම (බහැ 55[27]).

අසත්‍ය=සත්‍ය නොවන; බොරු.

අසද්1. 'අසත්' බ. 2. අසද; අශ්‍රද්ධාව (සි). -ගුණ=1. නැති ගුණ (බලු 134[18]). 2. අශ්‍රාවක්ගේ ගුණ. -දම්, -ධම්ම(ත්)= 1. අශ්‍රාවක්ගේ ධර්ම්ය. 2. මෙවුන්දම (සළු1. 673[37]). -භාව= 1. නැතිබව. 2. නරකබව. -වසතු=නැති දෙය. -විධි=අවිද්‍යමාන විධිය.

අසද්1. අශ්‍රද්ධාව. 2. යතීන්ගේ මානය හෝ ශාසනාපූර්වික ඊර්ෂ්‍යාව (කව් 551). 3. ශ්‍රද්ධාව හෝ සෙනහස නැති (කව් 556).

අසදෘශදාන= අසමානදානය; කොසොල්රජු විසින් බුදුරජාණන් වහන්සේට පිළිගැන්වූ මහාදානයක්.

අසද්ද=අසාධ්‍ය; සුව කළ නොහැකි(යෝ 970).

අසන්1. ආසන්න; සමීප (බහැ 68[18]). 2. ආසන්න; ආවාස (ශිසං I. 46[55]). -කාරණු= ආසන්නාකාරණය; පදාසන්නය (වි 5. 170[2-12]). -නූ=සහලේනූයෝ(බහැ 11[16]). -වල්=සමීපවනය (බහැ 147[28]).

අසන= 1. කෑම (ජාහැ 50[16]). 2. මොරගස. 3. ශ්‍රවණය කරණ. 4. ආසනය. -භල්= ආසනශාලා (ශිසං 1. 255[15]).

අසනි='අශනි' බ.

අසනියමල=අර්ථනියපුෂ්ප; පිදිය යුතු මල් (කව් 180). වීපොරි (වෛව්).

අසනීප=නොසැපය; ලෙඩ (සද්ධ 643[9]).

අසන්‍ත=1. ශ්‍රවණය කරණ. 2. අදීම.

අසන්නගුණසමභාවනිච්ඡා= ගරුබුහුමන් ලැබීමේ ආශාවෙන් තමා තුළ නැති ගුණ ඇති සේ දැක්වීමේ කැමැත්ත (සළු 1.605[3]).

අසන්නනිධිසාරපරිභොග=ලදදෙය තැන්පත් කොට තබා නොවැළඳීම.

අසන්නනිධිභක්ෂි=සන්නිධි කොට පසුව භක්ෂණය නොකරණ (සිංහගං) (මිලි 511[17]).

අසද=1. භිරු. 2. සඳෙහ (=සැක) නැති. -බිඹු=සූර්‍යමණ්ඩලය (පරෙවි 100).

අසපක්ෂ= සපක්ෂයෙන් අන්‍ය වූ හෝ ඒට විරුද්ධ වූ නොහොත් එය නොවූ පදාර්ථය (න්‍යාය 20[4]). [බහැ 107[27]).

අසපි (=අසපු ම)= ආශ්‍රමය (වෙස 519.

අසපු=ආශ්‍රමපදය; ආරාමය (ජාහැ 111[9]).

අසප්පාය=1. යහපත බහුල කොට නැති; නො සැප. 2. නො සැප බව (අභිස 226[11]).

අසබඩ=සමීපය.

අසබදනි=1. දුවුසතුවු ගස. 2. අමුක්කරං.

අසබල='අශබල' බ.

අසබහුවි-අසම්භාව්‍ය; එකාන්ත සේ නො සැලකිය හැකි; අනියත (සිද්ත් 150[4]). -කිරියා='යන, කරන, හිඳෙන්' යනාදි අනියතක්‍රියා. -වදුස්=අසම්භාව්‍යය නමැති දෙය (සිද්ත් 194).

අසබ්බින්නි†=අසභ්‍ය වූ හෝ කැත බොරුව.

අසබහ(භ්‍ය)= ග්‍රාම්‍ය (සළු 2. 237[12]).

අසම=සමානයෙකු නැති. -බුර=සමාන නුවූ බුර ඇති; අසදිස (දජා 176[39]). -වාසි කාරණ=සමවායි හෙවත් එකතු නුවූ, වෙන් කළ හැකි, කාරණය හෙවත් හෙතුව; ද්‍රව්‍යයන් ඇසුරු කොට පවත්නා ගුණාදි හෙතුව. -විරින්=සියලුපාදඇත්හි සමාන ලක්ෂණ නැති විෂමවෘත්ත (එස 79). -සම= අසමයන් හා සමාන වූ (ගුත් 45).

අසමඟ (ග)=අසමග්‍ර; එකතු නුවූ; අමිත්‍ර.

අසමඤ්ඤිති†=පහත්; නීච.

අසමඤ්ඤිය=අයෝග්‍ය; නුසුදුසු (පසඳි 126[1]).

අසමත්=අසමර්ථ. [බැලීම (සළු 1. 926[12]).

අසමපෙක්ඛණ=නුවණින් යුක්ත ව නොබලා.

අසමඹන=සමාස නොකළ. -රූපඹ='ඇස් මනිලුපුල්' යනාදි රූපකාලඞ්කාර.

අසමාදානවාර=ඉටු සිවුරු අරුණු නැඟින විට අත්පස නොතුබුනෙත් නිසැකි වීය හැකි හෙයින් එය යන යන තැන්වලට ගෙණ යෑමෙන් වැළකීම ය යන කඨිනානිසංසය (සපා 820).

අසමාන=සමානයක් නැති (ගුත් 204). -ආසනික=සමානාසනික නොවන (සිබ 6[28]). -නිඃශ්‍රය=සමාන නොවන නිඃශ්‍රය හෝ දාබාර ඇති (අභිස 17[6]).

අසමීක්ෂ්‍යකාරි=පරීක්ෂාකොට නො කරණසුලු.

අසමුදාචාරප්‍රපතන=ශමථවිදර්ශනාවන්ගෙන් යථ පත් කළ නමුත්, ආශ්‍රීමාණීයෙන් නො නැසූ, උත්පත්තිධර්මතාව නො ඉක්මවූ, එහෙයින්ම ඉපදිය හැකි කෙලෙසරාශිය (වි 8. 206[3-8]).

අසමෝද(-ගම)=එනම් බෙහෙත් ද්‍රව්‍යය.

අසම්දිට්ඨ=මිථ්‍යාදෘෂ්ටිය (ඡු සිං අ).

අසම්පත්තවිසයගාහි=තමන් වෙත නොපත් අරමුණු ගන්නා චක්ඛු සොත ඝාන ඉන්ද්‍රිය දෙක (අභිවි 400[3]). [දෙක පිළිබඳ කථාව.

අසම්බද්ධප්පලාප=නොගැළපෙන නිෂ්ප්‍රයොජන

අසම්භාවිතොසමි='සඳමඬලින් විෂ මෙන් තිගේ මුඛයෙන් පරමේඝ්‍ය නිකුත් වී ය' යනාදි ලෙසින් අසම්භාවනානිෂ්ප්‍රයෝජනයෙන් සාම්‍යය දක්වන උපමාව (කාශී 2-39).

අසම්භාව්‍ය(වනිය)ක්‍රියා= නියත සේ නොසැලකිය හැකි ක්‍රියා.

අසම්භින්නසම්ඵප්පලාප=සම්පප්‍රලාප; නිෂ්ප්‍රයොජන නො ගැළපෙන කථා (ජාඝ 207[31]).

අසම්මුත්‍ථ=1. අනුත්ථාපය; නැති නොගැණීම (වි 5. 195[3-32]). 2. වරදවා තේරුම් නොගැණීම. [අනිෂ්පන්නරූප දහය.

අසම්මසනරූප = සම්මසනය නො කරණ

අසම්මුඛිත (පූ 2. 85[2])='අසම්මුඛිත' ශුද්ධ.

අසම්මොහසම්පජඤ්ඤ= යෑම් ඒම් ආදියෙහි මුළා නොවීම වැනි මනා දැනීම; ඒ ඒ ක්‍රියා චිත්තබලයෙන් මෙහෙයුනු පඨවිආදි ධාතූන්ගේ චලනමාත්‍ර මිස පරිකල්පිත ආත්මාදීන්ගේ ක්‍රියා නොවෙතැයි නුවණින් සැලකීම. [පිහිටුවීම. (වි 7. 78[1-19]).

අසම්‍යගාත්මප්‍රණිධි= තමා නොමනා සේ

අසයහ=නොඉවසිය හැකි .**-ඝාති**= අසභ්‍යඝන් ඉවසන.

අසර=1. ආවාරය (සිදත් 43[4]). 2. ආශ්‍රය; භාරය (සලී 1. 202[6]). 3. සඤ්ඩාරය; මංකීය (ථිරා 146). 4. අප්සරාව (බහැ 93[6]). 5. ආඝාතනීය (සංසිංකොා). 9. අසාරය; තද වැස්ස. 7. අසාර; නිසරු. 8. සම්පය (සී 63). **-මිණි**=පඤ්චඛාය; පා බැඳ හෝ එරමිණිය ගොතා හිඳ ගැණීම (ජාඝ 41[18]).

අසරණ=1. අනාථ. 2. අනාථභාවය (ඛාස 188. ශුත් 316). **-සරණ**=අනාථයන්ට පිහිට වන (පැර 106).

අසරිවනව්(බහැ 144[11])='අසරුවනව්' ශුද්ධ.

අසරු=1. අඝාතරෝහකගාය (ශුත් 258). 2. නිසරු.

අසරුප්=අසාරූප්‍ය; නුසුදුසු (වි 1. 266[2-19]).

අසඹ=නොසියල්ල. **-ඤ**=සියල්ල නොදන්නා. **-විෂය**=සියල්ලන්ට විෂය නොවන.

අසල්=1. අවල; නොසෙලවෙන (බහැ 120[21]). 2. පවිනය. 3. අසත්‍යන (කාගෙ 4-1). 4. ගස් වෙසෙසක්. 5. එකත්පස (රු 658). 6. නිශ්චල භාවය (රු 584). **-ක්‍රුද්**=අවලෙහසු; මහමෙර (ප්‍රාති 69). **-ඝාම්**=ආඝාත්‍යන්ත කාමිය (වි 7. 125 [2-31]). **-බඬ**= සම්පය (වදන් 60). **-වාසි, -වැසි**=සම්පයෙහි වසන.

අසව=කාමාදි ආශ්‍රව (බහැ 52[32]). [180).

අසවන්(නෙත්‍රි)=ශ්‍රවණය කරවුවොත් (නිසර

අසවල්=තමා දන්නා අලුනන, ඉදිරිපිට නැති දෙය හෝ පුද්ගලය. [උපකරණය.

අසවු=උළුවස්සට දෙර සවි කරණ ලොහොමුවය

අසංසප්පසස්=ආඝාවාසප්‍රශ්වාස (අමා 2. 34[4]).

අසහස්වත=අශාස්වත; සදකාලික නොවන (අමා 2. 176[11]).

අසහාය=1. යහළුවෙකු නැති. 2. හුදකලා; තනි (මුව 3). **-නාඝඛ**=එක ම නායක (සද්ධ 121[21]). **-මිත්‍ර**=එක ම මිතුරා (මුව 3). **-ශ්‍රී**=අසදෘශශොභාව (සර 1[28]).

අසළ= 1. ඇසුරු කළ. 2. පුහුණු කළ; උගත් (කාගෙ 5-32. පැර 66).

අසාත=නොමිහිරි. **-මන්ත්‍ර**=සත්‍රින්ගේ දෙම ප්‍රකාශකශාස්ත්‍රය (ජා 140[10]).

අසාද=අසාඛ්‍ය (යොග 661. 2775).

අසාදරණ†=අයුතු.

අසාධාරණ=සමාන නුවූ; පොදු නොවූ; උසස්. **-උපමා**='බුධය චඤ්චපද්මාදින් හා සාම්‍යය ඉක්ම තවා හා ම සමාන වෙයි' යන ලක්ෂණ අැති උපමාව (කාශී 2-37). **-ඤාන**=අන්‍යයන් හා සාධාරණ නුවූ, බුදුන්ට පමණක් නිබෙන ඉන්ද්‍රියපරෝපරියත්තඤාණ, ආසයානුසයඤාණ, යමකපාටිහීරඤාණ, මහාකරුණාසමාපත්තිඤාණ, සබ්බඤ්ඤුතඤාණ, අනාවරණඤාණ යන නුවණ සය. **-රත්න**=ශ්‍රෙෂ්ඨතම රත්නය. [නොහැකි.

අසාධ්‍ය=1. සිදු කට නොහැකි. 2. සුව කළ

අසාර=සාර නොවන; හරයක් නැති (බුදු 5).

අසාරූප=අසාරූප්‍යය; නුසුදුසුකම.

අසාරූපය=නොසරුප්; සුසුදුසු (බප 129[13]).

අසෑප=අසපපාඅ; අඅහපත් (වි 1. 455[8-6]).

අසි=1. කඩුව. 2. සත්‍රිය (රෑ 762). 3. යෙදෙහළිය (රෑ 263. 474). 4. හිනිසිළ (සිංඅ). **-ඝස්**= කඩුගැටීම (කව්665). **-ඝාතා**=අසිග්‍රාහකාඅක; රජුට කඩුව පිළිගන්වන අමාත්‍යයා (ජාගැ 151[20]). **-ග්‍රාහක**=රජුගේ කඩුව උසුලන්නා. **-බාරා**=කඩුමුවහන. **-පතර**= අසිපත්‍ර; කඩු (අමා 2. 161[15]). **-පත්**=කඩුව (මුව 42). **-පනුවන**=කඩු වැනි මුවහත් ඇති කොළ ෘහින ඟස්වලින් යුත් නිරයක් (බප 76[28]. මනි 32[26]). **-පාස**=කඩුවෙන් හා පාසඇතින් ද යුදු නොහොත් ක්‍රීඩා කළ පෙර සිටි මනුෂ්‍ය ගණයක් (විලි 218[3]). **-මාලඛ**=වධ්‍යයා උඩ දමා උඩ දීම කඩුවෙන් ඛපා පෙති ගැසීම (ජාගැ 190[10]). **-ලිඛ**=වැලක් සේ දික් වූ කඩුව (සිදත් 210). **-ලොම**=කඩු වැනි ලොම් ඇති නිරිසතුන් පැසෙන නරකයක් (මනි 484). **-සූණා**=මස් කපන පිහිඅ හා කැපීමට මස් තබන පුවරුකඩ.

අසික්කිත†=අසිඤ්ඡන; නොහික්මුනු.

අසිත=1. සුදු නොවූ; නිල් (කෝ 238). 2. සෙනසුරා.

අසින්=සින් නැති. [(දළ 916).

අසිදුහත්=අසිඛ්‍රාහීන්; සිඳ නොවූ අදහස් ඇති

අසිද්ධහෙතුකාභාඅ= පක්‍ෂාඅ හා සම්බන්ධ වීම සිද්ධ නොවූ නොහොත් සැක සහිත වූ වැරදි හෙතුව (නාඅ 953).

අසින්=පැහැර ගත්. [174[27]).

අසිදියැවි= කොල්ලකෑමට කැමැති (ඛගැ

අසිදු (ඛා)=1. උදුරා ගැණීමෙහි (සිඛ 36). 2. ඇහිද ගැණීමෙහි (බුත් 216[6]). සඤ. අසිදි, අසිදින්; ඇසිදි, ඇසිදි, අසින්.

අසිදුනා= 1. පැහැරගන්නා (ඛගැ 27[24]). 2. ඇහිඳීම (කව් 82).

අසිඅ (නි)=නිතර (රෑ 46).

අසිරි= 1. අශ්‍රිඅ (තිසර 682). 2. ආශ්චර්‍යඅ (ඛගැ 23[25]). **-ලුවම**=ආශ්චර්‍යවත්වසතුවක් හා සමාන කිරීම (සිඅ 91). **-මත්**=ආශ්චර්‍යවත් (දළ 25[7]). **-විස්ම**= ආශ්චර්‍යවිස්මඅ; ඉතා පුදුමඅ (වෙස 201).

අසිරිරු=ශරීර නැත්තා; අනඞ්ගඅ (රෑ 23).

අසි-වස්, -වැස්, -විස=සඅියා; නාඅ (බප 144[16]. රෑ 129).

අසිසිර='අසිසිර' බ.

අසිහි=සිහිනැති; අවඤ්ඤ (වි 7. 266[14]).

අසිහි=අසුව. **-වාන කසිල**=වාතරෝගනාශක තෙලක් (ඉංග 2985).

අසිරූ†=අමාරු. [නරකයක් (මනි 54[14]).

අසිසකුනරක=හිස්නැති නිරිසතුන් පැසෙන

අසු=1. අතර; සිදුරු (දජා 303[26]). 2. ඛඩ්ග වූ (තිසර 53). 3. ප්‍රකට වූ. 4. අල්ලාගන්නා ලද. 5. අහුගඅ (වෙස 342). 6. මුරුනගඅ (ජාගැ 135[8]). 7. අසුඅාව (සී 448). 8. ඇතු ළත්; අඛංගු. 9. ආශ්‍රව (ඛගැ 154[15]. 161[28]) (අසුන්ට අසු? ලඅා සුඛිඅට වන්නාඅු- දඹ 61). **-අස්සේ** (නාඅ)= අතරතුරෙහි. **-පක්**=අහුගෙඹි (වි 2. 913[2-13]).

අසුඅඞ්සේ (ජා 316[34]) –'අසුඅස්සේ' ඉසු.

අසුචි=1. අපවිත්‍ර; 2. වර්වස්. **-නරක**=වර්වස් පිරුණු නිරඅ (බුත් 33[24]).

අසුද්ද=අශුද්ධ (ඉංග 1198).

අසුඛ=ශුද්ධ නොවූ; අපිරිසිදු.

අසුන්=1. අාසනඅ; හිඳගන්නා ඇුඳ පුටුඅාදිඅ. 2. ශාසනඅ; පනිවුඩඅ; සන්දෙශඅ (සලී 1. 199[18]). 3. ඇත්පිටෙහි ඉඳගන්නා තැන (රෑ 343). 4. රජුන් යුදු සඳහා තමන් බලවත් වන තෙක් බලාපොරොත්තුව හිඳීම (රෑ334). 5. වසඅඅ; අඳනඅ. 'අසුන්කන්' බ. 6. අවතීර්ණ; සොරුන් පැහැරගත් (පඟැ46[25]. කුදු 389–14). **-ඇදි, -කැදි**=ශාසනඝාරියා (රෑ 644). **-කන්**=අඳනයේ කෙළවර; 'හසුන් කන්' බ. (සලී 1. 847[34]). **-සිවිදි**=සොරුන් පැහැරගත් සිවුරු ඇති (සිඛ 35[10]). **-සල්, -හල්**=අාසනශාලාව (සලී 1. 126[24]).

අසුපෑවත්= (අස්< සඤ්ඤ; උපෑ< උපාඅ; වත්< වන්තු)= ඉසෙයාඅතපාඅදඅෙන් වන වසතුව; අස්වැන්න; බාඅාය (සලී 1. 182[7]). 'අස්+උපෑ' බ.

අසුබ=ශුභ නොවන; අඅහපත් (ගුත් 297). **-කම්මට්ඨාන**= අශුභකම්සථාන. **-නිමිත්**= අශුභනිමිත්ත.

අසුබු=අශුභ (කව් 74).

අසුභ=‘අශුභ’ බ. **-කම්ඵන්**=අශුභකම්සථානය. **-අනුපස්සනා**= අශුභානුදර්ශනය. **-මනසිකාර**=අශුභමනස්කාරය.

අසුමස්සේ (සලී 2. 912[32])=‘අසුවස්සේ’ ශුද්ර.

අසුවස්සේ (නාප)=අසුවස්සේ; අව්වස්සේ.

අසුර (බා)=ඇසිරීමෙහි. සක. අසුර; අසුරන්; ඇසිරී, ඇසිරූ. ‘අසුර (බා,)’ බ.

අසුර= දෙවියන්ට විරුද්ධ වූ පූර්වදෙවයෝ. **-ආවාසත්ථ, -ඇජ්ජර, -ඇදුරු**= අසුරයන්ගේ ආවාසස්ථානය; සිඟුරා. **-ඉඳු, -ඉන්ද්‍ර**=වෙප චිත්ති නම් අසුරරජ. **-කා, -කාය**=කාල කඤ්ජක නම් ප්‍රේතලෝකය (බපු 117[20]). **-කුරු**=සිඟුරා. **-නිකාය**=කාලකඤ්ජක නම් ප්‍රේතලෝකය (සවී 14[10]). **-පුර**= අසුර ලෝකය. **-භවන**=අසුර නම් දෙවඝතූන් වසන, මහමෙරපත්ලෙහි තිබෙන, දෙවි ලොව මෙන් රම්‍යලෝකය. **-මාතා**=අසුර යන්ගේ ආදිම මව සේ සැලකෙන දිති නම් නැනැත්තිය. **-යොනි**=කාලකඤ්ජක නම් ප්‍රේතජාතිය (පූ 2. 57[24]). **-රජ**= සිඟුරා (රූ 68). **-සිසු, -රූපු**=1. ශක්‍රයා. 2. විෂ්ණු. **-සමර**=අසුරයුද්ධය (බපු 120[7]).

අසුරූ(බා)=ආශ්‍රය කිරීමෙහි. අක (හෝ) සක. ඇසිරේ, ඇසිරෙත්; ඇසිරිණි, අසළු; ඇසිරුණු, අසළු.

අසුරූ=1. අසුර; ඒව (යොග 574. ස්තු 50[2]). 2. එකතු කළ මහපවුරිගිලි දබරිගිලි මැදි ගිලි යන තුණ (බගැ 174[5]). 3. මහපවුරිගිල්ල හා දබරිගිල්ල එකට ගැසීම (කාගෙ 12-2). 4. ඒ ඇඟිලි දෙක ගැසීමට යන කාලය (වි 8. 272[1-22]). **-මිවි**=අසුරට හෝ ඇඟිලි තුණට අසු වන ප්‍රමාණය (සලී 1. 606[25]). **-ලහළු (අසරූ ලහළු?)**= අශ්වා රෝහකයාට දිය යුතු කැවුම්? “ගෙයි පිසූ අසුරුලහළු ගෙණ” (ජා 521[18])= “සරෙ පක්කපුවං ව ආදාය” (ජා අ ක 3-7). **-සන්**= අසුරෙන් කරණ සැනය ගෙවත් බඩ.

අසුරෝදු=‘අස්රෝදු’ බ. (සද්ධ 333[16]).

අසුරෝඹ්†=සුරඹ්බෙනුව; හිතූ පැතූ දෙය දෙන බෙනුව.

අසුවල්=‘අසවල්’ බ. (සඟ 48[9]. පූ 2. 55[6]).

අසුවස්සේ=‘අව්වස්සේ’ බ. (සලී 1. 912[7]).

අසූ=1. දහය අටෙන් ගුණ කළ විට ලැබෙන ගණන, 2. අසූ වූ; බැදුනු (කෝ 129). **-අනුබ්‍යඤ්ජන, -අනුබ්‍යඤ්ජනූන්**= අශීත්‍යනුබ්‍යඤ්ජන. **-නාවසිත්**= සුගලාංඝලාදි සිත් අසූනවය (විසුද්ධි-අනි ප 36). **-මහඤ්ඤුවත්**= වුල්ලවගඝයෙහි පැණුවූ නහිජ්ඣිගාදි ඒ ඒ කම් කළ කාලයෙහි ද පරිවාසාදිකාලයෙහි ද පිරිය යුතු වූ ඛත් අසූව (ජාගැ 104[13]). **-මහසඤ්ඤ**=‘අශීතිමහාශ්‍රාවක’ බ.

අසූයා=ඊර්ෂ්‍යාව. [(යොග 3781).

අසෘග්දර= රක්තප්‍රදර (=මාලේ) රොගය

අසෙ=අශ්වයා සත්‍රිය (රූ 263).

අසෙක=අසෙකඩ (රූ 322).

අසෙකි?=අසඛ්‍ය (ගුත් 45).

අසෙඛඤ්ඤානි=අශීත්‍යඵලසථායං (ජාගැ 2387).

අසෙන?=අශනිය (රූ 57).

අසෙනිය= 1. අර්වනීය. 2. විපොරි (වෙව). **-සුම්, -මල්**=අසනිගමල් (කාගෙ 6-16. ගුත් 231).

අසෙඛි= 1. අශේඛ, අදක්ෂ (බගැ 147[3]). 2. අසෙඛ; රහතුන් වහන්සේ (බගැ 59[27]). **-ඛම්ඛඤ්ඤ**=රහතුන්ට අයත් ශීලාදි පඤ්චවිධ ධර්ම රාශිය.

අසෙස්=අශෙෂ; සියලු (රූ 431).

අසේ=‘අසෙති’ බ.

අසෙඛ=අශෛක්ෂයා.

අසෙඛ්‍ය?=අසෙඛයන්ට අයත් (දහම් 293[16]).

අසෙවනාය=මිනිරි කිරීම පිණිස අමුතුදෙය ඉසිමක් නැති; සවභාවයෙන් ම මිනිරි වූ (වි 2. 968[1-20]).

අසේනි= 1. අශේනිය; වෙහෙස (හංස 151). 2. වෙහෙසුනු(ජා 374[27]. 1101[9]). [(206[37]).

අසේනිය=අවෙතනික; වෙතනා නැති (බගැ

අසේම=අක්ෂම; හඝසහිත (දඹ 2[11]).

අසේස=අසෙස් (හංස 179).

අසොබ(ඛ්)=අශුභ. **-අරමුණු**= අසුභාරම්මණ (බගැ 341[4]). **-කම්ඵන්**= අශුභකම්සථාන (බගැ 82[13]). **-කාය්**= අශුභකම්සථානය භාවනා කොට උපදවාගත් ධ්‍යානය (බගැ 35[3]). [3. අසවල් (සිඛ 20[10])

අසෝ=1. ශොක නැති. 2. හෝපලු (රූ 203).

අසොක=‘අශොක’ බ.

අසොහන= නොහොබනා. **-චිත්ත**= අකුසල විත්ත දෙළස හා අහෙතුකවිත්ත අටළෙස දැගී ගන සිත් තිහ.

අස්බලිත=නො පැකුලුනු; නො පවලැවුනු.

අස්වමිඤ=අඛපලම (යෙංග 290).

අඤ=විනාශය; නො පෙණී යෑම. **-අවල**= අසන්තපවිනඤ. **-අභිමුඛ**= අසතය දෙසට හැරුණු (බප්‍ර 157[31]). **-ගාමි**=අසතයට යන සුලු. **-ගිරි, -ගිරිපබ්බත** (ස්තු 24[30]). **-පථිත**= බස්නාංගිර දිග ඇතැඟි පුරාණකවීන් විසින් සැලකූ කන්ද; ඉර බැස යන තැන.

අඤාඛඤත=අසතයට ගිය.

අඤාඛඤම(න)=විනාශයට යෑම; නැති වීම.

අඤනි='ඇත, නිබේ' යන අර්ථ ඇති සංස්කෘත නිපාතයක්. **-අඤ්ඵ**= 'ඇත' යන අර්ථය. **-ආභාර**= විද්‍යමානාහාරය (වි 5. 320[2-26]). **-භව**=ඇතිබව (අභිස 24[13]). **-ප්‍රත්‍යය**=විද්‍යමාන වූ සිට අනික් විද්‍යමානධර්මයකට උපකාරී වන ධර්මය (වි 6. 166[1-25]). **-භාව**= ඇතිබව. **-ඕවසඤ**= ඇතැඟි කියනු කැමැත්ත. [(වදන් 10).

අඤතු='වේවා' යන අර්ථ ඇති සං. ක්‍රියාපදයක්

අඤඤාසිත=නො සෙවූසිත (බප්‍ර 124[32]).

අස්ඤාගා=ගිරිනිල්ල (වෙව).

අඤත්‍ර=අතුගබ.

අඤථානෙ=1. නො තැන; නුසුදුසු තැන. (පූ 2. 22[6]). 2. කරුණු රහිත (උපා 4[21]). **-භය**=කරුණු නැති ව වන බිය.

අඤි=අැට. **-ඤ සංඤ**= ශරීරය ඇටසැකිල්ල යන හැඟීම (වි 1. 84[2-39]). **-ඤඛකාල**= ඇටසැකිල්ල (බප්‍ර 146[6]). **-කල්‍යාණ**=අැට ගතපත් වීම; සුදුව සම ව අවිවර ව ගොනා තුබූ විදුරුපෙළක් සේ හොබනා දත් ඇති වීම (බප්‍ර 240[5]). **-ගත**= ඇටවලව ගිය. **-පඤ්ජර**=ඇටකුඩුව; ඇටසැකිල්ල. **-ගිළී**= 1. ඇටගස් වැනි නිස. 2. එය ඇති (බප්‍ර 12[29]). **-සඞ්ඝාත**= ඇටසැකිල්ල (වි 1. 85[1-33]).

අඤතිතපූඵ=පෙර නො සිටි (පඤවි 46[29]).

අස්න (නාප)=අසුන්+අ.

අස්නඤ්ඤ=ගම්සූරියගස (වෙව).

අඤඤාඡ්ඩ= 1. සපයී නො කළ. 2. ඡේත්තු නොවූ; නොවැසූ (බප්‍ර 213[13]).

අඤමඤ්='අපි' යන අර්ථ ඇති සං. ගබදය. **-ඤ(වඡ)බදවාච්‍ය**='අඤමඤ්' යන ශබදයෙන් කියයුතු; මම හෝ අපි.

අඤමදිඤ=අපට අයිති.

අඤමඤුඞ්ඛ= මිටියක් වැනි ගලකින් ගස්වල පොතු ගළවා ගෙණ කෑ ජීවත් වන තාපසයා (සුවි 190[7]). 'අසමඤුඞ්ඛ' බ.

අඤමඤි=අග්මරි (යෙංග 371. 2383).

අඤමිමාන='මම වෙමි' යනාදීන් සැලකීම.

අස්රය්=ආශ්‍රය (සී 240).

අස්ලිඤ=නවවැනි නැකැත.

අස්ව= 1 අශ්වයා. 2. කාමාදි ආසව (බඟැ 161[23]). **-ඤන්ද**=අමුඤ්කරා (යෙංග 3128). **-°ගත**= අශ්වගඤ්ඨාඤතය (යෙංග 838). **-°තෙල්**= අමුඤ්කරා ආදිය ගෙණ සිදිනු ලබන තෙලක් (යෙංග 2961).

අඤ-වද(බා)=අස්වැදීමෙනි; ශ්‍රද්‍යාසමාධියෙනි. අඤ. අස්වදි, අස්වදින්; අස්වනි, අස්වනු.

අස්වන්=අස්වැදුනු; බා්‍රහ්මණ හවගත්.

අඤඤපදවිග්‍රහ=සමඤාපදයෙහි නැති අන්‍ය පදයන්ගෙන් කරණු ලබන නිර්වචන ඇති (අව්‍යයීභාව) සමාසය.

අඤඤභාවනිරුඤති=සඤභාවනිරුඤතිය හෙවත් ප්‍රකෘති(=මූල)භාෂාවය යි කියනලද මාගධී භාෂාවෙන් අන්‍ය වූ භාෂා (සර 47[13]).

අස්වලඤෙහෙල්=කෙහෙල්වෙසෙසක්.

අස්වඤ (බා)= අස්වැයිමෙනි. සඤ. අස්වඤා, අස්වඤත්; අස්වැසි, අස්වැසූ.

අස්වඤතු=සැනසිම (සලී 1. 101[17]).

අස්වඤ්= 1. ආශ්වාසය; සැනසිල්ල; සුවය (බඟැ 274[31]). 2. ශ්‍රුන්‍යපරිවේජ්දය (රූ 506).

අඤඤඤ්ඨ=සුව සේ නොසිටින; දුඃඛිත.

අස්වා (ප්‍රත්‍ය)=නම් තබා (කතිකා 44[11, 14]).

අඤාමික=සාමිභෙකු නැති.

අස්වැසිලි=1. අස්වැසීම. 2. අස්වැසීමට උපකාර වන දෙය. 3. අශ්වැවීම්ණය; කඳුළු වැගිරීම (සී 340).

අස්වැසෙන=සැනසෙන (බඟැ 61[24]).

අස්විද=අග්විනි නම් පළමුවන නැකැත.

අස්විඤ=වයතැල්ල (වෙව).

අස්විසිලි?=අස්වැසිලි (ජාගැ 47[8]).

අඤෙඛ්= කැමැති සේ නො පවතින; අනුන්ට යටත්. [63[9]).

අඤඤසඤරණ=අසුන් පිට එලන ඇතිරි (සිබ

අස්සද්දු=1. අශුද්ධංව; 2. අරොචකය; වැළඳ දිය නොහැකි බව (සොභ 1145).

අසාසුද්ධිය=අශුද්ධංවට විරුද්ධ අකුසලධර්ම; නුසුදුසු තන්හි කළ පැහැදීම වැනි මිථ්‍යාදෘෂ්ටිය (වි 8. 160[2-37]).

අස්සනාත†='අස්වනාත්' බ.

අස්සනෙක (බුත් 304[23])- 'අැස්සනෙක' ශුස්ස.

අස්සම්=අත්සම්; හාරකාරයා (බෙදුදෙන්නා?) (ශිසං I. 89[34,41]).

අස්සවනාත්†='අස්වනාත්' බ. (G).

අසාසඝපස්සාස=අංගවාංසප්‍රශ්වාංස.

අස්සෑද්දු=වගා කළ; ශස්‍ය වැවූ.

අසු=අශුද්ධ; කසුළු.

අහ† (නාප)=අස් + අ (ඒ අහ=ඒ පැත්ත).

අඃ (උමන්ද 15[1])='අහඤ්' ශුස්ස.

අහම (අවද 22[21])='අහං මං' ශුස්ස.

අහංප්‍රථමතාම්='මම මම පෙරටු වෙමි'යි කියන.

අහක්(<අස් + අක්)= පැත්තක් (රාජා 25[20]).

අහඞ්කාර=අඞ්ගබරය; 'මම ශ්‍රේෂ්ඨ වෙමි' යන මානය. [අර්ථක්. -විසර්ජන=අර්ථක්‍රෙදි.

අහඩ=1. තුවාල නොකළ. 2. නො නැසූ. 3.

අහත්ථි(උඛරව)†=1. අත්‍රේනිය. 2. පිපාසාව.

අහන†=අසන. [වත් නැති ව.

අහම්බෙන්†= ඉදිසියෙන්; බලාපොරොත්තු

අහස්(නි)=ආශ්වයාසියෙනි; අහං(සී...)

අහර= 1. ආහාර; භොජන. 2. අසර; පාර (-හරක් අහර) (ශු සිං අ). 3. අභිමානය; අභිකාරී (රැ 112). -**කිස**= ආහාරකෘත්‍යය; වැළඳීම. -**කුඤ්ඣ**=පසිවිගෙඝයක්. -**පිළිකුල් සංඤ්ඤා**= 'ආහාරපටික්කූලසඤ්ඤා' බ. (වි 4. 61[1-17]). -**බෝඩි**†= භික්ෂුකමක් පිණිස පංතය සඳහා වැඩි විට ගෙදර අහර නැති බව කියන්ට කැමැති නොවන සමහරුන් ඒ සඳහා කියන වචනය.= "අපට ආහාර බොහොම ඕ!".-**මුළාසි**†="අහරබෝඩි"යන්න සඳහා සමහරුන් කියන වචනය;="අහර ගැණ සිහි මුළා වුනා". -**විකර**=ආහාරවිහරණ; කෑම සහ පැවැත්ම. -**සඳ**= ආහාර ගතපසු කාලය (බගැ 645).

අහරූපිරුණම්(පිරිණම්?)=ආහාරපරිණාමය; මලමූත්‍ර (බගැ 208[7]).

අහර්පති=දිනපතියා; සූපකීයා. [වාශ්ලි.

අහල†(නාප)=අසල. -**පහල**=සමීපය. 'පහල'

අහවර†=අවසාන; ඉවර.

අහසිඅඟුණු=අංකාශාඛගණය (ඛුදු 56).

අහස්=1. අංකාශය. 2. මිණිරන්(වෛ). -**අර මුණු**=අංකාසාරම්මණය; අංකාසකසිණය. -**කඹ**=කරණම් ගැසීම සඳහා අදින කඹය (ශුසිංඅ). -**කිසුණු**=අංකාසකසිණය (වි 1. 394[1-31]). -**කුස්**=අංකාශධාතුකෝෂය; අහස. -**ගං** (ග්)=අංකාශගඛගාව; විෂ්ණුහුගේ පයෙහි මංපවැහිල්ලෙන් පවත් ගෙණ කෛලාසකූට යෙහි වසන මෙහෙයුරාගේ දළමඩුල්ලට වැටී එය තුන්වරක් පැදකුණු කොට පොළොවට බසිනැයි සැලකෙන ගංගා නදිය (කාගෙ 3-46). -**ඟැඹ**=අහස්කුස. -**තල**=1.අංකාශය(වි 1.275[2-27]). 2. අංකාශතලය; සඳල්ල(බගැ 60[30]). -**දිය**=වැසිජලය. -**නැව**=අහසෙහි ගමන් කරණ නැව. -**නි**=අහස්ගහ (රැ 156). -**පත්**=අංකාශපත්‍රය; සරුංගලය (පූ 2. 179[19], පරෙවි 102). -**පෑන්**=වැසිදිය. -**බෙඳි**= විණිරන්අළු (වෛ). -**මං**(ග්)= අංකාශමාර්ගය. -**මිණ**= හිරු. -**යාත්‍රා**=අහසෙහි ගමන් කිරීමට උපකාර වන නැව. -**විසන්**=රන්මුවා තරු අල්ලා කළ විසන; උඩුවියන (දළ 56[16]. සහ 2[33]. පූ 2. 602[37]). -**වෙඩි**=මල්වෙඩිවෙසෙසක් (ගඛහ 54). -**සන්**=අංකාසසාණිය; උඩුවියන (ශුසිංඅ). -**සෑදි**=1. අහසෙහි හැසිරෙණ. 2. රඟුම්වෙසෙසක් (සැවුල් 180).

අහස=1. අටව සිහය (සවි 18[11]). 2. අටව කෝටිය (පූ 2. 491[6]. සර 214[24]). 3. නිරයක් (බප්‍ර 71[25]. මනි 22[32]).

අහා(නි)=ප්‍රතිඝෙඛයෙනි; 'හා හා'(බුත් 143[12]).

අහහා(නි)=අංශ්වයාසියෙනි (දජා 233[26]).

අහි(බා)†=සැසීමෙහි.සක.'අස්' බ. අනි, අනිත්; අැනි, අැති.

අහි=1. සපිහය. 2. සතුරා (ශුසිං අ). 3. අභිමානය (රැ112?). 4. කඩුව. -**කුණප**=සපිහයාගේ මළකඳ.-**ගරසප්**=ගැරඬියා(බගැ 178[14]) (කළුතරා-සලි 1.626[36]).-**ගුණ්ඩිකා**=සපිහයන් නටවන්නා (ජා 621[7]). -**ජනුමුකුල**=ඉතු කැකුල (බප්‍ර 157[25]). -**තුණ්ඩිකා**=අභිතුණ්ඩිකාය. -**මාල**='අසිමාල' බ. (ජා 612[22]). -**වඛ**=අසිමාලවඛය කරන්නා(රාජා 583). -**ලතා**=බුලත්වැල (සිංම අ). -**වාතකරෝ** (ග)=විෂවාතය හැමූ විට විනිසුන්ට

වැලඳෙන වසංගතරොගයක්. ප්‍රරොගය යම් ගෙයක ඇති වූයේ නම් එගෙයි හිතත් බිඳ ගෙණ නිකුත් අය පමණක් නොමැරෙත් ලු. (බගැ 62[13]. 247[12]. ජා 338[12]. සලී 1. 206[23]).

අහිංකර=අහංකාරය (බගැ 276[2]. සිය 272).

අහිත=හිතවත් නුවූ; විරුද්ධ (බප්‍ර102[3]). -**අපනයන**=අහිත පහ කරණ. -**ආවරණ**=අහිත දෙය කරණ.

අහිතු†=අශුභ; වර්ජස්.

අහින්=විරුද්ධ (රාජා 58[12]).

අහිය=1. අහිත; අයහපත් (බගැ163[16]. 196[17]). 2. ගතුරා (රු 329).

අහිරික=1. අකුශලචෛතසිකයන් හා එක් ව යෙදීමට පිළිකුල් නොකරණ ගතිය; ලජ්ජා නැති බව (කාශෙ 14–16). 2. ලජ්ජා නැති. 3. අශ්‍රික; කාලකණ්ණි (දළ 29[15]). -**බල**=පව් කිරීමෙහි බලයක් වූ අහිරිකය.

අහිරිපොර†=අඹුසැමියන් අතර වන දබරය (සංසිංකෝ).

අහිවස්(-විස)=සර්පයා (ශුසිංඅ).

අහිනෝඳ්‍රිය=නොං අඹු ඉඳුරය ඇති (බප්‍ර316[23]).

අහු=එනම් ගස්.

අහුදි=අසුඹ; දුජ්ජන (වෙස 543). [වැඹි වීම.

අහුපැවත්=1. 'අසුපැවත්' බ. 2†. සමෘද්ධිය;

අහුමුලු†=අසුමුලු; සිදුරු හා කොන්.

අහුර(බං)†=1. ඇහිරීමෙහි. 'අසුර(බං)' බ. 2. අවිරීමෙහි. 'අවුර(බං)' බ.

අහුරු=අතට අසු වන ප්‍රමාණය; ඔව(මිලි36[3]).

අහුල(බං)†=ඇහිළීමෙහි. 'අවුල' බ. [වාශ්ලි).

අහෙක්පහෙක්†=කටයුතු; මෙහෙය ('අහෙක්,

අහේ=හෙතු නැති (කව් 94). -**පිළිසඳ**=1. අහෙතුකප්‍රතිසන්ධිය. 2. එය ඇති (බප්‍ර161[10]). -**සිත්**=අහෙතුක චිත්ත (බගැ 16[39]).

අහෙතු=1. හෙතුවක් නොවන. 2. හෙතු රහිත. -**ක**=හෙතුවක් නැති. 2. හෙතුන් ගෙන් හට ගැන්මක් නැති නිවණ. -°**ක්‍රියා චිත්ත**= උපෙක්ෂාසහගතපඤ්චවාරාවජ්ජන චිත්තය, උපෙක්ෂාසහගතමනොද්වාරාවජ්ජනය, රහතුන්ට ඇති වන හසිතුප්පාද චිත්තය යන සිත් තුන. -°**චිත්ත**=ලොභ ආලෝහ ආදි හෙතු රහිත අකුශලවිපාක චිත්ත හත ද, කුසලවිපාකඅහෙතුක සිත් අට ද, අහෙතුකක්‍රියාචිත්ත තුන දැයි යන අවලොස (අභිස 14–18). -°**දෘෂ්ටි**=හෙතුවක් නැති ව සිගල්ල ඇති වෙතැයි යන මිථ්‍යාදෘෂ්ටිය (වි 7. 136[43]). -°**ප්‍රතිසන්ධි**=අපායප්‍රතිසන්ධිය හා මනුෂ්‍යජාත්‍යන්ධාදීන්ගේ ප්‍රතිසන්ධිය. -°**ප්‍රතිසන්ධිවිත්ත, -°ප්‍රතිසන්ධියුගල**= අපායප්‍රතිසන්ධියෙහි දී ඇති වන අකුශලවිපාක වූ උපෙක්ෂාසහගත සන්තීරණචිත්තය හා මනුෂ්‍යජාත්‍යන්ධාදීන්ගේ ප්‍රතිසන්ධියෙහි දී ලැබෙන කුශලවිපාක වූ උපෙක්ෂාසහගතසන්තීරණචිත්තය දෙයි යන සිත් දෙක. -°**මනොවිඤ්ඤාණධාතු**= උපෙක්ෂාසහගතසන්තීරණචිත්තය (වි 7. 51–26). -°**සත්ත්ව**=අහෙතුකප්‍රතිසන්ධිය ලැබූ සත්ත්වයෝ. -**ඡ**=හෙතුවක් නැති ව උපන්. -**ඤාණ**†=අහංඥාත්වත්; කාලකණ්ණි.

අහේනි='අසේනි' බ.

අහෝ=1. විත්තවිකාරය (රු 111) 2. හෝපලු.

අහෝ(නි)=ශොකය, විසමය යනාදි අර්ථයන්හි.

අහෝරත්‍ර=දහවල් හා රෑ (ජාස 353[15]).

අහෝසි=අවලංගු; නැති. -**කම්**=විපාක නොදෙන බවට පැමිණි කම්ය (වි 7. 191[3–35]).

අහ්‍රික=අහිරිකය (බප්‍ර35[22]).

අළ(නි)=අංමනත්‍රණයෙහි; එම්බල (රු486).

අළ=1. ඉදිරිපත් කළ; පැවිණුවූ; 2. අත්හරිණ ලද. 3. ඇවූ. 4. විවෘත කළ. 5. කකුළු ආදීන්ගේ අඹු (අමං 2. 98[6]).

අළ(නෛක්‍රි)=අත්හැරියොත් (සලී 1. 223[19]).

අළවකයක්=ආලවකයක්ෂයා (කාශෙ 1–77).

අළවිමඳු=දෙවියන්ගේ ආලකමන්දනගරය (බප්‍ර194[29]).

අළාමුලා=මුළාව. 'අළා'- වාශ්ලි(සලී 1. 663[24]).

අළාරකාලම්= ආළාරකාලාමතාපසයා (බගැ 37[33]). [යෙහෙළිය (සී...)

අළි(නි)= 1. එම්බල; බොල (බගැ 109[27]). 2.

අළිගුබෙර=ආළම්බරහේරිය (පඤ්චි 114[23]).

අළියෙකි (නාප)=අළුයෙකි (බගැ 95[26], 96[5]).

අළු= 1. ඇතුන් බඳින වැඹ (අලු?- රු 344). 2. හැන්ද (රු 652). 3. හැඳි දමීම සඳහා සාදන සිදුරු සහිත ලිපටිය (රු 34). 4. භස්මය; ලී ආදිය දැවීමෙන් ලැබෙන සුණු.

කුර්මසිර (යෝ 4090) }=මම්මයක්.

කුර්මණ=1. කිරීම. 2. කරණ (වි 4. 203[2-10]).

කුර්වර(කුවර?)='කිඹුල්මුව' බ.(වි 7. 166[2-16]).

කුල්(ධා)=තද කිරීමෙහි. අක. කුලී කුල්ති; කිලි කුල් කිලි කුල් (අමා 2. 6[18]. බප්‍ර 281[23]). (කුල් + ඵම්='කිලුම්' බ).

කුල්=1. හැඬුඹ(දළ 8[21]). 2. හැඹිම; නංදය. (හිරං 185). 3. ප්‍රීතිය. 4. ප්‍රීතිමත් (එය 41). -**ඥාද**= ප්‍රීතිනාංදය (ජාඟැ 38[3]). -**මත්**=ප්‍රීතියෙන් මත් වූ (සළ 1. 110[2]. පූ 2. 89[15]. සද්ධ 170[6]. කාගෙ 9-7). -**හඬ**=ප්‍රීතිකොංහාව (ජාඟැ 19[3]).

කුල=1. වංශය; ගොත්‍රය(කවි 50. බප්‍ර 328[15]). 2. සමානජාතිකසමූහය (කවි 200. සද්ධ 113[31]). 3. නෑයා (තිසර 90). 4. ගෘහය (වි 1. 325[1-2]). 5. නිෂ්ඵවට කරුණ (සළි 1. 701[21]). 6. නිෂ්ඵ කිරීමට ජාත්‍යාදීන් ගම්‍ය කියන කථාව (සළි 1. 455[23]. අනා 116[25]). 7. ගොඩවීරයා (රූ 462). 8. යංසකීය (ගෝ 462). 9. කුලවතා (බුදු 60). -**අඛනා**, -**අඛන** (තිසර 9)= වැදගත් කුලයක උපන් ශීලව වූ තරුණ ස්ත්‍රී. -**අඹු**= කුලස්ත්‍රිය. -**ආචාර**=කුලයට අගත් චාරිත්‍රය (කඛා 17[7]). -**ඇති**=වංශවත් (බුත් 25[22]). -**කන්**, **කාඛනා**= කුලාඛකාංව. -**කම්**= 1. කුලගෙහි ක්‍රියාව. 2. කුලමල (මනි 58[19]). -**කුමාරි**= කුලගෙහි සිටින බාලස්ත්‍රී (වි 1. 74[2-32]).-**කුවස්ථ**=මූලප්‍රකෘතිය (පඤ්චි 125[19]). -**ඝකාන්**= කුලයට කොපක් වූ; කුලශ්‍රේෂ්ඨ (මුව 125). -**ඝුව**=කුලපරම්පරාව (ජාඋ 458[26]). -**ගම්**=1. ගෙවල් ඇති ගම (හෙසි 30[3]). 2. නම්‌ගේ කුලයට අගත් ගම (පූ 2. 277[15]). -**ගල්**=කුලපර්වත (ශිසං I. 218[3]). -**ගැති**=කුලගෙහි දාසයා (බුත් 2[27]). -**ගිරි**=කුලපර්වත(මයු 48. 59). -**ගෘහ**, -**ගේ**= 1. කුලයක් වසන ගෘහය (හෙසි 30[26]). 2. නම්‌ගේ කුලයට අගත් ගෘහය (සළි 1. 203[30]).-**චාරිත්‍ර**=කුලගෙහි පවත්වා ගෙණ එන සිරිත. -**ජ**=උසස්කුලයක උපන් (සළි 1. 246[5]).-**ජාත**=කුලයෙහි උපන්.-**දෘෂ්ටි**=සිය කුලයෙහි උපන් මෙහෙකාරිය (ජාඋ 16[11]). -**ජාති**=කුලය හා ජාතිය (පූ 2. 69). -**ජ්ජු** (ශිසං I. 104[5]), -**ජ්‍යේෂ්ඨ** (සර 85[9])=කුල ගෙහි ප්‍රධාන. -'ඨා=වෙශ්‍යාව; සැමියන් පතා යන්නී. -**දම්**=කුලවාරිත්‍රය(සිදත්68[3]). -**දරු**=1. උසස් කුල ඇති දරුවා; ශීලාචාර අය (ධකැ 486. අමා 2. 13[22]). 2. ගෙයක සිටින දරුවා (සිබ 65[34]). -**දුලි**=කුලාඛාරය; කුලය කිලුටු කරණ අය (ජාඟැ-බිළාල කොසියජා). -**දුසුකම්**= කුලදූෂණය (සිබ 49[36]). -**දූ**=පනිවුතා ස්ත්‍රී (රූ 261). -**දූෂක**= කුලයන්ගේ ශ්‍රීභාව දූෂ්‍ය කරණ (සළි 2. 434[30]). -**දූෂණ**=මල්පල ආදිය ගිහියන්ට දීම (සළි 1. 478[9]). -**දූෂකනිරය**=නිරයක් (මනි 77[1]). -**දෙවු**=කුලජ්‍යේෂ්ඨයා (ධකැ

881⁰). -°කම්=කුලමල (මනි 35³¹). -දෙවි= 1. කුලයට අයත් හෝ කුලය විසින් විශෙෂ යෙන් පුදනු ලබන දෙවියා (සැළ 14). 2. ආගමයෙහි පූජ්‍යයා (බප්‍ර 332⁵). -දෙව කා=කුලදෙවියා (සද්ධ 459³). -දෙශ=කුල යෙහි වරද (කති 91⁷). -ධන=කුලයට අයත් වස්තුව (පූ 2. 71¹⁹). -ධර්ම=කුලාචාරිත්‍රය (වි 1. 62²–1²). -නාස්තිනී=කුලය සතුටු කරන්නී (සද්ධ656³⁰). -නෑ=කුලයෙහි බන්ධු වරයා (පූ 2. 664⁸). -නිවෙස්=කුලගෘහය (සැළ 96). -කුවර=සිය කුලයට අයත් නගරය (අමා 2. 24⁴). -පති=කුලයෙහි සභාපතියා (මධු 103. බප්‍ර 305⁵). -පරපුරු=1. ගෘහ පඬුකතිය (බුත් 156¹³); කුලපිළිවෙල. -පරම්පරා=වංශක්‍රමය; පිතෘපුත්‍රාදියන්ත නිය. -පරිවෘත්ත=කුලපිළිවෙල (ජාස 216¹¹). -පවිත්‍ර=1. මහමෙර අවට ක්‍රමයෙන් උස් ව පිහිටිය නිබෙනැති සැලකොන යුගකිර ඊශධර කරවීක සුදර්ශන නෙමිකිර විනතක අශ්වකණ්ණ යන පවිත්‍ර හත (සළු 1. 406⁵. බප්‍ර 57¹³). 2. දඹදිව භාරතවර්ෂයට සීමා වූ මහෙන්ද්‍ර මලය ආදි පවිත්‍ර හත. -පලු=කුලපාලකයා. -පවු(වි)=කුලපවිත්‍ර. -පාලකා=කුලය ආරක්ෂා කරණ. -පාලිකා, -පැලි(පුනා 150)=කුලපාලකස්ත්‍රී. -පිත්=කුලපුත්‍රයා (වෙස 277). -පිරිස්=කුල වලට අයත් සමූහය (පූ 2. 92²⁹). -පුත්=1. වැදගත් කුලයෙහි උපන් අය. 2. ශිලාවංශ සම්පන්නයා (බප්‍ර 257³⁰). -පුවෙණි=කුල පරම්පරාව; පරම්පරාවෙන් පැවතෙන දෙය (පූ 2. 699¹². සද්ධ 395⁹). -බොල්=කුලයට පුහු; කුලයට වැඩක් නැති (ජාස 435²²). -භෙද=කුලයෙහි වෙනස (සඟ 79). -භ්‍රෂ්ට= කුලයෙන් ගිලිහුන්; පහත් කුලයකට ගිය. -මත්සරිය(අමා'2.173³⁶), -මාත්සර්‍ය(සළු 1. 440⁷)=තමාගේ දැයකා කුලයන් අනුන්ට සාධාරණ සේ නොසැලකීම; ඒ කුල අනුන් ඇසුරු කිරීමට නොකැමැති බව. -මල= කුලයෙහි කිලුටු හෝ දෙය. -මිනිස්=කුල යට අයත් මනුෂ්‍යයා (වි 1. 330¹–²⁵). -වත්=උසස් කුල ඇති. -වදිනා=අනික් කුලයකට හෝ ආගමකට යන (රාජා 56³¹). -වන්නම්=උපාධිය; අනික් කුලයකට නොහොත් අනික් ආගමකට යෑමේ දී ලබන නම් (රාජා 56³¹). -වන්නි=හොඳ කුලයට අයත් වන්නි රජවරු (පැර 46). -වම්=කුල කාන්තාව (රු 261). -වාසි=කුලයෙහි වාසනා; වංශයට අයත් (සද්ධ 394⁸). -වැසි=කුලවාසි (සිබ 66⁸). -විලොකන= කුලය බැලීම; මහබෝසතුන් බුදු•වීමට මිනිස්ලොව ඉපදීමේ දී ඊට සුදුසු කුලය කුමක් දැයි පරීක්ෂා කිරීම (සවී 106¹²). -වෘතනී=-1. කුලපරපුර (ජාස 435¹⁷). 2. කුල යට අයත් පැවැත්ම. -වෘද්ධ = වයසින් බාල නමුත් උසස් කුලයක උපන් හෙයින් වැඩිහිටියෙකැයි සැලකිය යුතු (ජාස 15²⁰. ජා 91⁴¹). -සංඥකී=කුලයන් හා එක් වීම; කුලයන් නිතර ඇසුරු කිරීම (බුත් 69²⁶). -සංඥක(නිකා 11¹⁹), -සංඥාගත=කුලයන් හා මිශ්‍ර වූ. -සඞ්ග්‍රහ=මල්පල ආදිය දීමෙන් කුලයන් අල්ලා ගැනීම (සිබ 64¹⁷). -සත්ත්ව (ශික්සං IV. 227²), -සතු(බප්‍ර 284³²), =සන්තක, -සෑනි(ධාත්‍ර 108²⁸)=කුලයට අයත්. -සම්පන්නී=කුලයට අයත් සම්පත් නිය. 2. සමෘද්ධ වූ කුලය; ක්ෂත්‍රියබ්‍රාහ්මණ වෛශ්‍ය යන කුල තුණ (ජාත්‍ර 53¹³). -සිවු= සිටුකුලයෙහි උපන් අය (ධාත්‍ර 81²). -සිරිත්= කුලවාරිත්‍ර. -සුද්‍රී='කුලඛ්‍රී' බ. (පූ 2. 17³⁰). -සිම්=කුලයෙහි සභාව්‍යා (සඟ 11¹⁴).

කුලක=එක ම ක්‍රියාභාවකපදසමභිව්‍යාහාර අනේක පද්‍ය පසකට වැඩිගණන (සිය 14. කාශී 1–13)

කුලච්චි=සිනක්කාරම්? (ca).

කුලංචි (ලංව)†=මහත්; තද.

කුලත්=කුලපුත; කොල්ලු (සෙං 319).

කුලප්පම් (සළු 2. 157³⁵) }
කුලප්පු (සළු 1. 174⁸) }=හාලබල; ඝොංඝා.

කුලල්=1. නළාව (කාශෙ 8–32). 2. ගලනාළය (ජා 272²²). 3. අංශය; උරහිස (ජාත්‍ර 140¹⁶). 4. සිදුර; නළය (සද්ධ 719¹. අනා 102¹⁴). 5. 'කුළල්' බ. -වා=නළා පිඹින්නා (රු 398).

කුලා (ළා)= තෙල් ඉදිකටු ආදිය දමන කුප්පිය හෝ බවපුරුක (සළු 1. 536². ථූප 96²¹). =දද?=ඔවප්‍රවර්‍යශක්? (කවි 749).

කුලාල= 1. කුඹකාරයා. -චක්‍ර= කුඹල්යන්ත්‍ර (සවී 47²⁵). -භාජන=මැටිබඳුන (ඔස 20¹⁹)

කුලාවක=කුඹුව (ජාස 13¹⁹).

කුලික='කිලි' බ. (සර 341²²).

කුලිච්චම්=පුලුන් ආදිය පිරවූ මෙට්ටය (කති 27²². උපා 69²⁷).

කුලිණී (කුලුණු+ඉ)=අභිංසාව (බහැ 141[13]).

කුලිස්=වජ්‍රය (රූ 390).

කුලී= 1. වෙතනය; ශාස්තුව (ජාහැ 67[11], 191[3]. ජා 73[34]. කාගෙ 12-37). 2. කුළම; වැව හෝ වැව අසල පෙදෙස (ශිසං IV. 188 B[12]). 3. මෙහෙකරුවා. **-කාර**†= කුලී යට වැඩ කරන්නා. **-වෑඩ**†= දවස් පනා වැටුප් ගෙවා කරවන වැඩ. **-සෙනග**= වැටුප්ගෙවා ගොදුගත් සුදුසෙනඟ(මසූ163).

කුලීන=වංශවත් (දහම් 140[2]).

කුලු= 1. ඊඅාදිය පොළන උපකරණය (බහැ 146[12]. ජාහැ 163[21]). 2. පසුර (සිදත් 504). 3. **කුලුපක** (බහැ 144[10]. චූප 33[22]). **-පතු, -පොතු** (සලී 1. 1077[33]. දඹ 51[13])= කුලු වියන්නා. **-°ශිල්ප**= බටපතුරුවලින් කුලු වියමන උගන්වන ශිල්පය (සිඛ 102[28]). **-මාලු**=පැරණි කුල්ල(සලී 1. 195[25]). **-වරු**= 1. කුලුපොත්නා (පූනා 224). 2. ඔස්වෙසෙසක් (වෙස 342).

කුලුඟු (ශිසං I. 1859)
කුලුඟුලු (ශිසං I . 185[11]. 232[17])} = කරුණාව. **-වන්**=කරුණාවන්න (ශිසං I. 232[17]).

කුලුදුල් (<කුල+උජ්ජල?)=කුලය බබලවන; පළමුවරට උපන්. [156[25]. අමං 2. 48[12]).

කුලුපහ(ග)=කුලයට එළඹෙන; වියහැකි (දහම්

කුලුලු (බහැ 98[3])='කුලොලු' ඉසුද?

කුලොලු (බහැ 176[5])
කුලොපග (අමං 2. 172[15])} =කුලුපග.

කුල්නා=1. නාඳ කරණ (දළ 301[13]). 2. නාඳ කිරීම (අමං 2. 10[27]).

කුල්මාෂ='කුම්මාස' බ (බප්‍ර 154[12]).

කුවඩි=හාවර; හිනම් (බහැ 162[11]).

කුවල (එස 52), **කුවලය** (පරෙවි 89)=නිලුපුල්.

කුවිතාන්සි†='කුතිහාන්සි' බ.

කුවිලි=හින්තඹල (වන 26).

කුවෙර= වෙසවුණුරජ (බුදු 80. සිඔ 314). **-ඇස්**=කුඹුරුඇට (රූ 212). 2. පලොල්ගස (රූ 213). [එනම් මුහුද (සර 375).

කුශ= තෘණවිශෙෂයක් (බප්‍ර 7711). **-මාලි**=

කුශල=1. දෂ. 2. පිණ (බහැ 151[4]). **-කම්ම**= ලොභාදිපාපබම්මයන් සිඳින දානාදිසුචරිත ක්‍රියා (බෝහැ 90[14]). **-°පථ**= සුගතීන්ට මාර්ග වූ කුශලකම් (බුත් 28[23]). **-ඝෂ**=පින් ගෙවීම (සර 28[20]). **-ඝෂත්‍ර**= පින්කෙත; කුසල් නමැති ඵල ගවහැන්මට දානාදිය නමැති බීජ්වට වපුළ යුතු කෙතක් වැනි බුද්ධාදිඵත්තමහෝ (සද්ධ 516. සවී 325). **-චිත්ත**= ලොභාදියෙන් තොර වූ, යහපත් ක්‍රියා කරණ අවස්ථාවෙහි දී ඇති වන සිත්. **-ඡන්ද**= කුසල් කිරීමෙහි කැමැත්ත (සලී 1. 217). **-නිස්ස**=කුශල අකුශල අවශ්‍යකෘත්‍ය නූණ (වි 1. 58[32-33]). **-බම්ම**=පින් (සද්ධ 831). **-°අධිකාර**= කුසලධර්ම පිළිබඳ අධිකාරය (උපා 1868). **-ප්‍රශ්න**= සුවදුක් විමංරීම. **-ඵල**= පිණින් ලැබෙන යහපත් විපාකය. **-භූමි**=පින් නමැති අංහරණය (බෝහැ 106[21]). **-මූල**= පින්වලට මුල් වන අලොභ අදෙෂ අමොහ යන තූණ. **-විපාක**=පින්වලින් ලැබෙන යහපත් ඵල. **-ශීල**=කුසල වූ යහපත් ශීලය(වි 1. 58[32.19]). **-සංඥා**= 1. කුසලචිත්තයන්හි ඉදෙනු සංඥා චෛතසිකය (වි 4. 121-22). 2. කුසල් පිළිබඳ හැඟීම. **-සම්භාර**= පුණ්‍යරාශිය; සම්පත් ලැබීමට උපකාර වන පිණ (සද්ධ 1513). **-ස්ථාන**= කුසල් වූ කරුණු (සර 239). **-හෙතු**=පින්වලට හෙතු වන අලොභ අදෙස අමොහ යන තූණ (අභිස 7234).

කුශාග්‍රබුද්ධිමන්= කුශතෘණ අගක් සේ තියුණු වූ නුවණ ඇති.

කුෂ්ඨ=එනම් වම්මරෝගය (හෙසි 54).

කුෂ්ඨි=කුෂ්ඨරෝගියා (අමං 2. 12614).

කුෂ්=1. කුසිය; බඩ (කවි 413). 2. අභ්‍යන්තරය (අමං 2. 937). 3. පයොධරය (රූ 282). 4. සියඹබ පමණක් රැකින්නා **-බර**= 'කිස්කර' බ (රූ 419. පූනා 33).

කුස= 1. බඩ (සද්ධ 18414. අමං 1. 819). 2. ඊතණ (රූ 231. පූනා 135). **-අග්ගිනිරය**= නිරයක් මනී 791). **-කාන්**= වියලිකන (ca). **-ගිනි**=බඩගින්න. **-තණ**=ඊතණ (කවි 119) **-පත්**=1. පිරිකර ආදිය බෙදීමෙහි දී ඒ මත හෙලනු ලබන, නමී ලියූ කුඩා පත (සිඛ 2285). 2. කුශතෘණපතුය (උපා 3411). **-පත්‍ර**= 1. ශාන්තකර්මයෙහි යෙදුනු අවියක් (යෝ 4190). 2. නිදිකුම්බවැල (වෛව). **-මාලි**= සමුද්‍රයක් (ජාස 500 23). **-වැහැපි**= කුසතෘණවලින් සෑදූ වසුය (හෙසි 417).

කුසල්=1. පින් (බහැ 3[26]). 2. යහපත (රැ 90) **-කම්පථධම්=** දශකුශලකර්ම (බහැ 3[27]). **-දම්සඳහණ=කුසලචිත්තයන්ගේ** ඒ ඒ අවස්ථාවෙහි ඉපදිය හැකි ඵස්ස, වෙදනා, සඤ්ඤා, චේතනා, චිත්ත, විතක්ක, විචාර, පීති, සුඛ, චිත්තෙක්ඛග්ගතා, සද්ධින්ද්‍රිය, විරිඒ, සති, සමාධි, පඤ්ඤා, මනි, සොමනස්සි, ජීවිති, සම්මාදිඨි, °සඛකප්ප, °වාඨාම, °සති, °සමාධි, සද්ධාබල, විරිය, සති, සමාධි, පඤ්ඤ, හිරි, ඔත්තප්ප, අලෝභ, අදෝස, අමෝහ, අනභිජ්ඣා, අව්‍යාපාද, සම්මාදිඨි, හිරි, ඔත්තප්ප, කායපස්සද්ධි, චිත්ත, කායලහුතා, චිත්ත, කායමුදුතා, චිත්ත, කායකම්මඤ්ඤතා, චිත්ත, කායපාගුඤ්ඤතා, චිත්ත, කායුජුජ්ජතා, චිත්තු, සති, සම්පජඤ්ඤ, සමථ, විපස්සනා, පග්ගාහ, අවික්ඛප යන ධම් සපණස (සලී 1. 347[22]). **-මුල්=**කුශල යන්ට මුල් වන අලෝභාදි කුශලහේතු (බහැ 19[6]). **-සිත්=**කුශලචිත්ත.

කුසල= 1. 'කුශල්' බ. 2. (ශිසං I. 159 C[3])= 'කුඛසල' ශ්‍රුයි? **-මානස=** කුසල්සිත (මනි 78[3]). **-විපාකාහෙතුකචිත්ත=** කුශලචිත්ත යන්ගේ විපාකවශයෙන් උපදනා, අලෝභාදි හෙතු රහිත, සිත් (විසඅ-අභිස 14).

කුසලාන්=1. <කුශලායතන)=පින් පිණිස පිදූ ඉඩම (පූ 2. 272[22]. දපා 49[17]. දළ 54[14]. සද්ධ 766[23]). 2†= කෝප්පය.

කුසාවහාර=පිරිකර බෙදනවිට කුසපත් මාරු කිරීමෙන් හොරකම් කිරීම (සිඛ 22[23]).

කුසි=දිගහුවාව (අභිධාස 41[15]). **-නුවා** (< කුවජ්ඣනුවාත)= සිවුරෙහි අැතුළුපැත්තෙහි නුවාව; දිගහුවාව (පඣැ 29[22]).

කුසිවෙයි?= දෘඛිත (ජැ 951[20, 25] =මහාදුක්ඛිං අනුභවි-ජාඅක 5-27).

කුසී= 1. කුසීත (බහැ 874). 2. කෘප්තියට පැමිණි; අැති වූ (සලී 1. 6[26]).

කුසීත=1. කම්මැළි (සද්ධ 115[22]). 2. කාමාදි ත්‍රිවිධවිතුක් (බහැ 35[13]).

කුසුම්=මල්. -අසුරු= මල් නමැති ඉෂු (බපු 281[23]). **-කඩ(ඩ)=** 1. මල් නමැති ඊශ (කවි 315). 2. මල් ඊ කොට අැත්තා; අනඛගයා (කාගෙ 6-29. සන්නා- 1. මල් සෝදුවා. 2. මුදුන්මල්කඩ). **-කැන්=** මල් පොකුර (උපා 128[22]). **-දද=** අනඛගයා (රැ 23). **-දල=**මල්පෙත්ත (රැ 583). **-දුනු=** අනඛගයා (රැ 21). **-පම=** කුසුමින් කළ වස්ත්‍රය (කුස 58). **-රජ=**මල්රෙන් (කවි 146. බපු 281[22]). **-රස=**මල්පැණි (රැ 201). **-වෂ්ා=** මල්වැස්ස (බපු 195[16]). **-සැපත්=** කුසුමසම්පත්තිය; මල් හටගැනීම (කවි 4). **-සිරිහර=** 1. කුසුමශෘඛාරය; පුෂ්පතුණය (කාගෙ 2-38). 2. සිංහලවෂ්ණුසෙනි වෘත්තයක් (එස 68). **-ශි=** අනඛගයා (සස 75).

කුසුම=මල්. **-අඤ්ජලි** (ම + අ=ඹා)= මල්දෙන (බත් 171[25]). **-ආගම=** වස්නා කාලය (බෝහැ 68[16]). **-ආසමාද=**මල්සුවඳ (වෙස 307). **-උදර** (ම + උ=මො)= මල් අැතුළ (දහම් 53[15]). **-කඩ=** 1. මල් නමැති ඊ (නිසර 55). 2. ඒ අැත්තා; අනඛගයා. **-චාප=** 'කුසුම්දුනු' බ. **-තර=** කුසුම් අතර (සර 112[10]). **-දම=**මල්මාලාව (බපු 215[39]). **-දුනු=**අනඛගයා (නිසර 51). **-ශෂ්ටි=**දෙවන පැනිස්රජ්ජුව ලැබූ පුෂ්පාකාර සවහන් අැති උණලීයක් (ස්තූ 108[23]). **-ෂ්ි=** අනඛගයා (පරෙවි 89). **-සෙඛ(ව)ක=** මල් පොකුර (සද්ධ 1[12]). **-ෂර=** 'කුසුම්සඛ' බ.

කුසුම්ත=මල් හටගත් (දජා 183[14]).

කුසුමෂ= වණ්ණප්පභා (පසං 199[10]). **-පුෂ්ප=** වණ්ණප්පමල (ඕලි 138[2]).

කුසුල්= කුසුලය; ගබොළුආදියෙන් සෑදූ ධාන්‍යාගාරය; කොටුව (සිදත් 149[8]).

කුසෙන් සෑහැල්ලු වීම්†=වැදීම.

කුස්ට=කුෂ්ඨරෝගය (යො 134. 595).

කුසතුම්බුරු=කොත්තමල්ලි (උපා 268[32]).

කුස්පිඳේරු†=භාජනවිශෙෂයක්.

කුස්මඬ=පුහුල් (වන 65). [ඍතය(යො 1690).

කුස්මාණ්ඩගිතෙල්= පුහුල් ආදියෙන් සාදන

කුස්සි= 1. ඇතුළුගෙය; නිදන කාමරය (සලී 1. 336[2]). 2†=ආහාර පිසන ගෙය. **-අම්මා†=** ආහාර පිසන ස්ත්‍රී. **-ගේ=** නිදන ගෙය (සර 403[24]).

කුහඤ=ආර්ෂාපෙෂාවෙන් තමා තුළ නැති ගුණ අැති සේ අඟවන (බපු 275[15]). **-ප්‍රතිපදා=**කුහනය (සලී 1. 963[18]).

කුහකුහාරව='කුහ, කුහ' යන නාදය (දහම් 59[20]. සර 103[24]).

කුහනා=ලාභසත්කාර සඳහා නැති ගුණ දක්වීම (ධප්‍ර 151[1]). -වසතු= නැති ගුණ ඇති සේ ඇඟවීමට ආඩාර වන කරුණු (වි 1. 64[2-30]).

කුහනා=කුහනය (සිඛ 66[16]).

කුහර=සිදුර (සද්ධ 35[5]. දල 42[18]).

කුහායන=නැති ගුණ ඇඟවීමෙන් අන්‍යයන් විස්මය පත් කිරීම (වි 1. 144[1-4]).

කුහි=කිසි (ශිසං I. 245[9]).

කුහඞ්= 1. සින්නා; කුඹිය (ජාගැ 203[18]). 2. කුපනය; කුඹිනය (ජාතැ-සඞ්ඛජා).

කුහල්=1. අපුඨ්ඨෙය දැකීම් ආදියෙහි ආශාව (ජාගැ 120[7]. කව් 127). 2 සැකය (කව් 120). -දෙන්= නලියන; දඟලන (බුත් 226[36]). -මහල්බහල=ශුභයහි සම්මත දෙය දැකීම් ඇසීම් ආදිය ශඨපත් සේ සැලකීම බහල කොට ඇති; ශුභනිමිති විශ්වාස කාරණ (වි 7. 62[1 24]).

කුළ(න්)සම්අරූඛ්= පෙර සිටි මුලාදෑනියෙක් (ශිසං IV. 391[0]. 43 අඩෙ).

කුළල්=කුම්භකාරයා (වි 4. 184[1-17]).

කුලාර (ධගැ 349), -ඉඟ්=කුවාඟාරය; එක් කැණීමඛිල්ලක් යොදා සෑදූ වටගෙය (ධගැ 50[22]). -කුස්=කුවිංගාරයෙනි අැතුළ (ධගැ 215[11]).

කුලැඹි†=නො දමුනු; නෙ හික්ඛුනු.

කුළි=ගම? (සි 71). [(වි 5. 258[1-21]).

කුළිදි?= 1. ගස්බඩ? 2. කුලාලකාර්යනය?

කුළි=වැව; වැවට ආසන්න ප්‍රදේශය (ශිසං I. 203 B[s]. 2 456). [(සාඛ්‍යා 68[s]).

කුළිරපාද= කඤ්චිපා වැනි පා ඇති ඇද

කුළිරඟ්ඩි=කුෂ්ඨරෝගය (ධගැ 181[30]).

කුඨ=1. කුවය; මුදන (සද්ධ 100[s]). 2. ශකඛ ආදිය තළන ඔහම්විටිය (සද්ධ 323[7]). 3. කටුක (ධගැ 130[21]). කටුකරසය (රූ 101). 4. සොරකම; වඤ්චාව (රූ 403. පුනා 226). 5. ඉහුරු මිරිස් නිප්පිලි ගත තුණ. 6. කුෂ්ඨය. 7. කුල්ල (ජාගැ 113[9]). -අස්=වල් නොහික්මුනු අශ්වයා(චි5.299[1-21]).-ඇඹිලි=මත්ස්‍යයෙක් (වෙස 306). -කාහවණ්ඩ=හොර කාසි (සිඛ 21[21]). -ගැන්වීම්=කොත පැලඳවීම; මඤ්චකප්‍රාපන කිරීම (සලී 1. 185[17]). -ගෙඩි=ශකඛ ගල් ආදිය තළන මහවිටිය. -ගේ='කුලාර' බ (ජාගැ 113[5]). -ගොන්= වණඛගවයා (ඛස 17[18]). -තවුස්= හොර තාපසයා (ජාගැ 89[25]). -තාළම්=කඤිතාළම (ජාගැ 8[16]. ජාස 265[29]. අවද 25[26]). -දන්= කුවදන්නබ්‍රාහ්මණයා (කාගෙ 1-76). -දුළුල්= කුවජලිලයා (ඛගැ 25[15]). -දෙස්= බොරු සාක්ෂ්‍යය (බස 2[34]. ජා 742[12]). -පතු (පූ 2. 267[10]. ථූප 16[21]), -පොතු= 'කුලූපොතු' බ. -ඵපාර= වණඛප්‍රහාරය (ජාගැ 140[13]). -ඵල=කටුක වූ තක්කුල් කරුබු ආදිය (ඛගැ 256[7]). -බඹු=ඉහුරු ආදි කටුක භාණ්ඩ (සද්ධ 299[30]). -රුණ= කටුක රොහිණී (යෙං 355. 382). -රෝවු= කුෂ්ඨ රෝගය (ඛගැ 226[22]). -ඝමන්= බොරු නඹුව; නොගිහි ව හිමියෙහි හි කීම (ජාගැ 116[10]. ඛගැ 109[32]). -ඝවහන්= කුල්ලක හෝ ඔරුවක ආකාරය (ජාගැ 159[29])

කුඨඝල (ධප්‍ර 280[16])='කලකුඨ' ශුශ්‍ර.

කුඨඤ්ඤි= 1. කාරුණ්‍යව (හෙසි 8[13]). 2. නව නාට්‍යරසයන්ගෙන් එකක් වූ කරුණ රසය (සිය 275. පුසා 67). 3†= ගබොළින් බැදි කණුව. -ඇති= කරුණාවන්ත (රූ 418). -ඇස්= කරුණාවෙන් බැලීම (රූ 2). -කණ්ඩි†= ගබොළින් බැඳි කණුව. -වත්= කරුණාවන්ත (රූ 418. ශිසං I. 129[3]).

කුඨදිලි=අඛපත (සලී 1. 304[20]).

කුඨදුල්=1. අඛපත; පලමී දෙක (යෙං 285. කාගෙ 14-10). වීඇවු 1225 නොහොත් 2250 (පඤ්ඩි 59[7]). අඛඇට ලක්ෂය (සද්ධ 331[7]. සලී 1. 588[17]. පූ 2. 50[s]). 2. වදන පළමුවැරය (අමං 2. 13[22] පූ 2. 166[37]). 3. පළමුවර උපන් (කුලූදුල්?)

කූ

කූජන(නා)=ඇඬීම; නාද කිරීම (ධප්‍ර 44[36]).

කූඤ්ඤ†='කුඤ්ඤ' බ.

කූට=1. මුදුන. 2. කැණීමබල (මිලි 41[20]). 3. හොර; වඤ්චක (සද්ධ 231[18]). 3. නො දමුනු; වල්. -කහවණ්ඩ= හොරකාසි (සර 24[29]). -ජීවල (අමං 2. 36[16]. ජාස 351[1]), -තාපස(මනි 38[14])=හොරතවුසා. -වාණිජ්= හොර වෙළෙන්ද (ධප්‍ර 79[6]). -ව්‍යවහාර= හොරවෙළෙඳාම (අමං 2. 2[16]). -ව්‍යවහාරික=හොර වනිනඔවයකාරයා (ධප්‍ර 79[6]). -ශාල්මලි=කටුඉඹුල්ගස (ධප්‍ර 76[27]). -සඤ්ඤාහණ= මුදුනෙහි සන්ධිය ගැණීම; කැණීම

මඩල යට් කිරීම; කොත තැබීම(පූ 2. 585³²) -සාසකී=බොරු සාක්කිකැරයා (බජ 79¹). -සථ=1. මුදුනෙහි සිටි. 2. වෙනස් නොවන මූලප්‍රකෘතිය (පි 8. 581–³⁰).

කුටාගාර='කුළුර' බ (අමා 2. 115⁴).

කුට්ටම්= 1. භාජනවිශෙෂයක් (සඬ 126³⁶). 2. කාණ්ඩය; පිරිස (ස්තු 34⁴. ථූප 150³). 3.†=ගුවල; ජෝඩුව.

කුට්ටල (සලී 1. 507³⁰) කුට්ටාඛි(ලී)†, කුට්ටු†}=එකතු; ගහළු.

කුඩ= වේවැල්අෑදියෙන් විශාලබන, පස් අාදිය ඇදීමට ගන්නා, භාජනය (ජාගැ 78³ පූ 2. 23¹⁵. සඬ 242¹⁷).

කුඩම්=මඩුව; තාවකාලික (ක්‍රි).

කුඩළු=1. 'කුඩැලි' බ. 2. කුඩා මල් ජාතියක්.

කුඩා='කුඩ' බ. මල්ල(ජෘගැ 69¹³. සඬ 61²⁷).

කුඩාරම්†=වස්තු නිර්මිත ගෘහය.

කුඩම් (උමංද 91¹⁰)=ඉඩම්' ශුශ්‍ර. (දජා 284⁷).

කුඩැලි= සතුන්ගේ ලේ බොන, තෙත්බිම්හි වසන, කුඩා පතෙක් (මිලි 516¹⁶).

කුඩු†= 1. පක්ෂීන්ගේ ගෘහය; කදල්ල. 2. කරත්තවහල 3 මුලින් |මහත් අහින් සිහින් කවංකාර දෙය.

කුණ(න)ම්=පල්ලැක්කිය (සඬ 194³. 437⁹. 476¹⁴. සලී 1. 204⁵. 367⁷).

කුතාඩිවරඹිලුව= රජු යන පෙරහැරවල නවතවා ගිය මලුවිශෙෂයක් (දඹ 8²¹).

කුද්ද(ඩ)† (<කුබුද්ව<පුබුදුව)= කිද්දීමෙහි. සක. කුද්දු කුද්දත්; කිද්දී කිද්දූ.

කුද්දන†=පුබුදුවන; අවදි කරවන.

කුනි†, කුනිසි†=කුඩාඉස්සා.

කුප=වළ; ලිඳ (පඤ්චි 122³). -තට=වළක ඉවුර (බජ 148¹⁴). -මණ්ඩූක=1. ලිං මැඩියා; 2. එවැනි වූ මඳ දෙයක් ම දන්නා.-කාසත්‍ර= සිවුසැවකලාංවන්ගෙන් එකක්; ලිං කැණීම පිළිබඳ ශාස්ත්‍රය (පූ 2. 147¹⁵. සඬ 88³).

කුපාලය=ලිඳ ලඟ සෑදූ ගෙය (සර 206¹⁶).

කුපී=කුප්පිය.

කුබර='කිඹුල්මුව' බ. (බජ 73¹⁴).

කුඹි†=කුහුඹියා.

කුරපසි†=බඩු දමා පෙරැත්තට වැටෙන සේ එල්වාගෙණ යාහැකි පසුම්බිය.

කුරැසි†, කුරි†=මත්ස්‍යයා.

කුරු=1. ඔහන් නුවූ දික් ලිඳාදි පතුර; ඉරටුව (සඬ 197¹⁰). 2. මත්ස්‍යයෙක් (රෑ 149). 3. එනම් තම්පලාගස (යො 715). 4. ඇතුන් පිළිබඳ කටයුතු කරණ මණ්ඩලය හෝ නිලය (නිකා 21¹⁴). (පුරාතනයේ දී අටකුරුවක් වූ නමුත් මහතුවර රාජධානි කාලයේ දී සතරකුරුවක් වී ය-සුපූ 10³²). 5.නංඩුව; බුව(රස ගැ). 6.මහත් වූ ලොමය; නාරටිය (යො 3492). 7. මාතෘජාතියක් (යො 3618). -අඬි†=ආභාර තබා ගෙණ සෑම සඳහා කුරුවලින් සෑදූ වට්ටිය. -මුසුන්=ඉරටු මුඩුන (මිලි 56). 9†=දිග වලිග යක් ඇති අැස් ලොකු මැසිවෙසෙස. 10†= සත්‍රින් කොණ්ඩයෙහි ගයන ආභරණය.

කුමී=ඉදිබුවා (මිලි 519²⁷). -ග්‍රහණ=ඉදිබුවාගේ ඇ ඇණීම වැනි දඬි ගැන්ම(ජාස 88³⁴).

කුල්=කුහුල; සැකය (පරෙවි 113).

කුල=ඉවුර (සැළ 32).

කෘ

කෘකවික්‍රමර්ම=උකුණු වළෙහි පිහිටි මර්මයක් (යො 4115).

කෘකවික්‍රාන්ත=උකුණුවළ (යො 4111).

කෘවල්ක්‍ර=දුක; අමාරුව. -අර්ථ=අමාරු ය යන අර්ථය (පසා 255³⁰). -සාධ්‍ය=අමාරුවෙන් සිද්ධ (හෝ සුව) කට හැකි.

කෘන්=සං. ධාතූන් කෙරෙන් යෙදෙන ප්‍රත්‍යය වර්ගයක් (පඤ්චි 24³).

කෘත=කරණලද. -අඤ්ජලි=අැඳිලි බැඳි (සඬ 130³). -අධිකාර(රී)= මහපින් කළ (සලී 1. 1²². සඬ 50³⁰).-අන්ත=යමරජ; මරුවා. -අභිනිහාර= කළ අභිනිහාර ඇති (බෝගැ 62²⁴). -අර්ථ= කළ අර්ථ ඇති; අදහස් සමෘද්ධ වූ (කාශී 1–77). -උපකාර=කළ උපකාරය (ජාස 1759). -උපකාරී=කළඋපකාර ඇති(අභිස 152³⁰).-ඌ=1.ක්‍රියාවෙන් නිපන්;

අමුතුවෙන් කළ (කංසී 2-243). 2. සබහාව යෙන් නිපදිමෙහි දී අන්‍යහෙතූන්ගේ ද උප කාරය වුව මනා පදාර්ථය(නාගය 24^{21}).-කර ණීය(පිලි 152^{13}), -කෘත්‍ය (බුත් 127^{14})= කළ කටයුතු ඇති; කටයුත්ත නිමවූ. -ඥ= කළ උපකාර නොදන්නා; කළ ගුණ නො දන්නා (අවද 10^{6}). -ඥ=කළ ගුණ දන්නා; කළ උප කාරය උසස් කොට සලකන (ජාය 64^{19}). -ඥන=1. කරණ ලදැයි දනිම. 2. 'දුඃඛය පරිඥත ශ' යනාදීන් මාර්ගඵලඥානවල උපදනා ඥානය (බප්‍ර 229^{16}). -ඥතා=පින් කළ (සැළ 3). -ඥතාශ=කරණලද්දා වැනසීම (වි 6. 307$^{1-2}$). -ඥාල=ඇසළඟස (සැළ 42). -ඥාශ=ලොව ඉතා සමෘද්ධ වූ පවතින, වසී 17,28,000 ක් වූ, කල්පයෙහි ප්‍රථම භාගය (දළ 12^{19}. සද්ධ 36^{10}). -වෙදි=කෘතඥ (ජාය 64^{19}). -හඤ=1. ඉතා පල පුරුදු. 2. ධනුශ්ශිල්පයෙහි අතිදක්ෂ (බප්‍ර 200^{6}). [128^{9}. බප්‍ර 308^{19}).

කෘතඤ්ඣාන්ඣඹී='කටත්තාකවම්' බ. (අභිස

කෘතී=1. කිරීම. 2. කෘත්‍යය.

කෘතනිඤා=කැනිනැකත (පඤ්චි 130^{16}).

කෘත්‍ය=කටයුත්ත(අභිස128^{7}). -කර,- කාර, -කාරී= කටයුතු කරණ (වි 1. 172$^{1-20}$). -ඝන=ඝනශක්‍ති හෙවත් එනක්සේ සැලකෙන ඥානාවිත්තසඤ්ඤණයන්හි වන ක්‍රියාසන්තතිය (වි 8. 3$^{2-1}$). -ඥන= 1. කටයුතු දනිම. 2. 'දුඃඛය පරිඥෙය ශ' යනාදීන් දන්නා ඥානය (බප්‍ර 229^{14}). -වන්=කටයුතු ඇති.

කෘත්‍යාකාලප=කටයුතු හා යෑම් ඒම් ආදී ආකාරය (වි 5. 62$^{2-22}$).

කෘත්‍යාපදෙශබහුල=කටයුතු අමාරු බව දක්වීම බහුල කොට ඇති (උපා 157^{32}).

කෘත්‍රිම=ක්‍රියාවෙන් නිපන්; අමුතුවෙන් සෑදූ.

කෘෂ්ණ=1. සිඟල්ල. 2. පඨවිකසිණාදිය. -ආකාශ=කසිණය සේ ගන්නා අහස (අභිස32^{9}). -උද්ඝාටජාකාශ=කසිණුග්ඝාට මාකාසය (අභිස 32^{10}). -පරිකර්ම=කසිණ භාවනාව (සර 223^{1}). -මණ්ඩල=කසිණ මණ්ඩලය (බප්‍ර 315^{20}).

කෘදන=('කෘත්'ප්‍රත්‍යය අන්ත කොට ඇති (අත්‍ථක්‍රියා) ශබ්ද (පඤ්චි 4^{17}).

කෘද්විධි=කෘත්ප්‍රත්‍යය පිළිබඳ විධිය (විමු79^{37}).

කෘපණ=දුගි; දීන; බැගෑපත් (සද්ධ 276^{9}).

කෘෂා=කරුණාව (පඤ්චි 3^{9}).

කෘෂි=පණුවා (වි 1. 404$^{2-7}$). -කුල=පණු සමූහය (සර 258^{1}). -ගුථ=පණුවන්ගේ අශුචි (පිලි 135^{21}). -නාඝන=1. කෑමින් නසන. 2. වළඟසාල්. -ඵල=අත්තික්කා(වන28).

කෘෂ්ණ=කෙට්ටු (ජාය 468^{29}).

කෘෂි=සී සෑම.-කර්මාන්ත=ගොවිකම්(බස13^{23}) -ඵල=කෘෂිකර්මයෙන් ලැබෙන ඵලය; අස් වැන්න. -හාණ්ඩ=ගොවිකමට වුව මනා භාණ්ඩ උදලු ආදිය (කඛා 113^{9}).

කෘෂීවල=සීසාන්නා; ගොවියා (ජා 1121^{1}).

කෘෂ්ට=ඌනාලද.

කෘෂ්ණ=1. කළු. 2. විෂ්ණුග්‍රහයේ අවතාරයක්. -ජීරක=කළුදුරු (උපා 268^{32}). -පක්ෂ=කළු වර පක්‍ෂය(පහ 36^{26}). -මණ්ඩල=කළුඳංගිරියාව(අභිස 152^{24}). -මාෂ=කළුමැවා(ජාය 72^{23}). -වර්ණී= කළුපැහැය (පසා 173^{22}). -වර්තනි(=වර්තමන්?)=ගින්න (ජාය 225^{4}). -ශෛල=කළුගල (උපා 272^{23}). -සර්පී=නයා (ජාහ 217^{15}).

කෙ

කෙ(නි)=1. කවර; කෙබඳු. 2. (නාප)=කවුරු (කව් 229. 634. සිද්ත් 84^{4}). -තක්ක්= කොතරම්(බහ 226^{26}. සලී 1.198^{5}. සද්ධ125^{15}). -නම්=කිනම් (බප්‍ර 245^{11}. වෙස 383). -පමණ=කොතරම් (ජාහ 26^{31}). -ලෙස්=කෙබඳු. -සා=කොතරම්(කව් 200). -විතර= කොතරම් මහත් (සලී 1. 57^{1}). -සෙනි (හෙසි 53^{1}), -සඟින් (බහ 26^{23}), -ඉස්= (පඤ්චි 14^{20}),-සේනි(කව් 539)=කෙලෙසින්; කවර අන්දමින්.

කෙකෙවිය= දිය තුළ වැවෙන පැළෑටියක් (යො 2327. 2333). [කරණ ඔබක්.

කෙකර†=1. වපර. 2. කෙදිරිය. 3. කිකිළියන්

කෙකා=මොනරහඬ (බප්‍ර 281^{23}). -නාද (සර 131^{9}), -රුවූ (කව් 267), -සන් (මගු 37) -සර(සද්ධ110^{1})=මොනරහඬ.

කෙඬාල=කෙකඃනාදය කළ (බුත්22[34]. ස්තූ 64[35]). [බැදි රිව.

කෙකි†=ගෙඩි කැඩීම සඳහා අග කොක්කක්

කෙකිනි=කොක්දෙන (බපු120[8]. පඤ්චි116[10]).

කෙටවිලි(-විම්)=1.පහර දෙවීම. 2.උදුල්ලෙන් පස් පෙරළීම. 3†=දෙදෙනෙකුන් අතර කලහ ඇති කරවීම.

කෙටි=1. කුණ්ඩ; කොට (ජාගැ 79[10]. දහම් 115[12]). 2. ගෙවී නිය උදලු ආදිය.

කෙටි†=මිටි සත්‍රිය.

කෙටුම්=1. පහර (ජාගැ 129[1]. රාජා 29[20]). 2.උදුල්ලෙන් පස් පෙරළීම. -පන්†=ලෙඩ නගක මුලින් ම සෑදූ පිටපත. [245[9]).

කෙටුව (නෙක්‍රි)= පහර දුන්නොත් (ශිසං I.

කෙටු=1. කොටනලද. 2. මැරූ; පහර දුන් (ශිසං I. 44[18]. 203 [3]).3. (ගල් ආදියෙහි) හැරූ (කඩිඃ 21[31]).

කෙටෙ(ෙච්)සි(<කුඨාරි)=1.පොරොවෙ(රු 358. පුනා 206). 2. පොරොව වැනි දිග මිටක් ඇති ආයුධය (ජාගැ 101[31]. හෙසි 26[3]).

කෙට්ටු†(<කෙට්ට-ද්‍ර)= දිරාගිය; මස්නැති.

කෙඩෙන්තු†=1. වෙහෙසුනු. 2. වෙහෙසීම.

කෙණවි? (පුක්‍රි?)= විකිණ (=මිල දි) ගෙණ (ශිසං IV. 123[1]).

කෙණෙර='සරෙණුකා' ඛ (මුව 150). -'හන= ඇතින්න (රු 342).

කෙණෙසි=කෙවෙරිය (ඛගැ 179[27]).

කෙණෙසි (<කථවතු)=1. හැන්ද (ඛගැ 69[29]). 2. දිනමිටක් ගැසූ පොල්කැටය. -අහර= එක් එක් ගෙයින් හැන්ද බැගින් ලැබෙන ආහාර (බපු 165[31]).

කෙණෙහි= 1. කෙණෙසි (ඛගැ 116[9]). 2. (නාප)= (කණ + එහි)= ක්ෂණයෙහි (ඛගැ 12[27]).-අහර=කෙණෙසිඅහර(සලී 1. 24[26]).

කෙණ්ඩ= පයෙහි දණහිසට හා වළලුකරවත් අතර කොටස. -පෙරළීම= කෙණ්ඩයෙහි මස්පිඬු පෙරළීම (ඔං 1139).

කෙණ්ඩිය=කෙණ්ඩය (සද්ධ 165[36]).

කෙණ්ඩි= එනම් ජලහාජනය (ජාගැ 47[28]. 16[30]). -කය=කෙණ්ඩිය (හෙසි 4[13]).

කෙඩි=කෙණ්ඩිය (සැළ 15. කඩිඃ 106[33]).

කෙත්=1. ක්ෂේත්‍රය; ධාන්‍යාදිය වැවෙන තැන (ථූප 8[20]). 2. සුදුසු භූමිය (වෙස 33). 3†= රජුට අයත් භූඹුර (A. R. K. 116). -කම්= භූඹුරුවැඩ (ශිසං I. 43[3]). -පල් (පුනා 210), -පළු (රු 367)= ක්ෂේත්‍රපාල කයා; ගොවියා. -වත්= 1. වෙල; භූඹුර (රු 556). 2. කෙත් හා වතු.

කෙතඬ=ක්ෂේත්‍රය (ශිසං I. 254[3]. 255[18]).

කෙතපල= ක්ෂේත්‍රපාලය; අස්වැන්න (ශිසං I. 32[12]). [විවනාගතය).

කෙතා= අය; නැනැත්තා. ('කෙනෙක්'- බහු

කෙනෙහිලි(-ගිම්)†= 1. කෘතඥතාව. 2. සුළු විරුද්ධකම. [රජා (ඛගැ 238[1]).

කෙනෙසි(ම්?)බෑ= කාන්‍තාත්‍රාතෘ; බාලයහොඳ

කෙන්දඟම්†='ගණිකා' නම් ධාතුවිශෙෂය.

කෙදනොවන=නොකැඳවන? (සි 254).

කෙදිරි=කූර; ඉරටුව (ජාගැ 89 අටඛා). ඉසකේ වැනි ගින් දික්දෙය (පූ 2. 329[14]).

කෙදිරි=1.දුක්මුසු අවියත් හඬ(භාගෙ 10–65).

කෙදිරිම්=වෙහෙන් කිම.

කෙප්ප†= බොරුව; අසත්‍යය. -බාත(ශ්‍ර)= උදර වාතරොගයක් (ඍ). [26[13],[34]).

කෙබුක් (<කෙබුක-පා)= ජලය (දජා 24[40].

කෙම්=1. ගල්පොකුණු; ගල්වළ(වි 1. 427[1–22]) 2. කවුඩුකැකිරි (ශුඛිංඅ). කෝවක්කා (රු 222). 3. ක්ෂෙමය; ආරක්ෂාව; රොගනිවාරණාදිය සඳහා කරණ ක්‍රියාව (සලී 1. 167[25]. 950[26] පූ 2. 356[10]. යොං 4503). -කර= ක්ෂෙමඞ්කර (පූ 2. 41[32]). -ගෙඩි, -පල= කෝවක්කා ගෙඩිය(බෝගැ 127[11]). -මුර= දෙවාලයවල බදද හා සෙනසුරාදන් කරණ පූජාව (G). -ාද=කෙම්මුර පවත්වන බදද හා සෙනසුරද දසී යන දෙදින (යොං 321). -වර=කෙම් කරණ දෙදින(යොං 3321).-වැල (ළ)=ඉදුනු කෙම්ගෙඩිය (පූ. 2. 190[25]. සද්ධ 166[12]). -විටපහණ= වළක් සහිත ගල් තලාව (ඛගැ 134[28]).

කෙම්පා=කුප්පමේනිය (වන 66).

කෙරව?=ක්‍රමය; පිළිවෙළ (පුනා 183).

කෙරන්= කෙම්න (මනි 33[5])

කෙමැලි= දියෙහි මතු වන පෙන (පුනා 81); මූදුපෙන (වෛද).

කෙමි= 1. කර්ණිකාව; මල්බවට (බුදු 517. සර 15[4]). 2. කෙණඩියෙහි දිග පිට වන නළය (සර 514[32]). 3. කෙමිය (හෝ) කුමය (කාගෙ 1-3). [යක් (ජාගැ 1431[1]).

කෙමින්, කෙමෙන්-මසුන් අල්ලන උපකරණ

කෙඹි= කුඩා සත්‍රය (පූ 2. 550[16]).

කෙඹෙන් (ජාගැ 94[23])='කියන්' ශ්‍රුයි?

කෙඹුරු=කේසුරය (රැ 297).

කෙර†=කොර සත්‍රය.

කෙරවිලි†=කරවිය (ca).

කෙරමිනියාකම්†=සුළු විරූධකම්.

කෙරවක්='කොරවක්' බ. (කාගෙ 2. 4-2).

කෙරවල=1. කෙළවර; අන්තය (කාගෙ 10-89). 2. ගම්වසමකින් භාගය. 3. කදකින් භාගය (G).

කෙරෙන් (නාප)=කර + එන් (=වෙතින්).

කෙරෙම=ක්‍රමය (කාගෙ 14-29. රැ 319).

කෙරෙයනි? (නාප)= කරමු? (ශිසං IV. 1234- "කෙරෙයනි ම අතනො සිමෙ").

කෙරෙවි?=සන්‍යාභය (රැ 351). [(=වෙත).

කෙරෙඹි (නාප)= කර + එහි (බගැ 19[24]).

කෙල්=කොහෙල් (ශිසං I. 116[27]).

කෙල= 1. අඹුරය (රැ 195). 2. මංසේපෝය (රැ 78). 3. කවෙනි උපදනා දවය; කොළ (සිබ 541[2]). 4. කෙහෙල්. -එල්=විෂ සහිත සර්පයෙක් (යෙං 4429). -ගේ= කදලිගෘහය; ගෙයක් මෙන් සිටින සේ කොහෙල් වැවූ කැන (පැළතවාන හිද කියති). (ශිසං I. 32[19]). -මල්ල= කෙළපඬික්කම (සිබ 83[32]).

කෙලඹි=කැලඹි (සි 520). [(රැ 113).

කෙලි=1. බාලිකාව (පූ 2. 82[10]). 2. කේලම

කෙලෙස්=1. කෙලගය (බගැ 4[14]). 2. කෙලෙස පවිතය (කව් 27). -කම්=කෙලග කාමය (බගැ 10[17]). -කෑස්-කෙලග නමැති වතු ලැහැබ (සිදත් 1491). -කුඵ (සිදත් 68[3])= කෙලෙස්සකුවය. -කෙළි=මෙවුන්දම (බගැ 256[3]). -ගල් (කව් 55), -ගිරි (රැ 48)= කෙලෙස්සපවිතය. -ගිනි= කෙලග නමැති අග්නිය (උපං 25[23]). -නිවෙස්=ඊශ්වරයා (රැ 26). -පොපි= කෙලග කැසුම හෝ සෙලවුම (බගැ 74[29]. 2591[4]). -මාර= කෙලග නමැති මාරයා (ස්තු 3[20]). -රජස්= කෙලග නමැති ධූලි (උපං 25[25]). -ලව= සවලපමාත්‍ර වූ කෙලගය; කෙලෙස්කොටස (බෝගැ 117[34]). -වට=කෙලගවෘත්තය (ජාගැ 42[25]). -වන=කෙලග නමැති අරණ්‍යය (උපං 25[20]).

කෙලෙස(බා)=කෙලෙසිමෙහි. සඤ. කෙලෙසා කෙලෙසත්; කෙලෙසී කෙලෙසු.

කෙළෙස= 1. කෙලගය. 2. කෙලාසය. -'ඟ= 1. කෙලෙස්ගින්න. 2. (නාප)= කෙඳලස් තුළෙහි මුදුන (කාගෙ 1-2). -හිඳි-කෙලෙස් ගල (සස 42). -තමස්= 1. කෙලග තමැති අන්ධකාරය. 2. කෙලගයන්ගෙන් වූ අදුර (සස 244). -තල= කෙලාසපවිතයෙහි තැනිතලාව (කව් 564).

කෙළෙසි (කව් 629)}
කෙළෙසනු }=කිලුටු වූ.

කෙල්නාරං=ගල්සෙවෙල් (වෛ).

කෙල්ලි=සුදුකාරයා (අභිධාප 72[30]).

කෙවිටි=කැවිට (සර 115[2]). -ලී=කැවිටි කෝටුව (මිලි 29[32]).

කෙවින්= 1. කුවේණිය (බෝගැ 143[18]). 2. (නාප)= (නෝ + ඉන්) = කොපයෙන් (බගැ 281[17]).

කෙවිනි=1. කොන (ජා 458[16]). 2. ආභරණ යන්හි මැණික්ඔබබන අවයවය (සර 231[21]).

කෙවිල්=කොවුලා (කව් 419).

කෙවිලි=1. කොවුලා (සද්ධ 109[34]). 2. නහුලෙහි නිමුන්ටිව (පූ 2. 355[22]) 3. සමූහය; කොඩ (Ca). -රජ=කොකිලරාජයා (අමං 2. 128[23]).

කෙවුනු=1. කඩකණය (කව් 3). 2. ආභරණ යන්හි මැණික් ඔබබන අවයවය (බුත් 70[22]. 230[18]). [වන ඇනීම (යෙං 749).

කෙවුම්?= ඇසෙහි කුණක් වැටුනුවිට ඇති

කෙවුල්= 1. කොකිලයා (බජ 281[22]). 2. කෙවුලා (ජා 104[3]). -වමි= කොවුල්දෙන (බෝගැ 55[21]).

කෙවුල(බා)=හැඟවීමෙහි; දක්වීමෙහි. සඤ. කෙවුලා කෙවුලත්; කෙවිලී කෙවිලූ (මුව 23. 29. සිහ 130. රැ 408).

කෙවුලි=කොවුලා (එස 38). [2649].

කෙවුළු(<කෙවට්ට)= මසුන් ඉරන්නා (බගැ

කෙවෙ(<කොවෙ?)=පක්ෂියෙක් (වෙස 367).

කෙවෙනි

කෙවෙනි=නහුලෙහි නිමුන්මිව (Ca).

කෙවෙන†=කැවෙන; ඇනෙන.

කෙවේ(ක්‍රිවි)=කෙවි + ඒ (වි 8. 283[1–9]).

කෙස්=හිසෙහි නිබෙන දික් වූ රෝම. **-අග්**='කෙසග්' බ. **-දැ**=කෙශබාහු (දළ 10[13]). **-පුඩු**= කෙශරාශිය; කෙශසඞ්ඝාව (සර 149[31]). **-මුවා**=කෙස්වලින් කළ (සිබ 59[22]). **-°පලස්**=කෙශකලාපය (පූ 2. 451[7]). **-වැටි**= කෙශකලාපය (ගිරා 73. සඩ 70[23]). **-වැල** (ළ)=ආභරණයක් (බුත් 303[31]).

කෙසඟ=1. ගුගුල් 2. කංසාඇට (වෛද්‍ය).

කෙසකිළි†=මූත්‍රකරණ නුටිය; ප්‍රස්‍රාවදෝණිය.

කෙසඟ්=කෙශාග්‍රය (ථූප 160[13]).

කෙසර=1. ලොම්ගය. 2. සිංහයා. **-බැටිල** (යෝ 2610), **-බැවිල** (යෝ 748. 2166)= බැවිලගස්ජාතියක්. **-රජ**= රෝමරාජිය; ලොම්වැල (කව් 206). **-ඝතු**?= එරණ්ඩතෙල් (Ca). **-ෂි**=කේසරසිංහයා (කව් 142).

කෙසරිල්=කෙහෙරැලි? (යෝ 4230. 4233).

කෙසරු=1. ලොම්ගය. 2. මල්රෙණු (සැළ 2). 3.මූනමල් ගස (රූ 209). **-බර**=රෝමභාරය; ලොම්රැස (පූ 2. 606[13]).

කෙසි=1. කෙශය (රූ 270). 2. දෙරෙහි ඇතුර (බඟු 172[21]. ජාඟු 1133) **-පසි**=ඇතුර දමන පසුම්බිය නෝ කොපුව් භූ182.192). **-මුදු**=ඇතුරුමුද්ද (බප්‍ර 129[33]). **-මුදු**=කෙසි මුද්ද (ශිසං II. 212[26]. **-ඇතුරු**= කෙසි නම් වූ ඇතුර(සර 517[34]). **-වර**=ඇතුර ලබන වරය; හෙයි දෙර ඇර ඇමදීම ආදිය කරන්ව ලැබෙන වරය (බඟු 133[3]). **-විද්**= (සලී 1. 598[25]. හෙසි 24[5]. පූ 2. 130[32]). **-සිද්**(අමං 1. 203[12]), **-සිදුරු** (බුත් 228[3]. වි 4. 252[1–31])=ඇතුරුකඩුල්ල.

කෙසුන්(ම්)=ලොමුදහ ගැන්ම (රූ 122).

කෙසුර්=කෙසුරු (සි 58, 583).

කෙසුරු=1. ලෝම. 2.මල්රෙණු (ජාඟු 65[22]). 'කේසර' බ. **-බර** (අමං 2. 110[29]), (බෝඟු 81[1])=කෙසරභාරය. **-සළා**=ලොම් සුළි (සඩ 36[19]).

කෙසෙල්= කෙහෙල්ගස. **-කැන්**= කෙසෙල් ගෙඩි වල්ල. **-බඩලි**=කෙහෙල්පතුරු (යෝ 830). **-මුව**= කෙසෙල්කැන හැඳෙන මල (යෝ 1063). **-වඳු**=කෙසෙල්කැන (රූ 549).

කෙහට=හපය; විකා දැමූ රෙංඩිඩ (සිදත් 77[3]).

කෙහෙ=1. කෙශය (ඛඟු 46[13]. කම් 630. සඩ 203[1]).2.ලෝම(අමං 2.36[1]).2. කෙතකි ගස. **-අරළු**=වැවකේහසෙහි කඳින් ඇදෙන මුල් (යෝ 646. 649. 4066). **-කලඹ**= කෙශකලාපය (බෝඟු 57[31]). **-පත්**=කෙස් වැටිය (සිය 277). **-මදන**(රූ 525), **-මෑදුම්** (රූ 294)=පණංව. **-රැලි**= කෙහෙඅරළු? (යෝ 4028). **-ලොම්**=1 කෙස් හා ලොම්. 2. කෙශය වූ ලොම්ගස (පූ 2. 145). **-වරළු**= කෙශාවතීය; කෙස් සුළිය (හෙසි 611).

කෙහෙහට='කෙහට' බ. (රූ 481. 582).

කෙහෙහුබ්=කැවිව (බෝඟු 121[23]).

කෙහෙතු†=කේතු නම් ග්‍රහයා.

කෙහෙල්1.'කෙසෙල්' බ.(මුව 140. සර31[22]). 2. මුවවෙසෙසක්-**කොරණ**=කෙහෙල්ගසින් සෑදූ තොරණවිශෙෂය (දහම් 193. 355[23]). **-මුව**=1. කදලිමෘගයා (පූ 2.97[27]. වෙස376). 2. කෙසෙල්මුවය. **-ඇට**=1. කෙසෙල්තුලින් විසූ සළුව. 2. සළුව වැනි කොහෙලදළුව(බුත් 276[4]). **-සුලපන්**=කුඩා කෙසෙල්කොළය? (සඩ 93[36]. 49[19]).

කෙහෙලැඩ්=මසුවෙසෙසක් (සෘයා 632. 2994).

කෙහෙලි=1. කොඩිය (මුව 21. 117). 2. ශුක්‍ර ඛාහුව (රූ 273).

කෙහෙලාම්=කේලම් (ජාඟු 1596).

කෙළ(ඛා)=කෙළිමෙහි; ක්‍රීඩා කිරීමෙහි. අකා. කෙළි කෙළින්; කෙළි කෙළි.

කෙළ=1.(<කොට්)=අන්තය(ඛඟු 219). කොණ (ඛඟු 12[2]) 2.ලක්ෂ සිඟය (බුදු 208) 3. රූක් කඳ (රූ 198). 4. අග; මුණිය (රූ 359). 5. අලඞ්කාරය (රූ 654). 6. මුහුදුවෙරල. 7. දුනුමුඛාව (ශු සිං අ). 8. කටෙහි උපදින ද්‍රවය. 9.(නි)='බොල' යන අරුත්නි (ඛඟු 228[8]). 10. ලා; තොමේරු (රූ 654). **-°ඟනා**=කෝටියක් අඟනා (බප්‍ර 322[3]). **-ගලනු**=කෙළ වැගිරෙණ(ඛඟු 5311). **-ගල් වන**=අංගා කරවන (බුත් 270[2]). **-ගොවු**= පණික්කම (ජාඟු 105[13]). **-°තු**=සිවුරෙහි දෙපැත්තෙහි කොන්නි අතු දෙක (අභිධාස 41[20]). **-තොලු**=නිතර කෙළ වැගිරෙණ තොල් ඇති; දෙඛමලු; මෝඩ (දහම් 374[17]. සලී 1. 498[2]). **-මලා**=පණික්කම (බප්‍ර 310[31].

ජාගැ 105[13]). -මෝල්ගස්†=විල්ල සහිත මහමෝල්ගහ. -වර=අනන්තය (බගැ 391[3]). -සුවහස්=කෝටිලක්ෂය (අමං 2. 4[39]).

කෙලෙන=ක්‍රිඛං කරණ (නිසර 73).

කෙලෙන්නු=ක්‍රිඛා කිරීම (නිසර 147).

කෙලෙඛ=භූවුම්බය; සම්පත්තිය (බගැ 173[11]).

කෙලෙඛි=භූවුම්බිකාය (බගැ 13[29]).

කෙලෙව(බං)=1. සෙලවීමෙනි; වැනීමෙනි; ඇදීමෙනි. 2. ක්‍රිඛං කරවීමෙනි. සක. කෙළවං කෙළවන්; කෙළවී කෙළවූ (ජාස 31[31]. සිඛ 79[6]. ජා 109[36]. අවදූ 4[24]. බගැ 256[9]).

කෙලෙවීම=සෙලවීම (බස 139[17]).

කෙළි=1. ක්‍රිඛාව (බගැ 252[33]). 2. විහිළුව (අමං 2. 44[2]). -කම්ල්=ක්‍රිඛා පද්ඛය; ක්‍රිඛාව සඳහා ගත් නෙළුම්මල. -ගේ=1. ක්‍රිඛාගෘහය (වෙස 180). -දල=1. ක්‍රිඛාඛූරය; ක්‍රිඛාවන්හි යෙදීම (බප්‍ර 281[29]. කව් 30). 2. මෙවුන්දම (පුනා 86). -නළු=ක්‍රිඛානාටක; සෙල්ලම් නා නාඛගම් සඳ 536[3]). -නැළි=ක්‍රිඛාවන්හි දී මනින නැළිය (මිලි 269[41]). -පියෝ=ක්‍රිඛා ප්‍රකාශිය; සෙල්ලම් කරණ ගතිය (ජාගැ 130[13]). -පෙදවට=ක්‍රිඛාකාණ්ඩය; සෙල්ලම් පන්දුව (දඛම් 332[22]. ථූප 25[7]). -බඹු(ඛු)=ක්‍රිඛාභාණ්ඩ; සෙල්ලම්බඩු (වෙස 428. 505). -බන්=ක්‍රිඛාවෙහි දී වැලි ආදියෙන් පිසන්නාක් මෙන් සාදන බත් වැනි දෙය. -මඩුඩු=ක්‍රිඛාමණ්ඩලය; සෙල්ලම්පිටිය (ස්තූ 22[32]. බුත් 11[10]). -ගහළු=ක්‍රිඛාසහායයා; සෙල්ලම් සඳහා එන මිත්‍රයා (බුත් 22[29]). -ලූළු=කෙළිනළු (සලි 2. 116[29]. 243[13]. 458[14]). -ලොළු(සලි 1. 812[26])='කෙළිලළු' ශුශ්‍ර. -ලිඝ=ක්‍රිඛාලතා; සෙල්ලම් සඳහා යෙදුනු වැල් (ජා 937[23]). -ලොල්=ක්‍රිඛා ලොල; සෙල්ලම් කිරීමට ඉතා කැමැති (බුත් 40[4]). -වත්තම්=ගස්ගෙඩිවලින් සාදන භාජනයක් (කඛඛා 112[13]). -වළඳ=ක්‍රිඛා සඳහා යෙදෙන වලඳ (බුත් 325[24]). -වෙළඹි?=ක්‍රිඛාවිලඹි? ක්‍රිඛාවෙහි යෙදුනු (සලි 1. 503[39]).

කෙළිකු(නෙක්‍රි)=ක්‍රිඛාකරණ කල්හි (කව්25).

කෙළින්=1. කඨිනය (සිඛ 10[34]. ප්‍රාස 35[15]). 2.(ක්‍රිවි)=ඍජු ව. 3.(ථූප509)='කෙළිල්ලෙන්' ශුශ්‍ර. (සද්ධ 471[2] ස.) -අනුභස්-කඨිනාභිසංසය (කඛඛා 43[29]). -කඹින් හිඳීම (මාතලේ)†=ඇන තබාගෙණ හිඳීම.-සිවුරු=කඨිනවිවරය (දඹ7[18]. සලි 1. 1023[1]).

කෙළින්ද='කෙළිද' බ. (යෝ 1422. 1424). -බිල්ල=කෙළිදසඟල් (යෝ 396. 3012).

කෙළිද='කුවජ' නම් ඔසුවෙසෙස. -ඟහල්=කෙළිදඇට.

කෙළිදි=කෙළිද (සස 79).

කෙළිඹි=කුටිම්බිකාය (සලි 1. 30[19]).

කෙළියෑ (නෙක්‍රි)= විඟන්ව; තළන්ව (සිඛ 72[7]). 'කොළ (ඛං)' ඛ. [පූ 2. 342[15]).

කෙළිලි=උකකුටිකාය(බුත් 211[32]. ජාගැ 111[33].

කෙළි(ළු)ම=ක්‍රිඛාව (කාගෙ 4-13).

කෙළු=විඟු; තැවූ (සිඛ 71[2]). 'කොළ' (ඛං)ඛ.

කෙළෙනා=ක්‍රිඛා කරණ (මුව 150. සද්ධ45[26]).

කෙළෙබිරු=කලෙබරය; ශරීරය (සුදූ342).

කෙළෙඹ='කෙළඹ' බ. (බගැ 171[4]).

කෙළෙඹි-භූවුම්බිකාය; ධනවතා (බගැ 27[27]. පුනා 232). -කුල=වෛශ්‍යකුලය (ජා 502[1]).

කෙළෙස්?=කෙලඟය (ශිසං I. 130[20]).

කෙළෙනි (නාප)= කළ + එනි (බගැ 139[11]). -උපකාර= කෙළෙනි ගුණය (සද්ධ 254[18]. 259[5]. 261[27]. 262[26]. 263[1]). -ගුණ=කළඋප කාරයෙහි ගුණය (සද්ධ 262[22]). -°ලක්ඛණ =කෘතඥයා; කළ උපකාරය උපස් කොට සිතන්නා.

කේ

කේ=1.කෙඟය (සර 168[11]). 2. කෙත(රූ583). 3. කෙතකි නම් ගස. -පත්=කෙඟකලාපය (ජා 274[14]). -මල්=පෙනෙරැස (ප්‍රානි 38). -මැලි=1. කෙතකිපුෂ්පය. 2. කෙඟගෙහි වූ මාලා (කව්.449). [ආහාර ද්‍රව්‍යයක්.

කේඳු†=කිරිවෙඩරුවලින් සාදනු ලබන කෙටුහ=කවීන්ට උපකාර වූ ජනුස්, ජාති, වාසභ, වෛදර්භී ගෞඩ මාගී ආදී මොවුන් ගේ ලක්ෂණ ප්‍රකාශක ශාස්ත්‍රය (බෝගැ 116[22]. සලි 1. 74[3]).

කේඩර†=කෘශ. [(පූ 2. 129[24]).

කෙතක=වැවකේ දුනුකේ කරාකේ ආදී ගස්

කේතකි='කෙතක' නම් ගස. -කෙල= වැටකේඟදිය ගෙණ සිදින බෙහෙත් තෙලක් (යෝ 2976). [බදුන.

කේතල†=දිය උණු කරණ ලොහොමුවං

කෙකු=1. එනම් ග්‍රහයං. 2. කොඹිය (මුව 21). 3. නොත. -මාලා=බුදුරජාණන්ගේ හිසින් වඩුරියනක් පමණ උඩට නැඟි බබලන රශ්මිකදම්බය (පූ 2. 602[25]). -°අලඞ්කාර=පැරසිල්ලක් වූ කෙතුමාලාව (සර 6[22]). -°ජාල=කෙතුමාලාරාශිය (බප 14[2]). -°රතන=අන්කෙනෙකුන්ට නැති. දුලීභ වූ, එහෙයින් ම රත්නයක් වූ, කෙතු මාලාව (බප 13[24]).

කේදගන්†=දෙවියන්ගේ අශුඛ පෙරඟැරවල ගෙණ යෑමට ලීකෝට අංදීගෙන් සාදන දෙලාව (ධ). [මත්ත (ජාත 245[25]).

කේදර=කුඹුර (මිලි 385[26]). -කල= කුඹුරු

කේන්වි(නී)†=තරහ.

කේසු= 1. ජන්මලග්නය හා එයින් 4, 7, 10 වැනි ස්ථාන. 2. මධ්‍යය. 3†=ජන්මපත්‍රය. -කාර†=ජන්මපත්‍ර සාදන හෝ එහි ඵලාඵල කියන නිෂ්ණාතබ්‍රාහ්මණයා.

කේදෑරි†=කෘෂ්ණ; ඖන්දූරි.[රෙඛාව(දජා 73[33]).

කේඳි= පිහිගෙන් කපන දික් නොගැඹුරු

කේමල්=පෙන (ප්‍රානි 33). [(කවි 449).

කේමැලි= 1. පෙනපිඬ. 2. කොමලභාවය

කේසුරු=මුද්ද? (ප්‍රනා 169).

කේසුර (බඟු 162[16]. පඤ්චි 47[10]),-ආභරණ= අඞ්ගදඟහරණය (සද්ධ 91[21]).

කේල්= 1. කෙහෙල් (බඟු 197[3]). 2. 'කේලි' බ (බෝඟු 93[32]). -පත්=කෙහෙල්කොළය (අමා 2. 39[32]). -පතු= කෙසෙල්ගෙඹි මිරිකා පෙරාගත් පැන් (සිඛ 54[19]). -මව සම්= කදලිමෘගවම්මය (බප 320[22]). -වා= කෙහෙල්වැගිරි; කෙහෙල් පට්ටා. -°පිළි= කෙහෙල්වැගිරියෙන් කළ වස්ත්‍ර (සිඛ 59[34])

කේලම්= බලකම්ය; දෙදෙනෙකුන් අතර පවත්නා ප්‍රියභාවය නසන වචන (රූ 113).

කේලාඨ=කේලම් (දහම් 113[26]. ජාඟු 187[14]). -කෙපුල්=කේලම් වචන (කඞ්ඛා 60[24]).

කෙලාසන=1. නැළවීම (උපා 174[21]).

කේලි=1. 'කෙහෙලි' බ (මුව 29). 2. ක්‍රීඩාව. 3 (ඌව)†=විහිළුව. -ගොඡ්ඨි= ක්‍රීඩාසභාව; ක්‍රීඩා පිළිබඳ කථාව (සිංසාලි 65[27]). -ප්‍රකෘති= 'කෙළිපියෝ' බ (ජාස 171[19]). -රසික=කෙළිලොල් (සවී 34[36]).

කේලුම්=1. කෙඟ හා ලොම. 2. කෙඟසඞ්ඛ්‍යාත ලොම (බුත් 94[15]. 174[32]).

කේලෝම්=කේලුම් (පූ 2. 57[13]).

කෙවල= 1. හුදු; නානි; අව්‍යය. 2. සිඟල. 3. ලාංකික; එසේ මෙසේ; ගම්නම් (දළ 3[19]). -ගර්විතනාමඛ්‍යාත= හුදුගවීයෙන් වූ නාමය් කාරය (සර 2[6]). -නාමඛ්‍යාත= හුදුවැදීම (සර 2[5]). -පරිපූර්ණ= සිඟල්ලෙන් පිරිපුන්; සම්ප්‍රකාරයෙන් අඩුවක් නැති (සර 42[21]). -ශාශ්වතික=සිඟල්ල සදහාලික යයි අදහන (බප 314[11]).

කේවෙල්†=විකිළුව; ඔව්වම.

කෙඝ= නිපෙහි නිබෙන දික් ලෝම (වි 2. 907[1-4]). -අපහරණ= කෙස් බෑම (බප 297[12]). -කලාප= කෙස්වැටිය (ස්තු 21[1]). -කල්‍යාණ= යහපත් කෙඟය; නොපැසුනු, නිල්වන්,උඩුලතෙක් වැවෙන, අඟ උඩු බලා සිටින කෙඟකලාපය (බප 239[33]). -කූප= කෙස්ගස් තිබෙන සිදුර. -ධාතු= බුදුරජාණන්වහන්සේගේ ඉසකේ(ස්තු 79[21]).-පුට= කෙස්ගොටුව? (සර 93[14]). -ලුඤ්චන=කෙස් ඉගිල්ලීම (කඞ්ඛා 16[6]). -ශ්මශ්රු= කෙස් රැවුල් (ජාස 77[22]).

කෙඝර= 1. මල්කෙසුරු (සිය 137). 2. සිංහ ග්‍රීවාංගෙහි තිබෙන දික් ලොම. -සිංහ= බෙල්ලෙහි දික් ලොම් ඇති සිංහයා (පඤ්චි 11[26]). [සිංහරාජයා (සර 34[22]).

කෙඝරී=කෙඝර සිංහයා (බෝඟු 10[6]). -ඉන්ද්‍ර= කෙඝරාකෙඝරිශුද්ධ= එකිනෙකාගේ කෙස්වැටි අල්ලාගෙණ කරණ ශුද්ධිය (දහම් 9[3]).

කෙඝ=කෙඝය. -පාඝ= කෙඟය නමැති මල පුඹුව (ලපා 219[22]). -මඤ්ඤු= කෙස්රැවුල් (සර 168[12]).

කෙඝර= කෙඝර' බ. -සිංහ= කෙඝරසිංහයා (සර 33[19]). [(මිලි 415[37]).

කෙඝිඝ= 1. කෙඟ ඇති. 2. බුව සහිත; ලං

කෛ

කෛ (ද්‍ර)=අත. 'කකි' බ. **-කාප්පු** (<කෛක් කාප්පු-ද්‍ර)= අතෙහි පලඳින වළල්ල (රිදී). **-තාළම්** (<කෛත්තාළම්-ද්‍ර)= එනම් තූර්‍යවිශේෂය. **-තුරුනාඩි**= නාඩියක් (යෝ 4281). **-පුඩි†**= පෙට්ටිආදියෙහි අල්ලා ගන්නා කොක්ක. **-පෝච්චු** (<කෛප් පොට්ටු-ද්‍ර)=ආභරණයක් (ස්තූ 31[24]. දජා 263[21]. සද්ධ 91[23]. දඹ 336. T. L. 1110). **-බන්දි**= අත්වළල්ල (සලී 1. 89[836]). **-මුදියන්**=වස්තුවිශේෂයක්(දඹ 3[21]). **-වඩම්**= ආභරණයක් (සතූ 31[25]. සද්ධ 91[20]. දඹ 3[35]). **-වළල=අත්වළල්ල** (ස්තූ 31[24]). **-වාරු**='කකිවාරු' බ.

කෛත්තා?=කිකිරිදිය (වෛ).

කෛරව=හෙලුපුල් (සර 123[14]).

කෛරවික= කපටි; වඤ්චක (ජාස 541[21]). **-ඤාන**=1. කපටි නුවණ. 2. ඒ නුවණ ඇති (සර 80[16]).

කෛලාස,-ඤ්ජ (සර 29[6]), **-ගිරි, -පර්වත, -ශිඛරි** (බෝධෲ 28[25])=ශිව කුවේර දෙදෙනා ගේ වාසස්ථානය වූ හිමාලයෙහි උස්මුදුනක්.

කෛවරිය?=කපුගස (වෛව).

කෛවර්ත=කෙවුලා.

කෛවල්‍ය=1. කෙවලභාවය. 2. මොක්ෂය.

කො

කොං= 1. කවර (කව් 75. කාගෙ 1-17). 2. (< **කු**)=ක්ෂුද්‍ර; කුඩා. 3 (නි) (<**කිං**)=කොහි (සිදත් 170[2]). **-තෙක්**= කොතරම් (පූ 2. 6[19]). **-පමණ**=කවර තරම් (නිසර 27). **-දිවි** (සද්ධ 53[23]), **-දෙව්?** (බස 73[21] දහම් 212[30]. සලී 1. 13[17]. ගුත් 399)= කුඩා දිවැසින. **-වේ**= කුඩාවීමය (බළ 245[34]). **-°කන්**=කුඩාවීවියෙහි කොණ(කඩිඩා 137[17]. 119[32]).

කොංකුමරම්=කිණිහිරියඟස (වෛව).

කොක් (<කොක්කු-ද්‍ර)= එනම් පක්ෂියා (කව් 412. පඤ්චි 116[10]). **-නහ** (වෙස 362), **-°මුව** (පූ 2. 97[28]), **-නා**= වෘකයා. **-පන්**= කොකාගේ පිහාටු (ජාගැ 109[17]). **-සන්** (කාගෙ 11-32), **-හඬ**= 'කොක් කොක්' යන හඬ.

කොකා= කොක් නම් පක්ෂියා (හංස 135. රූ 246. පුනා 142). **-නද**= 1. රන්පියුම (රූ 161). 2. කුසරජුගේ වීණාව. **-වැල**= 1. කොක්පෙළ (තිසර 32. 108). 2. හසුන්ය ලඝ්‍යාරයක් (සද්ධ 42[8]. සවී 23[5]).

කොකාවි= රන්කිරිගොකටුගස (වෙස 588).

කොකාවිය=කෙකටිය. **-පක්**= කෙකටියගෙඩි හෝ සිඹියාට ක (හිඤ්චි-සිඹඩා) ගෙඩි(අභිධාස 1357).

කොකාකාලි=කෝමාරිකා (වෛව).

කොකැවි= 'කොකවි' බ. (කඩිඩා 111[11] හි 'කඩිකුණ' යන්නට 'කොකැවි' සි. වරදවා අර්ථ කියති. 'කඩිකුණ' යනු 'කක්කුටුබෙර' නම් මඩිති). [හබරල.

කොකිස්†= 1. කැවිලිජාතියක්. 2. (ඌව)†=

කොකු= 1. නැමුනු ලී ආදිය. 2. බිත්තියෙහි සවි කළ නාඟදන්තය (රූ 180. අභිධාස 114[27]). **-ළුළු†**=එක් පැත්තක කොකු සහිත පැතලිළුළු. **-පණ්ඩු†**=පාණ්ඩුරෝගයට හෙතු වන ක්ෂුද්‍රප්‍රාණීවිශේෂය. **-°රෝග†**= පාණ්ඩුරෝගය. **-සපු**= වැල්ජාතියක් (වන 79). [119. 586).

කොකුමුවවෙණ= කුසරජුගේ වීණාව (කව්

කොකුම්= කාශ්මීරදෙයෙහි වැවෙන කහ ගස් වැනි ගස්ජාතියක මල (කව් 40. 141). **-ලියකල**=කොකුම්ගස් සහිත පෙළෝතලය (කාගෙ 1-67)(කොකුම්ගස් මිස ලිය නැත).

කොක්කනම්= කුරපය්ය; මල්ල. (සිගල්ල? -රූජා 68[29]). **-පයි**=පසුම්බිය.

කොච්චර†=කොච්චර; කොතරම්.

කොච්චි†= 1. දකුණු ඉන්දියාවේ රටක්. 2. ඒ රටෙහි මිනිස්සු. 3. කුඩා මිරිස්ජාතියක්.

කොජ්ජ (<කොජව)= 'කොදු' බ (ධගැ 2275. සිබ 484).

කොජ්ජ(ජු)රුහල් (<කුඤ්ජරසාලා)= ඇතුන් විසින් උසුලාගෙණ සිටින සේ ඇත්රූ යොදූ කළ ශාලාව (ධගැ 236[25]).

කොසඹ=1. කොස්වංලිහිණියා (දහම් 14[34]). 2. අැතුන්ගේ නාදය. -නාද= කුසඹනාදය (වෙස 78. 614). [ජාස 109[23]).

කොසඹනාද= කුසඹනාදය (ශිසං II 105[11].

කොට්= 1. කොටුගුල (බගැ 237[5]). 2. (ප්‍රකෘ)= කොට; කර (ශිසං I. 116[9]. බගැ 224[18]).

කොට (බං)= 1. කෙටිමෙනි. 2. පහර දිමෙනි (රාජා 18[8]. 27[37]). 3. හැපිමෙනි; වම්මාරං කෑමෙනි (කඛ්ඛා 84[28]). යක. කොටං කොටත්; කෙටි කෙටූ.

කොට=1. කුණාඩ; නොදික්, මිටි (බගැ 87[18]). 2. මොට; නොකැපෙන. 3. කොණ්ඩය; කොටුව (බගැ 41[23]). 4. අත්පා කපනුලැබූ අය(ජාගැ 131[5]. ජාස 82[30]). 5. (<කොපු) හිවලා (රෑ 239). 6†= කාණ්ඩය; දඹුකඩ. 7†= කිතුල්ලී ඇදියෙන් කළ නළය. 8. (ප්‍රකෘ) (<කණ්ඩ)=කර (බගැ 8[3]). 9.(නි)= කල්හි. (=එතකොට, යනකොට-රාජා 5[32]. 68[33]). -කඹ= විණාව වගන උපකරණය හෝ කඹිප්පු ඇදිය (අභිධාස 21[21]). -ගුළු= (සලී 2. 127[15]), -ගේ (බගැ 237[6]. අමං 2. 58[1]. දහම් 334[13])= කොණ්ඩාගාරය; කොටුව. -දිඹුලා= එනම් ගස (සෙං 959). -නොගී (සඳ්ධ 16[18])= 'කටනොගී' ශුද්ධ. -රැකි= 1. බාහ්‍යාමාපකය; වී මනින්නා (ජාගැ-තිත්තිරජා). (ජා 776[2] සා). 2. කොටු ගුල රකින්නා? (ශිසං I. 88[17]). 3. වඩුවා? -°කම් ('කොටුරැකිකම්' ශුද්ධ?)= වඩුකම (සිබ 42[17]. කඛ්ඛා 59[31]. කොණ්ඩකම්මනානි නවජකකම්මං- සපා 538[8]). -°නා= කොට රැකියන්ගේ ප්‍රධානයා (ශිසං I. 88[17]). -වේ=නොදික් වීමය (බගැ 101[23]). -හළු†= 1. නොදික් සළුව; කන්‍යාවක වැඳිවිය පැමිණෙනවිට ඇඳ සිටි රෙද්ද-මෙය රජකයාට අයත් වේ. (ශිසං III. 307 අඩෙං). 2. (උඩරව)†= රජකයා. 3. කන්‍යාවක මල්වර වූ විට රජකයාට දෙන තෑගි.

කොටවි (වෙස 506)='කොකටි' ශුද්ධ?

කොටත් (සලී 2. 772[4])='කොතේ' ශුද්ධ?

කොටන= 1. උදල්ලෙන් පස් පෙරළන. 2. පහර දෙන.

කොටර= පසුපැත්තෙන් මිටි (ජාගැ-සුප්පාරකජා).

කොටරමුණු= ගස් කොටන ලිහිණියා; කොට්වෙරුවා (ජාගැ 170[2]). (කැරලා ජා 528[11]).

කොටමී=ගැවනිවුල්ගස (වන 52).

කොටවන†=විරුද්ධ කරවන; කලඟ කරවන.

කොටවය (ප්‍රකෘ)= කර (ශිසං III. 251[3]).

කොටවැලි= ඉඹම්වෙසෙසක් හෝ ඉඹම් ප්‍රමාණයක් (ශිසං II. 212[39]).

කොටස් (<කොඨාස)= භාගය; පංගුව (බගැ 4[4]). -අම=කොඨාසය යන අර්ථය (බගැ 49). -කාර†=භවුල්කාරයා.

කොටස=කොඨාසය (ශිසං I. 69[4]).

කොටසර=ලක්දිව නැගෙනහිර පිහිටි ජනපදයක් (බෝගැ 144[7]).

කොටළු=බූරුවා (ශිසං II. 159[12]. ධප්‍ර 110[18]).

කොටාර=කොණ්ඩාගාරය(බගැ 64[19]. පැර 73).

කොටෑ(ප්‍රකෘ)=කොට; පව්න්ගෙණ(බගැ 10[35]. ශිසං I. 129[10]). 2. (බගැ 265[6])='කම්' ශුද්ධ?

කොටැස්=කොටස (බගැ 47[25]. ජාගැ 56[25]. කවි 695). [කොටස (වි 4 325[2-25]).

කොටැසි= 1. කොටස්හිමි (බගැ 58[27]). 2.

කොටි= 1. කොටුව (බගැ 101[28]. 128[19]). 2†=එනම් වණඹ සඤ්ඤා. -කන්වටුල්=වටුල් වෙසෙසක්.

කොටිකා= කරුකොඟෙඹිය (සෙං 2507). -අරළු?=අරළුවෙසෙසක්? (සෙං 749).

කොටින් (ප්‍රකෘ) (<කණ්ඩාන)=කර(බගැ 121[35]. ජාගැ 56[25]).

කොටිලඹු?=ගැවපිච්ච? (සෙව).

කොටු= 1. වී නිබඳන අටුව (කඛ්ඛා 118[22]. සලී 1. 195[8]). 2. කාණ්ඩය; ලීය? (සලී 2. 928[2]. කෝටු-සලී 1. 986[21]). 3 පෙතැලි රුව (වි 2. 918[1-22]). 4. ද්‍රෝණාරුදියෙන් වට කළ තැන (බගැ 128[19]). 5. ද්‍රෝණිය; දිග වක්කරණ ඔරුව (ජාගැ 126[20]). 6. පඤ්ජරය; (කරත්ත) කූඩුව (ජාගැ 136[13]). 7. මසුන් මරන්නා?(රෑ 146). 8 (<කුණාඩ = මොට; මුවාන නැති (බගැ 85[19]). 9. (<කොටටක)= කොටන (ජාගැ 170[1]). 10. කළඟ (ජාගැ 71[15]) 11. (ප්‍රකෘ)= කොට (ශිසං I. 254[4,6]. 255[14]). -අතු= අතුරු පාර; අඩිපාර (Cla). -කර=මොට වූ දළිපිහිය (ධප්‍ර 329[34]). -කල (බගැ 276[21])='කොටුම්

කොව් කළ' ශුශ්‍රූ? -කෝච්ච= කොටුව; ආරක්ෂා සථානය (සුපූ 23³⁵). -ගුළු=කොෂ්ඨාගාරය (සර 8⁹⁹). -ගේ= කොෂ්ඨකය (චි 1.88²-²⁶). -තාප්ප†=බලකොටුවක් අවට බැඳි ප්‍රාකාරය. -පත්=1. කොටුව (ජා 44²⁶ සඩ්ඩ 408²). 2. අතුරුපාර (Ja). -පවුරු=කොටතාප්පය -පේතෘ†= බලකොටුව. -වෙල්†='කොට්ටකොඩ්ඩ' බ. [224¹⁸].

කොටුම් (<කොට්ටිම)= 'කෘත්‍රිම' බ (බහැ

කොට්ට= ඉස නැඹිමට හෝ හිඳගැණීමට පුළුන් ආදිය පුරවා සෑදූ දෙය (මනි 62³. රැ 307). -උර†=කොට්ටයෙහි නුඹු නොඟෑ වීමට දමන වැස්ම. -කාඩු†=වැවකින් දිය ලබන නුඹුරුවල තුන්වැනි (අනතිම) කොටස; අස්වැද්දුම (ශිසං II. 117 අබෙ 1). [220²⁵].

කොට්ටන= කෙටිම; විඅංදිය පැහැරීම (සර

කොට්ටම්= 'සෙංකොට්ටම්' නම් ද්‍රව්‍යය (රා 227. ඔෂ 410. 645).

කොට්ටම්බා=එනම් ගස.

කොට්ටල්බදු=නවාම් දන්නා අය හෝ ඔවුන් සම්බන්ධ ක්‍රියාකාරිමණ්ඩලය (සපැ 125¹².G).

කොට්ටාස=කොටස (ඔෂ 2834).

කොට්ටුකසිර=ලේ සහ වංකය ද නිසා දණ මඬල ඉදිමෙන රෝගයක් (ඔෂ 2777).

කොට්ටුන්න (සබරගමු)†=1. ඕවිට. 2. (කළු තර)†=කුඹුරකින් ගොඩබිම්අතරට නෙරා ගිය කොටස (G).

කොට්ටෝරු†=1. ගස්වලට කොටන පඤ්චෙක්. 2 දෙවපුජාවට අහාර පිසන්නා.

කොඨාස=කොටස (පූ 2. 59¹⁵).

කොඩ=1. ථෝරං (පූනං 139). 2. (<තුඩ)= බිත්තිය. 3. කොඩගය (විමු 48⁵) -වරණ්=ප්‍රාකාරනිතසිය (ජාගැ 20¹³).

කොඩහරරට=පෙර පැවති ජනපදයක් (බෝගැ 144⁷). ['ගත්කඩ්' බ.

කොඩැබඳ්=අමුණුබැම්ම (ශිසං I. 167B¹).

කොඩි=ධවජය (රැ 360). -කුඩ, -ගස්= කොඩිය බැඳි ගස. -තුවක්කු=කණු තුණක් සහිත අභ්‍යන්තර සවි කරණ තුවක්කුව (රාජා 68⁵). -වසම්=කොඩිතුවක්කු හැර වෙනත් සියලු ආයුධ (විසතර- A. R. K. 111). -වැල්= පුපුලවැල (වන67). -විත†=මන්ත්‍රබලයෙන් කරණ හුනියම.

කොඩ්ඩක්කු(ද්‍ර)='ඔඩොක්කු' බ. (ජා 1144⁴).

කොඩ්ඩු=තුණඩලය (ශිසං III. 222³⁷).

කොඩ්ඩවාකෝලි†=රිජ්ජ බැඳීම සඳහා පරල අතර දමන රිවි හෝ වේවැල්.

කොඩොක්කු='කොඩ්ඩක්කු' බ. (ජාගැ 78¹⁵).

කොණ='ගෙමුල්ල' (රැ 180). 2. 'කොන්' බ.

කොණඩ=ගුළි කොට බැඳි කෙශය(සඩ්ඩ 333⁴). -කෑවුම්†=මැද උස් වූ කැවුම. -කුරුලු= කුරුල්ලෙක්. -මල්(සඩ්ඩ 186²¹), -මාල (ස්තූ 96²⁴. චූප 80¹⁸)=කොණඩයෙහි පළඳින මල්දම.

කොඬි=1.බංහුව(සිබ79¹⁶).2.(<බඤ්ඤ)=උරහිස (රැ 541). 3. ගෙඹිය. 4. කොණඩය (සර 200³²). 5. කුඩා කුහුඹු ජාතියක්. -මල්= කොණඩමාල. (සඩ්ඩ 212¹⁶. 498²⁸).

කොඩිල=ඇගෙහි හැදෙන ඉන්නත් වැනි වම කිල (කඩිබ 21³). [43³². 61¹⁸. 69²²].

කොඩිවර(<තුඩවායකාර)=බිත්තිය (සිබ

කොඬිස්=උරහිස(රැ 282).

කොඹුල්=තුණඩලය (බහ 263¹⁹).

කොඹොල්=1. තුණඩලාභරණය (පැර 126. හංස 59). 2. නාභ (රැ 130). 3†=අල ජාතියක්. 4†=අලවැල් ජාතියක අතුවල හටගන්නා ගෙඩි. -ඉඳු=අනන්තකාගරාජයා (ශුසිංඅ).

කොන්=1. කොඩිය (රැ 590). 2. වෛත්‍ය මණ්ඩපයෙහි හෝ ගෘහමණ්ඩපයෙහි තබනු ලබන ගෘඛ්‍යය (සිසං I. 31¹. 43¹² අෑ. කඩිබ 114⁴). 3. කුන්තාග්‍රායුධය (කවි 675). කුඛංකඩුව (පූනං 280). 5. අනඝඛවජය (පූනං 280). -කැරලි=1. වෛත්‍යමණ්ඩපයෙහි ක්‍රමයෙන් සිහින්ව ගිය, කොත තබන කොටස. 2. කොත (ජාගැ 152²⁴). -බිබිල=කොත තබන කණුලය (සලී1.82²². වැණිකබල්-බහැ 236²⁷). -මහල්=කොත පැලඳවීමේ උත්සවය (පූ 2. 696²¹). -මල් සිදී= කෙතුමාලාශොභාව (කාගෙ 1-103). -විලක්කුපාන්†= කොතක් වැනි උස් වූ පිත්තලපාන (සපැ 195¹⁴).

කොතබ්බ(පූනං13), -ගල්(කාගෙ 1-10)= සොසතුහමාණික්‍යය.

කොතමිණි? (කත්මිණි?)= වඤ්ඣකාන්තසුගන්ධි කාන්තපාෂාණ (දජා57^{12}. මනි82^{22}).

කොතඹු, -ගල්(රෑ 25), **-මිණි**(කෝ182)= 'කොතඹු' බ.

කොතඹුරු=1. කොන්තමල්ලි (ශෙ 319. 1271). 2. රත්නෙළුම් (ශුසිංඅ).

කොතල්=කුන්තලදෙශය (කාශෙ 10-111).

කොතල 1.කෙණ්ඩිය; දිය වක්කරණ මැටිමුවා භාජනයක් (කඩ්ඛා 114^{7}. ජා 1033^{21}. සඩ්ග 498^{37}). 2. (<කුතල)= කෙශය (රෑ 293).

කොතලා-කොතලය; කලස (ජාගෑ 105^{15}. සිබ 41^{20}). **-කෙණ්ඩි-කොතලයෙහි දිය වැගිරෙණ නළය** (ශෙ 618). **-කෙම්බවැල්**= වැල්ජාතියක් (ශෙ 2378).

කොතවි=කුන්තාශුධ්‍ය.

කොතිසුද=කදකුමරා (පුනා 17).

කොතු=සිනාව (පුනා 69).

කොතුඩ්=කණ්ණමුදුන්හි සවි කරණ කළයක් වැනි අවයවය (ශිසං I. 219^{19}). **-වැම්බ්**= කොතුරු සහිත කණ්ණුව (ශිසං I. 219^{19}).

කොතුරු=1. කෙණ්ඩිය; කලස (ශිසං III 154^{3}. අමං2. 14^{20}). 2. 'කොතුර්' බ. (සඩ්ග 742^{5}. තිසර 163). 3. මල්කෙම්ය? (සර 10^{29}) **-භාණ්ඩ**= මඟබෙහිමඬුලයෙහි දී රන් කෙණ්ඩියෙන් පිරින්පැන් මහාබෙහියට ඉසින ප්‍රධානය (බෝගෑ 143^{27}. බෝව 220^{26}. පූ 2. 721^{15}). **-පන්**='කොතුර්' බ. (ජාගෑ 26^{21}. කුදු 244. 264). **-පේකඩ**= කොතරු හා පේකඩ (ජා 99^{26}). **-බැද්ද**= ඔසු වෙසෙසක් (ශෙ 405. 3803).

කොත්තම්†=කොට කබාය(Ca). [(ශෙ1024).

කොත්තමල්ලි = එනම් බෙහෙත් ද්‍රව්‍යය

කොත්තා=වැල්පෙනෙල (ශෙවෙ). [86^{37}).

කොදඬ්=පෙර පැවති දඬ මුදලක් (ශිසං 1.

කොදු(<කොඳු)=සතරඟුලෙන් දික් ලොම් අැති එළොම්මුවා අැතිරිල්ල; කොදුපලස (බප්‍ර 320^{15}. සිබ 33^{2}) [මුල්ල (රෑ 180).

කොන්=1. කෙළවර (කඩ්ඛා 124^{30}). 2. ගෙ

කොනහ(බා)†=කෙනහිමෙහි. සක. කොනහා කොනහත්; කෙනහි කෙනහු.

කොනුත්ත(බා)† = කෙනහිමෙහි. සක. කොනුත්තා කොනුත්තත්; කෙනෙත්නි කෙනෙත්නු.

කොනුස්ස(බා)†=සකෙනස්සිමෙහි. 'කොනුත්ත' මෙනි.

කොනෙන=1. කුන්නාශුධ්‍ය (සඩ්ග 56^{4}. 579. 466^{29} අෑ. ඔනි 351^{7}). 2†=ජපමංලාව (Ca). 3†=ශ්වේතාකුරු පාව (Ca). **-බාල**=කුන්නාශුධ්‍ය ගත් සෙබළා (දඹ 5^{3}). **-වැර**=පාලු; පුරන්; වල් (සපෑ 141^{17}). **-සරඹ**=කුන්නාශුධ්‍යයෙන් ශුද්ධ කිරීම (සඩ්ග 519^{2}).

කොන්ත්‍රාත් (<Contract)† = සම්ඛ්‍යසිවන් කිරීම සඳහා කරණ ගිවිසුම. **-කාර**†=ගිවිසුමක් පිට වැඩක් කරන්නා.

කොන්ද=කොඳ (සි 249). [රෙංන්දුව.

කොන්දේසි(<Condition)† = නියමය; පෙ.

කොන්සේල්(ඩු)=උපාවිය (සියඛ 224).

කොඳ=ගවය පිපෙන මල් ජාතියක් (කඩ්ඛා 541^{2}). **-සෑවු**=අනඩ්ගයා (රෑ 765). **-සිය**= වඤ්ඣා.

කොඳු=1. නෙන්ද; රාජිය (පූ 2 279^{3}. ජාගෑ 89^{22}). 2. කෙශර; මල්රෙංන් (සිබ 54^{10}). 3. නුඛාකණ්ණුව (ජාගෑ 124^{1}). 4.'කොදු' බ. (බගෑ 65^{14}). 5. කටිය; පිපිකොන්ද (මිලි358^{25}). 6. ඛන්ධියෙහි නෙරවා තනන ලිස්තරය. **-ඇට**†=පිපිකොන්දෙහි අෑවය. **-පන්**=ලිස්තරය (සුපූ 26^{12}). **-පලස්**=එළ ලොම්මුවා පලස (කඩ්ඛා 45^{2}. කාශෙ 1-93).

කොදුර(බා)=කෙදිරිමෙහි- 1. හෙමින් කිමෙහි (සලී 1. 194^{30}). 2. දුක්මුසු සිහින් හඬන් කිරිමෙහි. (ජාගෑ 156^{5}). අක. කොදුරා කොදුරන්; කෙදිරි කෙදිරූ.

කොදුරුහල්='කොපුරුහල්' බ. (බගෑ236^{25}).

කොපල=එලපුශොජනී?(ශිසං 1. 203 C^{23}).

කොපා(ප්‍රකෘ)=කොපය කොට (ශිසං IV. 71^{5}).

කොපි(<Copy)†= 1. පිටපත. 2. පුරුදුවීමට වාක්‍යාදිය ලියන පොත.

කොපිල්†=නොමේරූ (අත්ත.); ගොබය.

කොපු=1. කඩු ආදිය දමන කොශය (බගෑ 167^{18}. ජාගෑ 149^{2}). 2.කුපය; ලිද (රෑ 153. පුනා 88).

කොපුල්=කපොලය; කම්මුල (කාශෙ 4-7). **-අත්**(පරෙවි 4), **-කර**(සෑවු48)=මෙහෙසුරා. **-බින්**= කපොලහිතතිය (කවි163). [සුරා.

කොපුලන්=1. කපොලය(කවි 397). 2. මෙහෙ

කොපොල්=කපොලය (කව් 381. සිය 151). -පත්=1.අලඞ්කාරය සඳහා කම්මුලෙහි ඇදි පත (කව් 519), 2. කපොලය තබාගැනි පත්‍රය (කාගෙ 2.3-44). [1447].2†=මුහුදු මාලුවෙක්.

කොප්පර=1. ඛනිජ විශෙෂයක්? (බෝගැ

කොප්පරා†=විශල් පොල්මද.

කොබා(ධා) =කැලඹීමෙනි. සක. කොබා කොබත්; කෙබී කෙබූ (කොබණ-සිදත් 1583)

කොබ=ක්ෂොභය; කැලඹීම.

කොබලිති=පක්ෂියෙක් (සර 13434).

කොබලිල(පූ 2. 11717. පුනා 118), කොබළල (ධගැ 9022. කාගෙ 4-21), කොබලිල (කාගෙ 1-67)=කොවිදර නම් පුෂ්පවෘක්ෂය.

කොබෑ(<කිබ- නි)=කොහි (සිදත් 1526).

කොබ්බුන?=කෝන්ගස (වෙව).

කොබෙබසි†,කොබොබෝ(බොව 4512)='කපොත' නම් පක්ෂියා. [2453].

කොබොබොවක්කා=ඔසුවෙසෙසක් (මයා 370.

කොබෝබ්=1. කොබෙබ්ය (ධගැ 188 අබෙ). 2. පරෙවියා (ධස 6223. සඬ 16034). 3.ඔස වෙසෙසක් (යොා 1818). -ගෙඬි(මනි8815), -°වළලු(සැළ 68)=1. විවඞ්ගය; ගෙහි ඉතා උස් මුදුන හෝ පරෙවියන්ට ලඟින්ට සෑදූ තැන. -නාසි†=පියාසර කරතැ හි සලකන නාගවිශෙෂයක් (සාමාන්‍ය නාගයන් ම වශයෙන් ගිය විට පුරුන් හැලී පිහාටු ඇති වීමෙන් පියාඹනැති සැලකේ). -මැල්ල=ඔසු වෙසෙසක් (යොා 3629).

කොබෝබ්ලිල=‘කොබලිල’ බ. (සඬ 5327).

කොබ්බබු=ඔසු වෙසෙසක්(යොා 1017.2611).

කොමඹු(ඹු)=එනම් පුහුල්වෙසෙස(පූ 2. 9711).

කොමන්ද†=ඔඹුදව; කණ්ඩායම.

කොමර=කුමරා (ශිසං II. 26747).

කොමල=1. සිත්කලු (රැ 423). 2. මොළොක් (කව්118). 3 රත්නය(රැ 595). 4†=සුරතල්; ප්‍රෙමප්‍රකාශකක්‍රියා. -වම=කැවිලිජාතියක්.

කොමලි=1. කොමලවට (ගණ 26).

කොමලි=1. කෝණංගියා; විභීෂණාරයා(සලි1. 73247. රසඟැ). 2. සියුමැලි කාන්තාව (සිදත් 551). [නියොජිතයා; ප්‍රධානයා.

කොමසාරිස්† (Commissioner) = (අංණ්ඩුවේ)

කොමල=‘කොමල’ බ. (සිය 175).

කොමා†(<Comma)=‘,’ යන ලකුණ.

කොමාරි=කෝණංගියා (සලි 1. 105137. සඬ 31137).

කොමිස්(<Commision)=1. වටිටම; තැරැව් කුලිය. 2. බඩුවක් විකුණනවිට එහි වීලෙන් අඩු කරණ ගණන.

කොමිසන්සභා†=නියොජිතමණ්ඩලය; කරුණක් පරීක්ෂා කර වාතීා කරණු සඳහා පත් කළ සභාව.

කොඹු=1. ‘කුම්භාස’ බ. ගවයෙන් කළ අංහාරයක් (සිබ 4916. මිලි 3225). 2. කබලු පූ ඇතුළට දමන පැණිපොල් (ධගැ 11320). 3. (<බොම)=කෙඳි සහිත ගසක් (Jute?) (කඬබා 4412). 4. එම කෙඳිවලින් විසූ රෙදි (ධගැ 12223). 5 බෙරි; අඩක් තැම්බුනු (පූ 2. 38821. ජා 18227. ස්තූ 665). 6. දෙශ ගස්. -පිඬු=ගවසංලින් කළ අංහාරයක් (ජාගැ 22917). -පිළි=කොමුකෙඳිතුලින් විසූ වස්ත්‍රය (වි 1. 3891-12). -මුවා=අඩංම මය; කොමුතුලින් කළ (සිබ 3232). -රට පිළි='කොමු' නම් රටෙහි විසූ වස්ත්‍රය (වෙස 618). -වන්=කොමුපිළිය (රැ 301). -සිවුරු=කොමුනූලින් විසූ සිවුර (කඬබා 4412). ['කොමඹු' බ.

කොමුඹු(කඬබා 8824), -පුසුල්(ජාගැ 799)=

කොමුල්=දෙමට (වත 26).

කොමුල්=කොමල (සි 103. 200. 532).

කොමොඹු=කොමුඹු (ධගැ 100110. සිබ 5424).

කොම්පැනි(<Company)=සමාගම; ගණය.

කොම්බු=1. ‘එ’ යන්න සඳහා ව්‍යඤ්ජනාක්ෂර යන්ට මුලින් යෙදෙන ‘ෙ’ යන ලකුණ (පඤ්චි 869). 2. පුරාණසාහිත්‍යවෙහි එක (1) සඳහා යෙදුන ලකුණ. 3. කොම්බුව වැනි නළාජාතියක්(දඹ5225. චූප 41111). 4. ලපැවි; කුඹා (සලි 2. 515117). [55016].

කොඹු=ලපැවි; කුඹා (සලි 1. 55521. පූ 2.

කොසි=1.කිනම්; කවර(ජා 46525. සඬ 3425). 2. (නාප)=කොහි (සඟ 16111). -ඉ(නි)=කොතැන්හි (සලි 1. 3499). -ගම්=කිනම්; කවර (කති 292).

කොර=1. කොට හූ හෝ පණ නැති වූ අත්පා (ජාගැ 85119). 2. එබදු අත්පා ඇති

(ධඟ 115[18]). 3 මිටි; කොදිත් (චූප 23[2]. සඟ 359). 4†=පහරය. -ඤ්ඤා, -ඤ්ඤ†=කුඩා ගස්ජාතියක්. -ගමන්=පයක් අද්දමින් යෑම (ජාස 77[20]). -තල්පත්=මිටිතල්ගස්ගේ කොළ? (සෝ 2289). -පොතු†=1.මංලුන්ගේ ඇඟෙහි තිබෙන පොතු. 2. මිනිසුන්ගේ ශරීරයෙහි ඉරි වැටීමෙන් ඇති වන ලකුණු. -පොල්-පොර සඳහා යෙදෙන පොල්ගෙඩි. -°ඛෙළි=පොරපෑල් ගැසීමේ සෙල්ලම. -පෘ=නිසි පමණට දික් නුවූ නොහොත් පණ නැති පෘදය (බස 16[10]) -මසිල්='බුජ්ජමංතුල' නම් තැන (බෝඟ 134[12]). -ඤ්ඤි†=සන්නිශ්කාගේ අවතාරයක්. -ඤ්ඤ=කොරවූ අත (බප්‍ර 311[8]).

කොරවු=1. (<ක්‍රෞඤ්ච)=කිවිලිං (රූ 239). 2†. කොටුව; වැටකින් වට කළ තැන.

කොරඩාඛන්= දියගතිය සහිත කිරිබත් (සලී 1. 99[711,15]).(කිලින්නපරාසස=බොල්- ඝනකිරිපිඬු-බඟ 285[12]).

කොරඹු=හැකිළීම; සංක්ෂේපය (පූනා 59).

කොරනෙල්†(<Coroner)=ගදිසි මරණ ගැන තොරතුරු පරීක්ෂා කරණ මූලාදැනියා.

කොරමරු=පෙනේරය (ජාඟ 70[26]. 156[5]. 196[19]. අමරකෝෂ 876).

කොරඹුරු†=මුහුදු මාලුවෙක්.

කොරල්(<Coral)†=පබළු.

කොරහන්†=ගල්සහිත තැන(Ca).

කොරල (ල)}=මත්ස්‍යයෙක්(බුත් 5[3]. සද්ධ 41[2] කොරලි (ළි)} 631[32]).

කොරවක්=කෙරවකා (කාශෙ 1.4-2.ජා 378[16]) -ගල්=පියඟැවපෙළවල් දෙපස සවි කළ කැටයම් සහිත ගල.

කොරස්=කව ලොකු මහාභාජනවිශෙෂයක්.

කොරශ=කකීඝ(ශෙෝ 1945). [240. සෝ 227).

කොරසැවි(ඬි)=රූක්ෂ; රළු (ජාඟ 86[7]. කෙරි

කොරසැඹිගාගස්=ගස්වෙසෙසක්.

කොරසැඹි†=කොරසැඹි.

කොරහ†(නාප)=‘කොරස්’ බ.

